

# නාම රූප සමාසය

## පෞරාණික සිලිපිටපත සන්නය.

# NAMARUPASAMASA.

BY

A RESPECTABLE ANCIENT PANDIT

WITH

AN ANCIENT PARAPHRASE CALLED

# SILIPITAPATHA

REVISED BY

VERY REVD. B. DHAMMAPALA B. P.

of

Subhadrarama Vihâra Batapola.

---

# නාමරූපසමාසය.

පූරාතන ප්‍රශස්තතර පඬිතුමකු විසින් විරචිතයි.

# සිලිපිටපාඨ

නමින් ප්‍රකටවූ පෞරාණික සන්නයෙන්ද යුක්තයි.

බටපොලේ

සුභද්‍රාරාම විහාරවාසී

උතුම් ධම්මපාල ස්වාමින්වහන්සේ විසින්

සංශෝධිතයි

---

THE VIDYAPRAKASA PRINTING PRESS.

AMBALANGODA.

1908.

# නාමරූපසමාසය.

පුරාතන ප්‍රශස්තතර පඬිතුමකු විසින් විරචිතයි.

## සිලිපිටපත

නමින් ප්‍රකටවූ පෞරාණික සන්නයෙන්ද යුක්තයි.


දෙඩන්දූවේ

ශෛලබිම්බාරාමාධිපති

ශෞරවාහි ආචාය්‍යී.

සිරි සීලක්ඛන්ධාභිධාන මහාස්ථරපාදයන් මහත්සේගේ

ශිෂ්‍ය වූ

බටපොලේ

සුභද්‍රාරාම විහාරවාසී

උගන් ධම්මපාල සාමීන්වහන්සේ විසින්

සංශෝධිතයි


—:—


ඇත්කඳුරේ

ඇම්. ඩබ්ලියු සුමතිපාල විසින්

මුද්‍රණයකරවා ප්‍රකාශකරණලදී.

අම්බලම්ගොඩ

විද්‍යාප්‍රකාශ යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

1908.

# සංඥාපනය.

—— ० ——

"නාමරූපසමාසය" නම්වූ මේ කුඩාපොත අභිධර්මය ඉගෙණගන්නන්ගේ සුඛාවබෝධය සඳහා සංක්ෂෙපකොට පාලිභාෂා වෙන් කරණලද්දකි. මෙ පිණිසම කරණලද "අභිධර්මාවතාර" 'අභිධර්මාර්ථසංග්‍රහ" ආදි තවත් වැදගත් පොත් කීපයක් ඇතත් ඒ සියල්ලටමවඩා, මේපොත කුඩාබැවින්ද සංක්ෂෙපක්‍රමයකින් හකුළුවා ගළපා තිබෙනබැවින්ද ඉගෙණගන්නන්ට පාඩම්කොට සිතේතබාගැණීමට පහසුවේ. මෙයින් නාමරූපයන්ගේ ස්වරූප දැනගත් පසු අභිධර්ම පිටකයේ මුල්පොතවන ධම්මසඞ්ගණීප්‍රකරණය ඉගෙණීමට පහසුවේ, එය ඉගණගත්පසු පිළිවෙළින් විභඞ්ග— ධාතුකථා— යමක— පුග්ගලපඤ්ඤත්ති-- කථාවත්‍ථු--පට්ඨාන යන අනිත් පොත් සයද පහසුවෙන් ඉගණගතහැකිවෙයි, එබැවින් මේ පොත අභිධර්ම නැමති සාගරය එතරකිරීමට ඉක්මන් ගමන්ඇති කුඩානැවක් හා සමානයයි කියහැකිවේ.

මේ පොතේ කර්තෘ අසවලායයි නිශ්චයකිරීමට ප්‍රමාණවූ ඉතිහාසගත වාර්තාආදියක් අපට මේතාක් දැනගන්ට නොලැබුණේය, අභිධර්මාර්ථසඞ්ග්‍රහ- නාමරූප පරිච්ඡෙද- පරමාර්ථවිනිශ්චය යන පොත් තුනේ කර්තෘවූ ගෞරවාහී අනුරුද්ධ මහාස්ථවිර පාදයෝම මෙහිද කර්තෘවූහයි ඇතම් කෙණෙක් අනුමානයෙන් සලකත්, එසේනම් උන්වහන්සේ විසින් පළමු කී පොත්තුන ඉගණීමට පහසුකරණපිණිස සංක්ෂෙපකොට මෙය කරණලද්දේයයි සිතිය යුතුවේ, එසේනොව අන්‍ය ආචාර්‍ය්‍යකෙණෙකුන් විසින් වුවත් උන්වහන්සේ හා සමකාලීනවූ හෝ ඊටද පුරාතනවූ හෝ අභිධර්මය මනාසේ දැනගත් මහතෙරකෙණෙකුන් විසින්ම මේ පොත කරණලදබැව් සිතීමට මෙහි වාක්‍යරචනාදියෙහි ඇති ලාලිත්‍යයම ප්‍රමාණවේ.

මේ සමග යොදනලද මේ සිංහලසන්නයද පෞරාණික ප්‍රශස්තතර පඬිතුමකුවිසින් වෙනත් පොත්වලින් උදාහරණාදිය සඞ්ග්‍රහකොට ඉගණ ගන්නන්ගේ පහසුවපිණිස ඒ ඒ තැන්හී විස්තරද දක්වමින් මනාලෙස කරතිබේ. එසේද වුවත් වෙන සන්න පොත්වලමෙන් සියලු පදවලටම නොව ඒ ඒ තැන ගැඹුරු අර්ථඇති පදවලට පමණක් මෙහි අර්ථ දියාතිබේ. "සිලිපිටපත" නමින් ප්‍රකටවූ මේ සන්නය සමහර පුස්තකාලයන්හි පිතාවශයෙන් තිබෙන නමුත් මෙහි මුල්පොත එසේ සුලභනොවිය, ඊට හෙතුව සන්නයේ ඒ ඒ තැන විස්තරපිණිස අන්‍යපොත්වලින් උපුටා බහාලනලද ගාථාව එහි මුල්පොතයයි හැඟී මත් මීට වෙනම් මුල්පොතක් ඇතිබව බොහෝතෙක් කිසිවෙකු කල්පනා නොකිරීමයි හැගේ, අපටද පළමුවෙන් ලැබුනේ මේ සන්නය පමණයි, මෙය ඉගණගන්නන්ට ප්‍රයොජනවත් බැව් හැඟී ශුද්ධකොට සකස් කිරීමට බටපොලේ

# PREFACE.

This little book entitled "Nāma Rūpa Samāsa" is a concise treatise written in Pāli with a view to facilitate the study of *Abhidhamma*. It is superior to the other books which treat on the same subject such as "*Abhidharmávatára*", *Abhidharmártha-Sangraha*" &c as its conciseness helps the student to easily learn and keep in mind the teachings. A study of this book will help the student to understand the first book of Abhidhamma Pitaka viz. "Dharmasangani Prakarana" and thereafter gradually, the other six books "*Vibhanga*", "*Yamaka*", "*Dhátu kathà*", "*Puggalapaññatti*", "*Kathávatthu*" and "*Patthàna*" Hence this book can be likened unto a fast travelling small ship by which the Ocean of Abhidhamma can be crossed.

We have not been able to find sufficient historical proof to definitely state who the author of this book is. The Venerable Anuruddha Maha Sthavira, the author of "*Abhidharmàrtha Sangraha*", "*Nàma Rùpa Pariccheda*" *and* "*Paramàrtha Vinischaya*" is supposed by some to be the author of this book also. If so, he must have edited this book to facilitate the study of the last mentioned three books. However that may be the excellent style of the language of this book is a sufficient proof to come to a conclusion that the author was a contemporary of the said Anuruddha Mahā Sthavira or another Mahā Sthavira who had a good knowledge of Abhidhamma and who lived even prior to him.

The Sinhalese Translation attached to the book has been well done by an ancient scholar of renown, quoting examples from other works and giving full descriptions in some instances as a help to the student. Unlike other Translations only the difficult words have been explained. This translation entitled "Silipitapata" though rarely found in some libraries, the original book is difficult to be procured.

At first we also had only this translation. In the course of our revision of the book with a view to publish it for the benefit of the student, we found certain reasons for the existence of an original book. Inquiries were then made for it here, also in Siam and Burma, but without success. On subsequent inquiry the original was found in the library of "*Ambarukkhārāma*" Welitara and a copy of it was given us by the Very Revd: Buddhasiritissa Sthavira. Though that book is teeming with discrepancies we must mention in grateful recognition that it was of great assistance to us in our present revision.

It is a difficult task to revise a book with such errors in one edition. But by reference to "*Dharmasangani Prakarana*" and its commentary and with the help rendered us by our respected tutor the Very Revd: C. A. Seelakkhandha Thero of Sailabimbarama Dodanduwa we have been able to revise this book to this extent. Though there appears an incompleteness of the book at the end we have been able to find only this much in all the copies procured by us.

We trust that our revision of this book will prove to be of use to our countrymen.

*B. Dhammapāla*

Subhadrārāma, Batapole
1st January 1908

# සංඥාපනය.

—— o ——

"**නාමරූපසමාසය**" නම්වූ මේ කුඩාපොත අභිධර්‍මය ඉගෙණගන්නන්ගේ සුඛාවබොධය සඳහා සංක්‍ෂෙපකොට පාලිභාෂා වන් කරණලද්දකි. මෙපිණිසම කරණලද "**අභිධර්‍මාවතාර**" 'අභිධර්‍මාර්‍ථසංග්‍රහ"ආදි තවත් වැදගත් පොත් කීපයක් ඇතත් ඒ සියල්ලටමවඩා, මේපොත කුඩාබැවින්ද සංක්‍ෂෙපක්‍රමයකින් හකුළුවා ගලපා තිබෙනබැවින්ද ඉගෙණගන්නන්ට පාඩම්කොට සිත්තබාගැණීමට පහසුවේ. මෙයින් නාමරූපයන්ගේ ස්වරූප දැනගත් පසු අභිධර්‍ම පිටකයේ මුල්පොතවන ධම්මසඞ්ගණීප්‍රකරණය ඉගෙණීමට පහසුවේ, එය ඉගණගත්පසු පිළිවෙළින් විභඞ්ග— ධාතුකථා— යමක— පුග්ගලපඤ්ඤත්ති-- කථාවත්‍ථු--පට්ඨාන යන අනිත් පොත් සයද පහසුවෙන් ඉගණගතහැකිවෙසි, එබැවින් මේ පොත අභිධර්‍ම නැමති සාගරය එතරකිරීමට ඉක්මන් ගමන්ඇති කුඩානැවක් හා සමානයයි කියහැකිවේ.

මේ පොතේ කර්‍තෘ අසවලායයි නිශ්චයකිරීමට ප්‍රමාණවූ ඉතිහාසගත වාර්‍තාආදියක් අපට මේතාක් දැනගන්ට නොලැබුණේය, අභිධර්‍මාර්‍ථසඞ්ග්‍රහ- නාමරූප පරිච්ඡෙද- පරමාර්‍ථවිනිශ්චය යන පොත් තුනේ කර්‍තෘවූ ගෞරවාර්හ **අනුරුද්ධ** මහාස්ථවිර පාදයෝම මෙහිද කර්‍තෘවූහයි ඇතම් කෙණෙක් අනුමානයෙන් සලකති, එසේනම් උන්වහන්සේ විසින් පළමු කී පොත්තුන ඉගණීමට පහසුකරණපිණිස සංක්‍ෂෙපකොට මෙය කරණලද්දේයයි සිතිය යුතුවේ, එසේනොව අන්‍ය ආචාර්‍ය්‍යකෙණෙකුන් විසින් වුවත් උන්වහන්සේ හා සමකාලීනවූ හෝ ඊටද පුරාතනවූ හෝ අභිධර්‍මය මනාසේ දැනගත් මහතෙරකෙණෙකුන් විසින්ම මේ පොත කරණලදබැව් සිතීමට මෙහි වාක්‍යරචනාදියෙහි ඇති ලාලිත්‍යයම ප්‍රමාණවේ.

මේ සමග යොදනලද මේ සිංහලසන්නයද පෞරාණික ප්‍රශස්තතර පණ්ඩිතුමකුවිසින් වෙනත් පොත්වලින් උදාහරණාදිය සඞ්ග්‍රහකොට ඉගණ ගන්නන්ගේ පහසුවපිණිස ඒ ඒ තැන්හී විස්තරද දක්වමින් මනාලෙස කරතිබේ. එසේද වුවත් වෙන සන්නපොත්වලමෙන් සියලු පදවලටම නොව ඒ ඒ තැන ගැඹුරු අර්‍ථඇති පදවලට පමණක් මෙහි අර්‍ථකියාතිබේ, "සිලිපිටපත" නමින් ප්‍රකටවූ මේ සන්නය සමහර පුස්තකාලයන්හි පිතවශයෙන් තිබෙන නමුත් මෙහි මුල්පොත එසේ සුලභනොවිය, ඊට හෙතුව සන්නයේ ඒ ඒ තැන විස්තරපිණිස අන්‍යපොත්වලින් උපුටා බහාලනලද ගාථාම එහි මුල්පොතයයි හැඟී මන් මීට වෙනම් මුල්පොතක් ඇතිබව මෙවනතෙක් කිසිවෙකු කල්පනා නොකිරීමයි හැගේ, අපටද පළමුවෙන් ලැබුනේ මේ සන්නය පමණයි, මෙය ඉගණගන්නන්ට ප්‍රයොජනවත් බැව් හැඟී ශුද්ධකොට සකස් කිරීමට බටපොලේ

සුභද්‍රාරාමාධිපති අප ආචාර්‍ය ගෞරවාර්හ කල්‍යාණතිස්ස ස්ථවිරයන්වහන්සේ විසින් අප මෙහෙයනලදුව පොත ශුද්ධකිරීමට පටන් ගත්විට මීට වෙනම මුල්පොතක් ඇතිබවට කරුණු පෙණීගියේය. ඉත්පසු ඒ පිළිබඳව සියම් බුරුම ලඞ්කා යන රටවලින් ස්ථාන කීපයකම සෙවුනමුත් එබඳු පොතක් ඇත්බවක්වත් දැනගන්ට නොලැබීය, නැවත නැවතත් පොත සොයන විට වැලිතර අම්බරුක්ඛාරාමයේ පුස්තකාලයේ තිබී ගෞරවාර්හ බුද්ධසිරිතිස්ස ස්ථවිරයන් වහන්සේ විසින් පිටපතක් දෙනලද්දේය. ඒ පොතද ආකූලව මරදින් ගහණවූ නමුත් එයම අපේ මේ කෘත්‍යයට ඉවහල්වූබව කෙලෙහි ගුණ සැලකීම්වශයෙන් මෙහි සඳහන් කරමු, මෙබඳු දෝෂයන් ගෙන්ගහණවූ පොතක් තනිපිටපතකින් එකවරටම ශුද්ධකිරීම බොහෝ දුෂ්කර වැඩකි, නමුත් ධම්මසඞ්ගණී ප්‍රකරණය සහ එහි අටුවාවටත් සමකොට බැලීමෙන්ද අපගේ ආචාර්‍යවූ දෙඩන්දූවේ ශෛලබිම්බාරාමාධිපති ගෞරවාර්හ සීලක්ඛන්ධාභිධානමහාස්ථවිරපාදයන්වහන්සේගේ සදුපදේශයන් ඇසුරුකිරීමෙන්ද ශක්තිපමණින් මේවර පොතේ ශුද්ධිය කෙළෙමු.

අභිධම්මාර්ථසඞ්ග්‍රහාදි සියලු පොත්වල උපචය සන්තතිරූපවය ලක්‍ෂණරූපයෙහි ඇතුලත්කොට ලක්‍ෂණරූපසතරකැයිද විකාර රූප පසකැයිද කියනලදී. මෙහි ඒ දෙක විකාරරූපයෙහි ඇතුලත් කොට විකාරරූපසතකැයිද ජරතා අනිච්චතා දෙක පමණක් ලක්‍ෂණරූපයයිද කියනලදී. මෙය ආචාර්‍යයන්ගේ මතභේදයක්ද ලිපිජාත දෝෂයක්දැයි විද්‍යුන් විසින් පරීක්‍ෂාකටයුතුයි. තවද රූපවිභාගයෙහි දසවෙනි ගාථාවේ ද්විතීයාර්ධය එකොළොස්වෙනි ගාථාවේ ප්‍රථමාර්ධයට අනතුරුව පොතේ ලියවී තුබුනේය. එය අභිධම්මාවතාරාදියා හා නොගැලපෙන බැවින් ලිපිදෝෂයකැයි සැලකා අපවිසින් එම ගාථාර්ධය පෙරළා යථාස්ථානයෙහි යොදනලදී. මෙහි අවසානයෙහි ඌනත්වයක් ඇතිවෙන්ටද පිළිවනැයි හැඟේ, නමුත් අපට ලැබුණු පිටපතේ තුබුනේ මෙපමණක්මැයි.

අපේ ප්‍රමාද භ්‍රමාදියෙන් ජනිතවූ ඉතිරිවූ දෝෂාංශුවක් මෙහි විද්‍යමාන වීනම් ලොකානුග්‍රහකාමී සුධීන් විසින් සමාධිය භජනය කිරීමෙන් ඒ සියල්ල ශුද්ධකරනු ලැබේවා, මෙයින් ලොකාර්ථසිද්ධියක්ම වන්නේය යනු අපේ ප්‍රධාන අදහසයි.

ගාල්ලේ ආර්‍යවිද්‍යාලයේ ප්‍රධානාචාර්‍යවූ ශිම්තොට ජයවර්ධනාරාමාධිපති සන්දන් මෙධඞ්කර ස්ථවිරයන් වහන්සේගේ සහායත්වයෙන් මිහිරිපැන්නේ අරියාකර විහාරාධිවාසි උගත් ධර්මාරාමයතීන්ගෙන් ලබාගන්නාලද සන්නයේ පිටපතද අපේ කෘත්‍යයට බොහෝසේ ඉවහල්වූ බවද කෘතඥතා පෙරටුව මෙහි සඳහන් කරමු.

B. DHAMMAPALA.

1908 ජනවාරිමස 1 වෙනි දින
බටපොලේ සුභද්‍රාරාමයේදීය.

# ශුද්ධි පත්‍රය.

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 4 | 12 | විශුඅඃශවු | විසුද්ධඃශවු |
| ” | ” | කුශලයන්ගේ | කුශලාකුශලයන්ගේ |
| 7 | 14 | සමුද්දවරනතා | සමුද්දවරතනා |
| ” | 25 | මයඛ්ඛාර කඤ්ඤපෙතාරං | මඤ්ඤාරංකඤ්ඤපෙතාරං |
| 8 | 10 | දෙයයධම්ම | දෙයධම්ම |
| ” | 19 | ආග්‍රකොට | අග්‍රකොට |
| ” | 25 | කුශලානතරයෙහි | කුශලානනතරයෙහි |
| 9 | 20 | විඤ්ඤාණඤ්චායතනං | විඤ්ඤාණඤ්චායතනං |
| 12 | 11 | කාමවචර | කාමාවචර |
| 13 | 20 | එකවිසති | එකවීසති |
| ” | 28 | සතතතිංස | සත්තතිංස |
| ” | 29 | සතිස් | සත්තිස් |
| 14 | 10 | සහගත | සහගත |
| ” | 32 | සමපයුකත | සම්පයුත්ත |
| 15 | 20 | විකඛිපතතාසස | වික්ඛිපතතාසස |
| ” | 28 | මුනීනා | මුනිනා |
| 16 | 12 | සඞ්ඛිලදං | සංඛිලදං |
| ” | 17 | උධච්චං | උද්ධච්චං |
| ” | 24 | විපාකය | විපාකය |
| ” | 26 | (එහෙයිනි | (එහෙයිනි) |
| ” | ” | පටිසම්භිද | පටිසම්භිද |
| ” | 29 | කාමාවචර | කාමාවචර |
| 17 | 5 | උපෙක්ඛාසහගතං | උපෙක්ඛාසහගතං |
| 18 | 9 | අභිතිපාත | අභිනිපාත |
| ” | ” | ආදීවු | ආදිවූ |
| ” | 15 | අහෙතුක හොනති | අහෙතුකා හොන්ති |
| ” | 28 | අලම්බන | ආලම්බන |
| 19 | 17 | නානතව | නානාතව |
| ” | 18 | නානතවයි | නානාතවයි |
| 20 | 1 | කුසලකම්ය | කුශලකර්මය |
| ” | 5 | කුසලකර්මය | කුශලකර්මය |
| 21 | 23 | මධ්‍යසථ | මධ්‍යස්ත |
| 22 | 15 | උපෙක්ඛාව | උපෙක්ඛාව |
| ” | 24 | චක්ෂුඃප්‍රසාදදී | චක්ෂුඃප්‍රසාදදී |
| ” | 26 | චකඛු | චක්ඛු |

| පිට | පෙල | අශුඬ | ශුඬ |
|---|---|---|---|
| 23 | 6 | චිත්තානී | චිත්තානි |
| ,, | 17 | මනොවිඤ්ඤාණ | මනොවිඤ්ඤාණ |
| ,, | 31 | ආපාතගතවූ | ආපාථගතවූ |
| 24 | 1 | 17 | (අධිකයෙකි) |
| ,, | 4 | කිරියචිත්තානී, | ක්රියචිත්තානි |
| ,, | 21 | මන ාවාර | මනොවාර |
| ,, | 24 | සාමත්ථියමපිච | සාමත්ථියමපිච |
| 25 | 25 | ආරුප්පෙපති චතුක්කානි | ආරුප්පෙ තිචතුක්කානි |
| 27 | 9 | සත්තචත්තාලීස | සත්තචත්තාලීස |
| ,, | 21 | චිත්තයෝ | චිත්තයෝ |
| ,, | 27 | තත්ථ ඒ | තත්ථ, ඒ |
| 28 | 17 | ජවාරාරම්මණ | ජවාරාරම්මණ |
| ,, | 27 | පාරිත්තා | පරිත්තා |
| 29 | 8 | ඉක්මුනාවූ | ඉක්මුණාවූ |
| ,, | 9 | පිරිත්තා | පරිත්තා |
| ,, | 15 | චිත්තණ්ඛයක් | චිත්තක්ෂණයක් |
| 30 | 4 | අතිපරිත්තෙනච. අතිපරිත්තා ලම්බනයෙහිද; මහන්තෙනච මහන්තාලම්බනයෙහිද; | (අධිකයෙකි) |
| 32 | 23 | අචලං | අමලං |
| ,, | 24 | අචලං | අමලං |
| ,, | 26 | තාවපඤ්ච | නවපඤ්ච |
| 35 | 11 | තදාලම්බනකෘත්‍යය | තදාලම්බනකෘත්‍යයද |
| ,, | 12 | ප්‍රතිසන්ධිවද භවාඞ්ග ප්‍රනයන්ධියෙන් | ප්‍රතිසන්ධියෙන් |
| 37 | 11 | ලොකුත්තරංචිත්තානි | ලොකුත්තරචිත්තානි. |
| 39 | 19 | දෘෂ්ටව්‍යවහාරයයි | දෘෂ්ටව්‍යවහාරයයි |
| 44 | 29 | පාඨගත | පාඨාගත |
| 45 | 24 | මහත්තත්වය | මහත්ත්වය |
| 51 | 28 | පුද්ගලාධ්‍යාශය | පුද්ගලාධ්‍යාශය |
| 57 | 14 | නිට්ඨිතා | නිට්ඨිතා |
| 58 | 6 | විරිසින්ද්‍රියං | විරියින්ද්‍රියං |
| ,, | 13 | මකසිකාරෙ | මනසිකාරො |
| ,, | 28 | සඤ්ඤා | සඤ්ඤා |
| 62 | 18 | වසතුහුගේ | වසතුහුගේ |
| 63 | 1 | ලභින්ධානමපත්ථම්භ | ලභින්ධානමුපත්ථම්භ |
| 72 | 2 | උපචයො චෙව | උපචයොචෙව |
| ,, | 17 | යවුත්තා | සාවුත්තා |
| ,, | ,, | මාතුච්ච | මාතුජ |

W. Sudassana, B. P.
Maha Vihara,

සන්නසහිත

# නාමරූපසමාසය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1 ගම්භීරං නිපුණං ධම්මං මරූනං යො පකාසයී,
සහස්සක්ඛස්ස උය්‍යානෙ වසං වස්සං නරාසභො.

2 නමස්සිත්වාන තං නාථං ධම්මං සංඝඤ්ච සාධුකං,
සමාසං නාමරූපස්ස භඤ්ඤමානං සුණාථ මෙ.

---

1 යො නරාසභො, යම් නරොත්තමයෙක්; සහස්සක්ඛස්ස, දහස් නුවණැස්ඇති සක්දෙව්රජහුගේ; උය්‍යානෙ, නඳුන් උයන්හි; වස්සං, ඇතුල්වස; වසං, වෙසෙමින්; ගම්භීරං, (අනුපචිත කුසල සම්භාරඇති මන්‍දබුද්ධීන් විසින් දුරවගාහ හෙයින්) ගැඹුරුවූ; නිපුණං, (නොබුදුව අනාචාර්‍ය්‍ය ප්‍රතිවෙධයෙන් ප්‍රතිවෙධ නොකොට හැකිහෙයින්) සියුම්වූ; ධම්මං, විජම්බණ; මරූනං, (මාතෘ දෙවපුත්‍ර ප්‍රමුඛ) දෙවියන්ට; පකාසයී, (පරොපදෙශ රහිතව දැන) ප්‍රකාශ කෙළේද.

2 තං නාථං, ඒ (සත්ත්වහිතොපදෙශක) නාථයාද; ධම්මඤ්ච, (ඔහු විසින් දෙසනලද ස්වාඛ්‍යාතතාදි ගුණගණොපෙත පර්‍ය්‍යාප්ති සහිත නවලොකොත්තර) සද්ධර්මයද; සංඝංච, (තදධාරවූ සුප්‍රතිපන්නතාදි ගුණගණාඪ්‍ය සඞ්ඝාත අෂ්ටාර්‍ය්‍ය පුද්ගල) සංඝයාද; සාධුකං, (භය ලොභාදීන් විනා) මනාකොට; නමස්සිත්වාන, (කායාදි ද්වාරත්‍රයෙන්) වැඳ; මෙ, මාවිසින්; භඤ්ඤමානං, කියනු ලබන්නාවූ; නාමරූපස්ස සමාසං, නාමරූපයාගේ සංක්ෂෙපය, හෙවත් නාමරූපසමාසනම් ප්‍රකරණය; සුණාථ, (අවික්ෂිප්තව) අසව්.

අථවා, නොහොත්, සම්පයුත්තා, (ස්පර්ශාදි) සම්ප්‍රයුක්ත ධර්මයෝ; තෙන, ඒ චිත්තය කරණකොටගෙන; ගොචරං, ආලම්බනය; චින්තෙන්තීතිච, සිතත්නුයි කියාද; (චිත්තනාම්වේ).

විචිත්ත කරණා චිත්ත මත්තනො චිත්තතායවා,
චිතං කම්ම කිලෙසෙහි චිතං තායති වා තථා;
චිනොති අත්තසන්තානං විචිත්තාරම්මණානි වා.

විචිත්තකරණා, (සිතියම් ආදිවූ) විසිතුරු කර්මාන්ත කරණහෙයින්ද නොහොත් (ආවර්ජන දර්ශනාදි) විචිත්‍රවූ කෘත්‍යකරණහෙයින්ද; (වර්ණසංස්ථානාදි වශයෙන්) විචිත්‍රවූ මනුෂ්‍යාදි ගති කරණහෙයින් හෝ; චිත්තං, චිත්තනම්වෙයි; අත්තනො, තමාගේ; චිත්තතායවා, (ජාතිභූමි සම්ප්‍රයොගාදි වශයෙන්) බහුවිධත්වයෙන් හෝ; (චිත්ත නම් වෙයි); කම්මකිලෙසෙහි, (කුශලාකුශලචෙතනාලක්‍ෂණවූ) කර්මය විසින්ද (අවිද්‍යා තෘෂ්ණා උපාදානයයි කියනලද) ක්ලෙශයන් විසින්ද; චිතං, රැස්කරණලදනුයි; හෙවත් විපාකත්වයෙන් උපදවනු ලද්දායි හෝ; (චිත්ත නම් වෙයි) තථා, එසේම; චිතං, (කර්ම ක්ලෙශයන් විසින්) රැස්කරණලද්දාවූ මේ ශරීරය; තායතිවා, (පශ්චාජ්ජාතාදි ප්‍රත්‍යය වශයෙන් උපකාරව) රක්‍ෂාකෙරේනුයිකියා හෝ (චිත්ත නම්වෙයි); අත්තසන්තානං, ස්වසන්තානය; නොහොත් චිත්තසන්තතිය; චිනොතීති, (ආසෙවන ප්‍රත්‍යසභාවයෙන් හා අනන්තරාදි ප්‍රත්‍යයත්වයෙන් හා උපකාරව) රැස්කෙරේනුයි හෝ; (චිත්ත නම්වෙයි) විචිත්තාරම්මණානිවා, (නීලපීතාදිවශයෙන්) විචිත්‍රවූ (රූපාදි) ආරම්මණඇත්තේනුයි කියා හෝ; (චිත්තනම්වේ).

චිත්තමෙකූනනවුති විධංඉති විභාවයෙ,
එකනවුති විධංවාපි එකවීස සතම්පිවා.

චිත්තං, චිත්තයතෙමේ; එකූනනවුති විධංඉති, (සංක්‍ෂෙපවිසින්) එකූනනූ වැදෑරුම්වන්නේයයි; විභාවයෙ, ප්‍රකාශකරන්නෝයි; එකනවුති විධංවාපි, (අභිඥා චිත්තයන් දෙදෙනා සමග) එකානූවැදෑරුම වන්නේයයි හෝ; විභාවයෙ, ප්‍රකාශකරන්නේය; එකවීසසතම්පිවා, (පාදකධ්‍යානභෙදයෙන් ලොකොත්තරයන් අටදෙනා සතළිස් වැදෑරුම් වන හෙයින් මධ්‍යම විසින්) එක්සිය එක්විස්සෙකැයිද; විභාවයෙ, ප්‍රකාශකරන්නේයි.

3 තත්‍ථ සමාසතො එකූනනවුති චිත්තානි.

“නමතීති භවෙ නාමං චිත්තචෙතසිකද්වයං,
නාමෙතීති භවෙ නාමං නිබ්බාණමමතං සිවං.

චිත්තචෙතසිකද්වයං, චිත්තචෛතසිකද්වය; නමතීති, ආලම්බනාභිමුඛව නැමේනුයි; නාමංභවෙ, නාමනම්වෙයි; අමතං, අමෘතවූ; සිවං, ශාන්තවූ; නිබ්බාණං, නිර්වාණයතෙමේ; නාමෙතීති, (තමා අරමුණුකරණ චිත්තචෛතසිකයන් තමා කරා) නමානුයිකියා; නාමංභවෙ, නාමනම්වේ.

චත්තාරො ච මහාභූතා උපාදා චතුවීසති,
අට්ඨවීසවිධං රූපං රූපනාති පරිදීපිතං.

චත්තාරොව මහාභූතා, සතරමහාභූතයෝද; උපාදාචතුවීසති, උපාදා රූපයෝ සුවිස්සද යන; අට්ඨවීසවිධංරූපං, අටවිසිවැදෑරුම්වූ රූපය; රූපනාති, රූපයයි; පරිදීපිතං, දක්වනලදී.

රුප්පතීති භවෙ රූපං විකාරපච්චයෙසති,
රූපරූපං තථා රූප පරියාපන්නතො පරං.

රූපරූපං, අටළොස් වැදෑරුම්වූ නිෂ්පන්න රූපය; විකාරපච්චයෙසති, (ශීතොෂ්ණාදි) විරොධි ප්‍රත්‍යයක් ඇතිකල්හි; රුප්පතීති, (විෂදෘශොත්පත්තියයි කියනලද) විකාරයට පැමිණේනුයි; රූපංභවෙ, රූපනම්වෙයි; පරං, අන්‍යවූ දශවිධ අනිෂ්පන්නවූ රූපය තෙම; රූපපරියාපන්නතො, (නිෂ්පන්නරූපයන්ගේම විකාරලක්‍ෂණයෙක්නුයි කියා) රූපයෙහි අන්තර්ගතවූ හෙයින්; තථා, එසේම; රූපං, රූපනම්වේ.

3 තත්‍ථ, ඒ යථාප්‍රතිඥාත නාමරූප සමාසයෙහි; සමාසතො, (විස්තරමධ්‍යමය හැර) සංක්‍ෂෙපයෙන්; චිත්තානි, චිත්තයෝ; එකූනනවුති, එකුනනූවෙකි.

“විජානාතීති භවෙ චිත්තං චින්තනාමත්තමෙව වා,
සම්පයුත්තාථ වා තෙන විජානන්තීති ව ගොචරං.

විජානාතීති, අරමුණු සිතානුයි; චිත්තංභවෙ, චිත්තනම්වෙයි; චින්තනාමත්තමෙව වා, අරමුණුසිතීම් මාත්‍රය හෝ; (චිත්තනම්වෙයි)

4 තානි චතුබ්බිධානි හොන්ති, කථං? කුසලාකුසල විපාකකිරිය භෙදෙන, තෙසු එකවීසති කුසලචිත්තානි ද්වාදස අකුසලචිත්තානි ඡත්තිංස විපාකචිත්තානි වීසති කිරියචිත්තානි.

---

4 තානි, ඒ එකූනනුසිත්හූ; චතුබ්බිධානිහොන්ති, සතරවැදෑරුම් වෙත්; කථං,? කෙසේහෙයින් සතරවැදෑරුම්වෙද්දයත්?; කුසලාකුසල විපාකකිරිය භෙදෙන, කුශලය හා අකුශලය විපාකය හා ක්‍රියාය යන චතුර්විධ ප්‍රභෙදහෙයිනි;: තෙසු, ඒ කුශලාදීන් අතුරෙහි; කුසලචිත්තානි, (ආරොග්‍යාද්‍යර්ථයෙන්)කුශලයැයි කියනලද චිත්තයෝ; එකවීසති, එක්විස්සෙකි; අකුසලචිත්තානි, කුශල ප්‍රතිපක්‍ෂචිත්තයෝ; ද්වාදස, දොළොසෙකි; විපාකචිත්තානි, (අන්‍යොන්‍ය විසදෘශවූ කුශලයන්ගේ විපාකයක් හෙයින්)විපාකයැයි කියනලද චිත්තයෝ, ඡත්තිංස, සතිසෙකි; කිරියචිත්තානි. (කුශලාකුශලයන් සේ ඵලදායක නොවහුදුකරණ මාත්‍රාවක් හෙයින්) ක්‍රියාවයි කියන ලද චිත්තයෝ; වීසති, විස්සෙකි.

‘‘ආරොග්‍යට්ඨා’නවජ්ජට්ඨ සුඛ†පාකට්ඨතො තථා,
කොසල්ල සම්භවට්ඨෙන කුසලන්ති පවුච්චති.

ආරොග්‍යට්ඨානවජ්ජට්ඨ සුඛපාකට්ඨතො, (ක්ලෙශව්‍යාධියට ප්‍රතිපක්‍ෂභාවයයි කියනලද) ආරොග්‍යාර්ථය, (අවද්‍යසඞ්ඛ්‍යාතවූ අකුශලයන්ට ප්‍රතිපක්‍ෂභාවයයි කියනලද) අනවද්‍යාර්ථය (ඉෂ්ටවිපාකදානස්වභාවයයි කියනලද) සුඛවිපාකාර්ථය යන මෙයින්ද; කොසල්ලසම්භවට්ඨෙන, කෞශල්‍යනම්වූ ඥානයෙන් ගතයුතුහෙයින්ද; කුසලං ඉති, කුශලයයි; පවුච්චති, කියනුලැබේ.

කුච්ඡිතානං සලනතො කුසානං ලවනෙන වා,
කුසෙන ලාතබ්බත්තාවා කුසලන්ති පවුච්චති.

කුච්ඡිතානං, ගර්හිතවූ පාපධර්මයන්; සලනතො, නසන හෙයින්ද; කුසානං, කුත්සිතාකාරයෙන් සන්තානයෙහි පවත්නාවූ අකුශලයන්; ලවනෙනවා, සිඳුනා හෙයින්ද; කුසෙන, කුසනම්වූ ඥානයෙන්; ලාතබ්බත්තාවා, ගතයුතුහෙයින්ද; කුසලන්තිපවුච්චති, කුශලයයි කියනුලැබේ’’.

න කුසලන්ති අකුසලං කුසලපටිපක්ඛන්තිඅත්ථො, පටිපක්ඛතා ච යථාක්කමං පහායක පහාතබ්බභාවෙන, විසිට්ඨානං කුසලාකුසලානං පාකොති විපාකො, කරණමත්තං ක්‍රියා ඵලදාතා සම්භවතො.

---

† සුඛවිපාකට්ඨො, පොත්

5 චතුබ්බිධානිකුසලානි, කාමරූපාරූප ලොකුත්තරභූමිභෙදෙන, අට්ඨ කාමාවචරානි; පඤ්ච රූපාවචරානි, චත්තාරි අරූපාවචරානි, චත්තාරි ලොකුත්තරානි චෙති.

---

5 කුසලානි, යථොක්තකුශලචිත්තයෝ; චතුබ්බිධානි, සතරවැදෑරුම්වෙත්; කෙසේදයත්? කාමරූපාරූප ලොකුත්තර භූමිභෙදෙන, කාම භූමිය රූපභූමිය, අරූපභූමිය ලොකුත්තරභූමිය යන චතුර්විධ භූමිප්‍රභෙද විසිනි.

භවන්ති එත්ථ ධම්මාති භූමි, ඨානං අවත්ථාච, අවත්ථාපි හි අවත්ථාවන්තානං පවත්තිට්ඨානංවිය ගය්හති, එවංහිසති තෙසං සුඛගහණං හොතීති. තත්ථ ලොකියා භූමි ඨානාවත්ථාවසෙන, ලොකුත්තරා භූමී අවත්ථාවසෙනෙව.

කාමාවචරානි, (එකාදසකාමභවයෙහි බොහෝසේ හැසිරෙන හෙයින්) කාමාවචරයහයි කියනලද චිත්තයෝ; අට්ඨ, (වෙදනාඥාන සංස්කාරභෙදයෙන්)අටදෙනෙක; රූපාවචරානි, (අසංඥතලවර්ජිත පසළොස්රූපභවයෙහි බොහෝසේ හැසිරෙනහෙයින් (රූපාවචරයහයි කියනලද චිත්තයෝ; පඤ්ච, (විතර්කාදි ධ්‍යානාඞ්ගභෙදයෙන්) පස්දෙනෙක;: අරූපාවචරානි, (සතර අරූපභවයෙහි බොහෝසේ හැසිරෙන හෙයින්) අරූපාවචරයහයි කියනලද චිත්තයෝ; චත්තාරි, (කෘතෙසනාද්ඝාටන ආකාශාදි ආලම්බන ප්‍රභෙදයෙන්) සතරදෙනෙක; ලොකුත්තර චිත්තානි, (උපාදානසකන්ධ සඞ්ඛ්‍යාත ලොකයෙන් නැගෙනහෙයින්) ලොකුත්තරයහයි කියනලද චිත්තයෝ; චත්තාරි, (ප්‍රහාතව්‍යක්ලෙශ විභාගයෙන්) සතරදෙනෙකි.

“කාමෙ'වචරතීත්‍යෙ'තං කාමාවචරමීරිතං,
සෙසෙ අවචරන්තම්පි සඞ්ගාමාවචරොවිය.

එතං, මේ කාමාවචර චිත්තයතෙම; සෙසෙඅවචරන්තම්පි, සෙසුරූපාරූපභවයෙහි හැසිරෙන්නේද; කාමෙ'වචරතීති,(භූයොවෘත්තීන්)කාමභවයෙහි හැසිරේනුයිකියා; කාමාවචරමීරිතං; කාමාවචරයයි කියනලදී; කුමක්මෙන්දයත්? සඞ්ගාමාවචරොවිය, (සංග්‍රාමභූමියෙහි හැසිරෙන්නාවූ හස්තිහු එයින් පිටත හැසිරෙතුදු බොහෝසේ සඞ්ග්‍රාමභූමියෙහි හැසිරෙනහෙයින්) සඞ්ගාමාවචර නම් වන්නාහුමෙනි.

6 තත්‍ථ සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකන්ති ඉමානි අට්ඨ කාමාවචර කුසලචිත්තානි.

---

පටිසන්ධිම්භවෙ කාමෙ අවචාරයතී ති වා,
කාමාවචරමිච්චෙව පරියාපන්නතායි තත්‍ර වා.

කාමෙ භවෙ, කාමභවයෙහි; පටිසන්ධිං, පිළිසිඳ; අවචාරයතී තිවා, හසුරුවාතුයි හෝ; තත්‍ර, ඒ කාමාවචර ධර්‍මයන් කෙරෙහි; පරියාපන්නත්තිවා; ඇතුළත්තුයි හෝ; කාමාවචරමිච්චෙව, කාමාවචරයයිම කියයුලුයේ; (රූපාවචර අරූපාවචරයෙහිදු මෙසේ නය යෙදියයුතු)".

උපාදානක්ඛන්ධසඞ්ඛාතා ලොකතො උත්තරන්තීති ලොකුත්තරානි, උපාදානානං ගොචරක්ඛන්ධා, උපාදානානං, කාමුපාදානාදීන්ට; ගොචරස්කන්ධා, ආලම්බන රූපාදී පඤ්චස්කන්ධයෝ; උපාදානස්කන්ධයම්වෙත්; ලොකනම්, රූපාදී පඤ්චස්කන්ධයයි සේයි.

6 තත්‍ථ, ඒ කාමාවචරයන් අතුරෙහි; සොමනස්ස සහගතං (ඉෂ්ටානුභවනලක්ෂණවූ) මානසික සුඛවෙදනාවහා එකොත්පාදාදී භෙදයට ගියාවූ, ඤාණසම්පයුත්තං (යථාස්වභාවප්‍රතිවෙධලක්ෂණවූ) ඥානයහා එකොත්පාදාදී ප්‍රකාරයෙන් යුක්තාවූ; අසංඛාරිකං,(තමා විසින් හෝ මෙරමාවිසින් හෝ) පූර්‍වප්‍රයොගරහිතවූ; එකං, එක්කුසල් සිතෙක; සසඞ්ඛාරිකං,(තමාවිසින් හෝ මෙරමාවිසින් හෝ)පූර්‍වප්‍රයොග සහිතවූ; එකං, එක්කුසල්සිතෙක; උපෙක්ඛාසහගතං, (මධ්‍යස්ථානුභවන ලක්ෂණවූ) උපෙක්ෂාවෙදනාවහා—පෙ—ඉමානි අට්ඨ, (රූපාදීයමක් අරමුණුකොට කායාදි ද්වාරත්‍රයෙහි කායකර්‍මාදි වශයෙන් උපදනා) මොහුඅටදෙන; කාමාවචරකුසලචිත්තානි, කාමාවචර කුශලචිත්තයෝ නම් වෙත්.

"සද්ධාබහුලතා සුද්ධ දිට්ඨිතා ඵලදස්සනං
දෙය්‍යධම්මපටිග්ගාහ කාලදෙසාදිසම්පදා,
සොමනස්සයුතා සද්ධි බුද්ධානුස්සතිආදි ච
සොමනස්සස්ස උප්පත්ති හෙතූති පරිකිත්තිතා

සද්ධාබහුලතා, ශ්‍රද්ධාධික බවද; සුද්ධදිට්ඨිතා, සම්‍යක්දෘෂ්ටික බවද; ඵලදස්සනං, අනුසස් දක්නාබවද; දෙය්‍යධම්මපටිග්ගාහක කාල දෙසාදිසම්පදා, දෙයධර්මසම්පත්තිය ප්‍රතිග්‍රාහකසම්පත්තිය කාල සම්පත්තිය දේශසම්පත්තියආදී ශබ්දයෙන් පරිවාරසම්පත්තිය යන මොහුද; සොමනස්සයුතාසන්ධි, සෞමනස්‍යසම්ප්‍රයුක්ත ප්‍රතිසන්ධියද; බුද්ධානුස්සතිආදිච, බුද්ධානුස්මෘති ආදිවූ (ඒකාදශවිධ ප්‍රීති සම්බොධ්‍යඞ්ගස්ථානීයධර්මයෝ)ද; සොමනස්සස්ස උප්පත්තිහෙතූති, සෞමනස්‍යවෙදනාවගේ උප්පත්තියට කාරණයහයි; පරිකිත්තිතා, කියනලදහු.

යොනිසො විසයාභොගා නියාමපරිණාමතො,
සමුදාචරතතා ඉට්ඨෙපි විසයෙ කුසලං සියා.

යොනිසොවිසයාභොගා, නුවණින් අරමුණු ආවර්ජනාකිරීමෙන්ද; හෙවත් යොනිසොමනසිකාරයෙන්ද; නියාමපරිණාමතො, (මා විසින් කුසල්කටයුතුයයි) නියමකිරීමෙන්ද (කුසල්කිරීම උතුම්යයි) කුසලකරණයට සිත්සතන් නැමීමෙන්ද; සමුදාචරණතා, කුසලකරණය පුරුදුකරණ හෙයින්ද; ඉට්ඨෙපි විසයෙ (ලොභයටනිසිවූ) ඉෂ්ටවූ ආලම්බනයෙහි; කුසලං සියා, කුසල්සිත් උපදනේයි.

කම්මොපපත්තින්ද්‍රිය පරිපාකවසාපි ච,
කිලෙසදූරීභාවා වා හොති ඤාණෙන යුත්තතා.

කම්මොපපත්තින්ද්‍රිය පරිපාකවසාපිච, (පූර්වජන්මයෙහි නිවන් පතා කරණලද කුශල)කර්මය (පීඩාරහිතවූ) දිව්‍යලොකොත්පත්තිය (ප්‍රඥාදශකයෙහිලා) ඉන්ද්‍රියපරිපාකය යන මොවුන්ගේ වශයෙන්ද, කිලෙසදූරීභාවාවා, ක්ලේශයන්ගේ දුරුවීමෙන්ද; ඤාණෙනයුත්තතාහොති, ඥානසම්ප්‍රයුක්ත බවවේ.

පුබ්බප්පයොගසඤ්ජාතො විසෙසො චිත්තසම්භවී,
සඞ්ඛාරො තෙන රහිත මසඞ්ඛාරඤ්ඤථෙ'තරං.

පුබ්බප්පයොගසඤ්ජාතො, (තමාවිසින්හෝ මෙරමාවිසින්හෝ කරණලද) පූර්වප්‍රයොගයෙන් උපන්නාවූ; චිත්තසම්භවීවිසෙසො, චිත්තයෙහිවනසුලුවූවිශෙෂය, සඞ්ඛාරො, සංස්කාරනම්වේ, තෙන රහිතං, ඒසංස්කාරයෙන්විරහිතවූ චිත්තයතෙම;අසඞ්ඛාරං, අසංස්කාරනම්වෙයි; අඤ්ඤථා, අනික්පරිද්දෙන්වූ හෙවත් සංස්කාරසහිතවූ චිත්තයතෙම; ඉතරං, සසංස්කාරික නම්වේ.

මජ්ඣත්තාරම්මණුපෙක්ඛා පටිසන්ධාදිකම්පන,
උපෙක්ඛාවෙදනුප්පත්ති හෙතුභාවෙන දීපිතං.

7 විතක්ක විචාරපීතිසුඛ චිත්තෙකග්ගතා සම්පයුත්තං පඤ්චඞ්ගිකං පඨමජ්ඣානං. විචාරපීතිසුඛ චිත්තෙකග්ගතා සම්පයුත්තං චතුරඞ්ගිකං දුතියජ්ඣානං පීතිසුඛ චිත්තෙකග්ගතා සම්පයුත්තං තිවඞ්ගිකං තතියජ්ඣානං සුඛචිත්තෙකග්ගතා සම්පයුත්තං දුවඞ්ගිකං චතුත්ථජ්ඣානං උපෙක්ඛාචිත්තෙකග්ගතා සම්පයුත්තං දුවඞ්ගිකං පඤ්චමජ්ඣානන්ති, ඉමානි පඤ්ච රූපාවචරකුසලචිත්තානි.

---

මජ්ඣත්තාරම්මණු පෙක්ඛා පටිසන්ධාදිකම්පන, ඉෂ්ටමධ්‍යස්ථාලම්බනය උපෙක්ෂා ප්‍රතිසන්ධිය යනාමේ ආදියවනාහි; උපෙක්ඛාවෙදනුප්පත්ති හෙතුභාවෙන, උපෙක්ෂාවෙදනාවගේ උත්පත්තියට කාරණභාවයෙන්; දීපිතං. ප්‍රකාශකරණලදී; (මෙහිආදිශබ්දයෙන් දෙ ය්‍යධර්මසම්පත්තිය ගම්භීරප්‍රකෘතිය උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගස්ථානීය යනමේ ආදිහුගැණෙත්.)”

කාමාවචරකුසලි.

(8)

7 විතක්ක, (තමාහා සම්ප්‍රයුක්තචිත්ත චෛතසික ධර්මයන් අරමුණට නගන)විතර්කයද; විචාර, (තමාහා සම්ප්‍රයුක්ත චිත්තචෛතසික ධර්මයන් ආලම්බනයෙහි හසුරුවන) විචාරයද, පීති, (ඉෂ්ටාලම්බන ප්‍රතිලාභයෙහි පිනනය කරණ) ප්‍රීතියද, සුඛ, (ප්‍රතිලබ්ධාලම්බනයෙහි රසාස්වාදය කරණ) සුඛයද, චිත්තෙකග්ගතා, (නානාලම්බන ග්‍රහණය නොකොට එකාන්තම ආග්‍රකොට ඇතිබැවින් සම්ප්‍රයුක්තධර්මයන්ගේ අවික්ෂිප්තභාවසාධකවූ) සමාධියද යන; (උපනිධ්‍යාන කෘත්‍යයෙහි බලවත් මොවුන් පස්දෙනාහා); සම්පයුත්තං, එකොත්පාදාදී ප්‍රකාරයෙන්යුක්තවූ; පඤ්චඞ්ගිකං, පස්අඟක්ඇති; පඨමජ්ඣානං, (දෙශනානුක්‍රමයෙන්හා උත්පත්තික්‍රමයෙන්හා පළමුවනධ්‍යානකුශලචිත්තයද; —පෙ— ඉමානිපඤ්ච, (පඨවි කසිණාදියම්කිසිවක් විෂය කොට ඥානයුක්තකුශලානන්තරයෙහි භාවනාමයවඋපදනා)මොහුපස් දෙන; රූපාවචරකුසලචිත්තානි, රූපාවචර කුශලචිත්තයෝයි.

“ථූලසුඛුමභාවෙන තක්කචාරා යථාක්කමං,
ඝණ්ඩාභිඝාතානුරාව සදිසා ඉති දීපිතා.

තක්කචාරා, විතර්කවිචාරයෝ දෙදෙන;යථාක්කමං, පිළිවෙළින්; ථූලසුඛුමභාවෙන, ඖදාරිකභාවයෙන්හා සූක්ෂ්මභාවයෙන්; ඝණ්ඩාභිඝාතානුරාවසදිසාඉති, ඝණ්ටායෙහි අභිඝාතයනිසා උපන් ප්‍රථම නාදය එයට ඉක්බිතිව උපන් අනුනාදය යන මෙම දෙදෙනාහා සදෘශයහයි, දීපිතා, ප්‍රකාශකරණලදහු.

8 ආකාසානඤ්චායතනං විඤ්ඤාණඤ්චායතනං ආකිඤ්චඤ්ඤායතනං නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති ඉමානි චත්තාරි අරූපාවචර කුසලචිත්තානි.

---

තක්කො පුබ්බඞ්ගමො කංස ථාලග්ගහකරොචිය,
අනුමජ්ජනහෙතූව චාරො හොතානුමජ්ජකො.

පුබ්බඞ්ගමො, (ආලම්බන ග්‍රහණයෙහි) පූර්වඞ්ගමවූ; තක්කො, විතර්කයතෙම; කංසථාලග්ගහකරොචිය, (මදින පිණිස) තලියගත් අතබඳුය; අනුමජ්ජකො, අරමුණුපිරිමදිනා ආකාරයෙන් පවත්නා; චාරො, විචාරයතෙම; අනුමජ්ජනහෙතුව හොත්, තලිය මදින අත බඳුවේ.

ආලම්බනස්ස ලාභෙ ච ලද්ධස්සා'නුභවෙපි ච,
විසෙසො පාකටො පීති සුඛානං සහජාතපි.

සහජාතානංඅපි, සහජාතවූද; පීතිසුඛානං, ප්‍රීතිසුඛදෙදෙනාගේ; විසෙසො, වෙනස; ආලම්බනස්ස, ආලම්බනයාගේ; ලාභෙපිච, ප්‍රතිලාභකාලයෙහිද; ලද්ධස්සානුභවෙපිච, ප්‍රතිලබ්ධාලම්බනයාගේ ආස්වාදකාලයෙහිද; පාකටො හොති, ප්‍රකටවේ".

## රූපාවචරකුසලි.

—(8)—

8 ආකාසානඤ්චායතනං, (රූපසමතික්‍රමණයකොට කිසුණු ඉගුළුවූ අහස්හි උපදනා) ආකාසානඤ්චායතන කුසලචිත්තය; විඤ්ඤාණඤ්චායතනං, (ආකාශ සමතික්‍රමණයකොට එහි ප්‍රවෘත්ත විඥානය ගොචරකොට ඇති) විඤ්ඤාණඤ්චායතන කුසලචිත්තය; ආකිඤ්චඤ්ඤායතනං, (ප්‍රථමාරූපය සමතික්‍රමණය කොට ඔහුගේ නාස්තිභාවය ගොචරකොට ඇති) ආකිඤ්චඤ්ඤායතන කුසලචිත්තය; නෙවසඤ්ඤානාසඤ්ඤායතනන්ති, (ඔහුගේ නාස්තිභාවය සමතික්‍රමණය කොට එහි ප්‍රවෘත්ත තෘතීයාරූපය ගොචරකොටඇති) නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලචිත්තය යන, ඉමානි චත්තාරි, (රූපාදීන් ඉක්ම කිසුණු ඉගුළුවූ අහස්විෂයකොට උපෙක්ෂාඥානයුක්ත කුශලානන්තරයෙහි භාවිතාමයව උපදනා) මොහු සතරදෙන; අරූපාවචර කුසලචිත්තානි, අරූපාවචර කුසලචිත්තයෝ නම්වෙති.

9 සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස තිදොසප්පහාණ කරං සොතාපත්ති මග්ගචිත්තං.

---

“ආරුප්පාරූප මාකාසං විඤ්ඤාණං තදභාවතං,
අතික්කමිත්වා කමතො හොන්තාකාසාදිගොචරෙ

ආරුප්පා. අරූපාවචර කුසලධ්‍යානයෝ සතරදෙන; රූපං, (ප්‍රතිභාගනිමිත්ත සඞ්ඛ්‍යාත) රූපයද; ආකාසං, (කසිණොද්ඝාටජ) ආකාශයද; විඤ්ඤාණං, එහි ප්‍රවෘත්තවූ ප්‍රථමාරූප්‍යවිඥාන යද; තදභාවතං, ඒ ප්‍රථමාරූප්‍ය විඥානයාගේ අභාවයද යන මොවුන්; කමතො, පිළිවෙළින්; අතික්කමිත්වා, ඉක්මවා; ආකාසාදිගොචරෙ, කසිණොද්ඝාටජ ආකාශය ප්‍රථමාරූප්‍යවිඥානය ඔහුගේ නාස්තිභාවය ඒ නාස්තිභාවයෙහි ප්‍රවෘත්තවූ තෘතීයාරූප්‍ය විඥානය යනමේ සතර අරමුණෙහි; හොන්ති, වන්නාහුයි”.

## අරූපාවචරකුසල්.

—— 8 ——

9 සක්කායදිට්ඨි, (රූපයම ආත්මය යනාදීන් විපරීත ක්‍රමයෙන් විද්‍යමානවූ පඤ්චස්කන්ධයෙහි උපදනා විංශතිවස්තුකවූ) සත්කාය දෘෂ්ටිය; විචිකිච්ඡා, (බුදුහු ඇතිහෝ නැති හෝ යනාදීන්වූ බුද්ධාදි අටතැන්හි උපදනා සංශය ලක්‍ෂණ) විචිකිත්සාය; සීලබ්බතපරාමාස, (ශීලයෙන් ශුද්ධය ව්‍රතයෙන් ශුද්ධිය ශීලව්‍රතයෙන් ශුද්ධියයි දෘඪග්‍රාහ වශයෙන් උපදනා සීලබ්බත පරාමාශය යන; තිදොස, මේ තුන් දෝෂ යන් තුන්දෙනාගේ; පහානකරං, සමුච්ඡේද ප්‍රහාණය කරන්නාවූ; සොතාපත්තිමග්ගචිත්තං, සෝවාන්මග හා සම්ප්‍රයුක්ත සිත ය— සීලනානි ගොසීලාදි, තදෙවිභත්තියා සතතං චරිතබ්බත්තා වතං.

“නකරොමීති පවත්තස්ස විරාමො සීලමීරිතං,
වෙසො ච භොජනං කිච්ච චරණාදි වතං සියා.

නකරොමී යි, (වස්ත්‍රධාරණාදිය) නොකෙරෙමියි; පවත්තස්ස, ප්‍රවෘත්තයාගේ; විරාමො, (වස්ත්‍රධාරණාදියෙන්) විරමණය; හෙවත් විරමණාකාරයෙන් ප්‍රවෘත්තවූ දෘෂ්ටිසම්ප්‍රයුක්ත අකුශල චිත්තෝත්පාදයතෙම; සීලමීරිතං, ශීලයයි කියනලද; වෙසොච, (පරිබ්‍රාජකාදි) ලිඞ්ගයද; භොජනං, (මූලඵලාදි) භොජනයද; කිච්චචරණාදි,

10 කාමරාගබ්‍යාපාදානං තනුත්තකරං සකදාගාමිමග්ගචිත්තං, කාමරාග බ්‍යාපාදානං නිරවසෙසපහානකරං අනාගාමිමග්ග චිත්තං, රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජානං අනවසෙසප්පහානකරං අරහත්තමග්ගචිත්තන්ති ඉමානිචත්තාරි ලොකුත්තර කුසලචිත්තානි, ඉමානි කුසලචිත්තානි.

---

(පඤ්චතාපසකණ්ටකාලසස්සපා කොසල්ලකුචතාදි වශයෙන්) දුඃඛාවහවූ ක්‍රියායෙහි හැසිරීමද යන (මේ ආදීයතෙම); වතං සියා, ව්‍රත නම්වේ’’

අරියමග්ගසොතස්ස ආපත්ති සොතාපත්ති, නිබ්බානං මග්ගති නිබ්බානත්ථිකෙහි මග්ගීයති කිලෙසෙ මාරෙන්තො ගච්ඡතීති වා මග්ගො, සොතාපත්තියා මග්ගො සොතාපත්තිමග්ගො, තෙන සම්පයුත්තං චිත්තං සොතාපත්තිමග්ගචිත්තං.

10 කාමරාග, කාමභවප්‍රාර්ථනා හා මෛථුනරාගය; ව්‍යාපාදානං, (මේ සත්ත්ව නසිත්වයි යනාදීන් යම්කිසි අරමුණෙක්හි යම්කිසි පරිද්දකින් හෝ ගැටෙමින් උපදනා) ද්වේෂයද යන මේ වූන් දෙදෙනාගේ; තනුත්තාකරං, (කායවාක් ද්වාරයෙහි ව්‍යතික්‍රම නොකරනුව හුදු මනොද්වාරයෙහිද කලාතුරෙන් උපදනා පරිද්දෙන්); තුනුබව් කරණ; සකදාගාමි මග්ගචිත්තං, සෙදගැමි මග සිත—

පටිසන්ධිවසෙන සකිං කාමභවං ආගච්ඡතීති සකදාගාමී. අරියපුග්ගලො, තස්ස මග්ගො සකදාගාමිමග්ගො, පුරිමුප්පන්නමග්ගො මග්ගන්තරාවච්ඡෙදනත්ථං තථාවිසෙසීයති, තෙන සම්පයුත්තං චිත්තං සකදාගාමිමග්ගචිත්තං—

කාමරාග ව්‍යාපාදානං, (උක්තප්‍රකාර) කාමරාග ව්‍යාපාද දෙදෙනාගේ; නිරවසෙසප්පහානකරං, (කලාතුරෙන් මූත්දෙදෙරෙහිදු නො උපදනා පරිද්දෙන්) සමුච්ඡෙදප්‍රහාණය කරණ; අනාගාමි මග්ග චිත්තං, අනාගැමි මගසිත—

පටිසන්ධිවසෙන කාමභවං න ආගච්ඡතීති අනාගාමී, අරිය පුග්ගලො. තස්ස මග්ගො අනාගාමිමග්ගො, තෙන සම්පයුත්තං චිත්තං අනාගාමිමග්ගචිත්තං—

රූපරාග, රූපභවප්‍රාර්ථනාය; අරූපරාග, අරූපභව ප්‍රාර්ථනාය; මාන, (සෙය්‍යොහමස්මි’ යනාදීන් උඩඟුව උපදනා නවවිධ)

මානය; උද්ධච්ච. (ආලම්බනයෙහි නොසන්හුන්බවයයි කියනලද) ඖද්ධත්‍යය; අවිජ්ජානං, (දුක්ඛ දුක්ඛසමුදයාදි අටතන්හි සම්මූඪව පවත්නා) මොහය යනමේ පස්දෙනාගේ; අනවසෙස පහාන කරං, සමුච්ඡෙදප්‍රහාණියකරන්නාවූ; අරහත්තමග්ගචිත්තං,රහත් මග සිතය–

අරහතීති අරහා, තස්ස භාවො අරහත්තං, අරහත්තඵල ස්සෙතං අධිවචනං, අරහත්තස්ස මග්ගො අරහත්තමග්ගො, තෙන සම්පයුත්තං චිත්තං අරහත්තමග්ගචිත්තං.

“වෙදනාඤාණසඞ්ඛාරභෙදෙන පන අට්ඨධා,
කාමාවචර කුසලං කාම සුගති සාධකං.

කාමාවචරකුසලං, කාමාවචරකුශලචිත්තයතෙම්; වෙදනා ඤාණසඞ්ඛාරභෙදෙන, වෙදනා ඥාන සංස්කාර භෙදයෙන්; අට්ඨධා, අටවැදෑරුම්වෙයි; කාමසුගතිං සාධකං, කාමභවයෙහි සුගතිය සාධන්නේයි.

ඣානඞ්ගයොග භෙදෙන චිත්තං පඤ්චවිධං භවෙ,
රූපාවචර කුසලං රූප භූමිප්පවත්තකං.

රූපාවචර කුසලං චිත්තං, රූපාවචර කුශලචිත්තය; ඣානඞ්ග යොග භෙදෙන, (විතර්කාදි) ධ්‍යානාඞ්ගයන් හා සම්ප්‍රයුක්ත භෙද යෙන්; පඤ්චවිධංභවෙ, පස්වැදෑරුම් වන්නේය; රූපභූමිප්පවත්ත කං, රූපාවචර භූමි පවත්වන්නේයි.

ආලම්බනප්පභෙදෙන චතුධාරුප්ප මානසං,
උපෙක්ඛෙකග්ගතායුත්ත මාරුප්පභවසාධකං.

ආරුප්පමානසං, අරූපාවචර කුශලචිත්තය; ආලම්බනප්ප භෙදෙන, ආලම්බන ප්‍රභෙදයෙන්; චතුධා, සතරවැදෑරුම්වෙයි; උපෙක්ඛෙකග්ගතායුත්තං, උපෙක්ෂා චිත්තෛකාග්‍රතාවයන් සම්ප්‍ර යුක්තය; ආරුප්පභවසාධකං, අරූපභවය සාධන්නේයි.

හොති ලොකුත්තරං චිත්තං චතුමග්ගප්පභෙදතො,
චතුධා මග්ග භෙදෙව පහාතබ්බප්පභෙදතො,

ලෝකුත්තරං චිත්තං. ලෝකොත්තර කුශලචිත්තය; චතුමග්ගප්පභෙදතො, සතරමාර්ගයන්ගේ ප්‍රභෙදයෙන්; චතුධා, සතර වැදෑරුම්වෙයි; මග්ගභෙදෙන ච, ඒමාර්ගයාගේප්‍රභෙදයද;පහාතබ්බප්පභෙදතො, ඒ ඒ මාර්ගයෙන් ප්‍රහීණකටයුතු සත්කායදෘෂ්ට්‍යාදි ක්ලෙශයන්ගේ ප්‍රභෙදයෙන්; (චතුධා, සතරවැදෑරුම්වේ).

කෙවලං පුබ්බයොගෙන උස්සාහෙනෙව වා'ඉධ,
අනුප්පජ්ජනතො තිණ්ණං න අසඞ්ඛාරිකාදිතා.

කෙවලං, හුදෙක්; පුබ්බයොගෙන්, පූර්වජන්මයෙහි (ශමථ විදර්ශනායෙහි කරණලද) පරිචයමාත්‍රයකින් හෝ; ඉධ, මේ ජන්මයෙහිලා; උස්සාහෙනෙවවා උත්සාහමාත්‍රයෙකින්ම හෝ; අනුප්පජ්ජනතො නොඋපදනාහෙයින්; (උභයාඞ්ගසම්පත්තීන්ම වනහෙයින්) තිණ්ණං,(රූපාවචර අරූපාවචර ලොකොත්තර කුශලයන්)තුන්දෙනාගේ; අසංඛාරිකාදිතාය, අසංස්කාරික සංස්කාරික භාවයනැති.

කාමෙ අට්ඨෙව රූපෙ ච පඤ්ච චත්තාරි රූපිසු,
චත්තාරා'නුත්තරානෙ'වං කුසලානෙ'කවීසති.

කාමෙ, කාමභවයෙහි; අට්ඨෙව, (කුශලචිත්තයෝ)අටදෙනෙක්මය; රූපෙ, රූපභවයෙහි; පඤ්ච. (කුශලචිත්තයෝ) පස්දෙනෙක්මය; අරූපිසු, අරූපභවයෙහි; චත්තාරි, (කුශලචිත්තයෝ)සතරදෙනෙක්මය; අනුත්තරානි, ලොකොත්තර කුශලචිත්තයෝ; චත්තාරි,. සතරදෙනෙක්මයයි; එවං,. මෙසේ; කුසලානි, කුශලචිත්තයෝ; එකවීසති, එක්විස්සෙකි.

සද්ධිං අභිඤ්ඤාචිත්තෙන බාවීසං ඣානභෙදතො,
සත්තත්තිංසවිධං වා'පි කුසලං පරිදීපිතං.

කුසලං, කුශලචිත්තයතෙම; අභිඤ්ඤාචිත්තෙන සද්ධිං. (ශෛක්ෂපෘථග්ජනයන්ට උපදනා)අභිඥාකුශලචිත්තය හා සමග; බාවීසං, දෙවිස්සෙකැයිද; ඣානභෙදතො, පාදකධ්‍යාන භෙදයෙන්(ලොකොත්තර කුශලයන් විංශතියක් වනහෙයින්); සත්තතිංසවිධංවාපි, සත්තිස්වැදෑරුම් වන්නේයයිද; පරිදීපිතං, දක්වනලදී.

ලොකුත්තර කුසලං.

—— 8 —— —

11 අකුසලචිත්තානි තිවිධානි, අට්ඨලොභසහගත(චිත්තානි) ද්වෙ පටිඝ (සම්පයුත්තානි) චිත්තානි ද්වෙ එකහෙතුක (චිත්තානි)ති. තත්ථ සොමනස්සසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං සොමනස්සසහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං උපෙක්ඛාසහගතං දිට්ඨිගතසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං උපෙක්ඛාසහගතං දිට්ඨිගතවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකන්ති ඉමානි අට්ඨ ලොභසහගත චිත්තානි දොමනස්සසහගතං පටිඝසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකන්ති, ඉමානි ද්වෙ පටිඝසම්පයුත්ත චිත්තානි. විචිකිච්ඡාසහගතමෙකං උද්ධච්ච සහගතමෙකන්ති; ඉමානි ද්වෙ එකහෙතුක චිත්තානි; ඉමානි ද්වාදස අකුසල චිත්තානි.

---

11 අකුසලචිත්තානි. අකුශල චිත්තයෝ; තිවිධානි, (ලොභාදි මූල වශයෙන්) තුන්වැදෑරුම් වෙත්; ලොභසහගතානි. (අරමුණෙහි ගිජුවූ ස්වභාවවූ) ලොභය හා එකොත්පාදාදි භාවයට ගියාවූ චිත්තයෝ; අට්ඨ, (වෙදනාදෘෂ්ටි සංස්කාර භෙදයෙන්) අටදෙනෙක; පටිඝචිත්තානි, ප්‍රතිඝසම්ප්‍රයුක්ත චිත්තයෝ; ද්වෙ (සම්පයුක්ත වෙදනාදීන්ගේ වශයෙන් භෙදයක් නැතිව හුදු සංස්කාර භෙදයෙන්) දෙදෙනෙක; එකහෙතුකානි; මොහහෙතුකයෝ; ද්වෙ, (විචිකිච්ඡා උද්ධච්ච භෙදයෙන්) දෙදෙනෙක—දිට්ඨිගතසම්පයුත්තං, (අනිත්‍යාදි ධර්මස්වභාව ඉක්ම නිත්‍යසුඛශුභාදිවශයෙන් විපරීතාභිනිවේශ ස්වභාවවූ) මිථ්‍යාදෘෂ්ටිය හා එකොත්පාදාදි භාවයෙන් යුක්තවූ—දොමනස්සසහගතං,(අනිෂ්ටානුභවන ලක්ෂණවූ) මානසික දුඃඛ වෙදනාව හා සම්ප්‍රයුක්තවූ; පටිඝ සම්පයුත්තං, (ආලම්බනයෙහි ගැටෙමින් උපදනා) ද්වේෂය හා සම්ප්‍රයුක්තවූ.

"අට්ඨධා ලොභමූලානි වෙදනාදිප්පභෙදතො,
ද්වෙ එව දොසමූලානි සම්පයුත්තාවිසෙසතො.

ලොභමූලානි, (අන්‍ය චිත්තයන්ට අසාධාරණවූ) ලොභමූලික කොට ඇති චිත්තයෝ; වෙදනාදිප්පභෙදතො, වෙදනාදෘෂ්ටිසංස්කාර භෙදයෙන්; අට්ඨධා. අටවැදෑරුම් වෙත්; දොසමූලානි,(අන්‍යචිත්තයන්ට අසාධාරණවූ) ද්වෙෂමූලිකකොට ඇති චිත්තයෝ; සම්පයුත්තාවිසෙසතො, සම්පයුක්ත ධර්මයන්ගේ වෙනසක් නැතිහෙයින්; ද්වෙ එව, (සංස්කාර භෙදයෙන්) දෙදෙනෙක්ම වෙත්.

දොමනස්ස සහගතං පටිඝෙ යුත්තනයිදං,
උපලක්ඛණමෙතස්ස අසාධාරණධම්මතො.

දොමනස්සසහගතං පටිඝෙනයුත්තන්ති, 'දොමනස්සසහගතං පටිඝෙනයුත්තං, යන; ඉදං, මෙවිශෙෂණය; අසාධාරණධම්මතො, (අනෙකුත් චිත්තයන්ට) අසාධාරණවූ දොම්නස්සය ප්‍රතිඝය යන ධර්මයන්; එතස්ස, මේ ද්වෙෂමූලිකවූ චිත්තයාගේ; උපලක්ඛණං, හැඳින්වීම පිණිසයි.

මොහමූලං ද්විධොපෙක්ඛා සහිතංව පවත්තති,
මුළ්හත්තා ච චලත්තා ච න ච සඞ්ඛාරතො භිදා.

මොහමූලං. (කෙවල) මොහමූල්කොට ඇත්තාවූ චිත්තයම, ද්විධා, (විචිකිච්ඡා ඖද්ධත්‍යයන්හා සම්ප්‍රයුක්තභෙදයෙන්) දෙවැදෑරුම් වෙයි, මුළ්හත්තාච, (මොහයෙන්) මුළාහෙයින්ද; චලත්තාච, (විචිකිච්ඡා ඖද්ධත්‍යයොගයෙන් අරමුණෙහි සනිටුහන් නැතිව) චලවනමන් නාහෙයින්; උපෙක්ඛාසහිතංව, උපෙක්ෂාසහගතවම; පවත්තති, පවත්නේය; සඞ්ඛාරතො, සංස්කාරවශයෙන්; භිදාන, භෙදයක් නැත; (තථාහි, එසේමැයි.)

න හි තස්ස සභාවෙන තික්ඛතුස්සාහනීයතා,
අපි සංසප්පමානස්ස වික්ඛිපන්තස්ස සබ්බදා.

සංසප්පමානස්ස, (අරමුණෙහි) සනිටුහන්නැතිව පවත්නාවූද, වික්ඛිපන්තස්ස, වික්ෂෙපව පවත්නාවූද; තස්ස, ඒමොහමූලකවූ චිත්තයාගේ; සභාවෙනතික්ඛතා, ස්වභාවයෙන්ම තියුණුබවෙක්වේද; උස්සාහනීයතා,(තමාවිසින් හෝ මෙරමාවිසින් හෝ) උත්සාහකටයුතු බවෙක්; නහිඅත්ථි, නොමැති.

අඤ්ඤෙසු ලබ්භමානම්පි උද්ධච්චං බලවන්තිමෙ,
තෙනෙව මුනිනා පාඨෙ සරූපෙනෙ'ත්ථ උද්ධටං.

අඤ්ඤෙසු, සෙසු අකුසලචිත්තයන්කෙරෙහි; ලබ්භමානම්පි, ලැබෙන්නාවූ; උද්ධච්චං, ඖද්ධත්‍යයතෙම; අන්තිමෙ, කෙළවර චිත්තයෙහිලා; බලවං, බලවත්; තෙනෙව, එහෙයින්ම; මුනිනා, සර්වඥයන්විසින්; එත්ථ, මේඅන්තිම චිත්තයෙහිලා; සරූපෙනෙව, (යෙවාපනකනාමයෙන් නොකියා "උද්ධච්චංහොති"යි, ස්වරූපයෙන්ම; පාඨෙ, පාළියෙහි; උද්ධටං, නගනලදී.

12 විපාකචිත්තානි චතුබ්බිධානි, කාමරූපාරූප ලොකුත්තර භූමි වසෙන. තෙවීසති කාමාවචර විපාක චිත්තානි, තානි දුවිධානි හොන්ති. කුසලවිපාකානි අකුසලවිපාකානි චෙති කුසලවිපාකානි

---

උද්ධච්චරහිතා සෙසා 'කුසලා'පායසාධකා,
සබ්බා සුගතියඤ්චාපි පවත්තිඵලදායකා.

උද්ධච්චරහිතා, ඖද්ධත්‍යචිත්තයා විසින් විරහිතවූ; සෙසාඅකුසලා, සෙසු(එකොළොස්) අකුශලචිත්තයෝ; අපායසාධකා, සතරඅපායෙහි ප්‍රතිසන්ධියසාධන්නාහ; සබ්බෙ, (ඖද්ධත්‍යචිත්තයා හාසමග) සියලු (දොළොස්) අකුශලචිත්තයෝ; සුගතියඤ්චාපි, සුගතියෙහිද; පවත්තිඵලදායකා, ප්‍රවෘත්ති විපාකදෙත්.

දස්සනෙන පහාතබ්බෙ අවුත්තත්තා'ව තාදිනා,
උද්ධච්චං සන්ධිඵලදං න හොතෙවාති නිච්ඡයො.

දස්සනෙන, (පළමුකොට නිර්වාණය දක්නාහෙයින් දර්ශන නම්වූ) ප්‍රථම මාර්ගයා විසින්; පහාතබ්බෙසු, ප්‍රහීණකටයුත්තාවූ කෙලෙශයන් අතුරෙහි; තාදිනා, අෂ්ටලොකධර්මයෙහි නිර්විකාරවූ සර්වඥයන් විසින්; අවුත්තත්තාව, (ඖද්ධත්‍යචිත්තය) නොකියනලද හෙයින්ම උද්ධච්චං, ඖද්ධත්‍ය චිත්තයතෙම; සන්ධිඵලදං න හොතෙවාති, ප්‍රතිසන්ධිවිපාකදයක නොවන්නේයයි; නිච්ඡයො, නියමයි.

පවත්තිඵලදානම්පි සො'නෙකෙ නානුයුජ්ජති,
උද්ධච්චපාකපඤ්ඤත්ති හි වුත්තා'ත්ථපටිසම්භිදා.

පවත්තිඵලදානම්පි, ප්‍රවෘත්ති විපාකදානයද; නඉති, නැතැයි එකෙ, සමහරකෙනෙක් (කියති); තං නයුජ්ජති, ඒ නොයෙදේ; කුමක්හෙයින්දයත්?, උද්ධච්චපාක පඤ්ඤත්ති, ඖද්ධත්‍ය චිත්තයාගේ විපාකය අරමුණුකොට ඇත් ප්‍රඥප්තොමෝ; අත්ථපටිසම්භිදා, අර්ථපටිසම්භිදායයි (යම් හෙයකින්); වුත්තා (පිළිසිඹියායෙහි) කියනලද්ද (එහෙයින්-උද්ධච්චසහගතෙඤාණං ධම්මපටිසම්භිදා, තස්ස විපාකෙඤාණං අත්ථපටිසම්භිදා”.

**12 අකුසල චිත්තානි.**

12 කාමාවචර විපාකචිත්තානි, කාමාවචර විපාකවූ චිත්තයෝ— කාමාවචරානිච තානි විපාකචිත්තානි චෙති කාමාවචර විපාක චිත්තානි— කුසලවිපාකානි, කුසලයන්ගේ විපාකයහ—කුසලානං

සොළස අකුසලවිපාකානි සත්ත, කුසලවිපාකානි ද්විධානි අහෙතුකානි සහෙතුකානි චෙති. අහෙතුකානිඅට්ඨ සහෙතුකානි අට්ඨ.

13 තත්ථ උපෙක්ඛාසහගතං කුසලවිපාකං චක්ඛුවිඤ්ඤාණං තථා සොතවිඤ්ඤාණං ඝාණවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං සුඛසහගතං කායවිඤ්ඤාණං කුසලවිපාකාහෙතුක මනොධාතු උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනං කුසලවිපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතු සොමනස්ස සහගතා සන්තීරණං කුසලවිපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛා සහගතං සන්තීරණනති ඉමානි අට්ඨ අහෙතුක කුසල විපාකචිත්තානි.

---

විපාකානි කුසලවිපාකානි—අහෙතුකානි, (සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ සුප්‍රතිෂ්ඨිතභාව සාධකවූ අලොභාදි සහජාත හෙතුනැතිහෙයින්) අහෙතුකයහ, සහෙතුකානි, (සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ සුප්‍රතිෂ්ඨිත භාවසාධකවූ අලොභාදි සහජාත හෙතු ඇතිහෙයින්) සහෙතුකය හයි; ද්විධානි, දෙවැදෑරුම්වෙත්; අහෙතුකානි අට්ඨ. (චක්ෂුර්විඥානාදිවශයෙන්) අහෙතුකයෝ අටදෙනෙක; සහෙතුකානි. සහෙතුකයෝ; අට්ඨ, (ස්වකීයවූ කුශලයාමෙන් වෙදනාදි භෙදයෙන්) අටදෙනෙකි.

13 චක්ඛුවිඤ්ඤාණං, (රූපදර්ශනයට හෙතුවූ චක්ෂුස ඇසුරුකොට පවත්නාවූ) චක්ෂුර්විඥානය; සොතවිඤ්ඤාණං, (ශබ්දශ්‍රවණයට හෙතුවූ ශ්‍රොත්‍රයම ඇසුරුකොට පවත්නාවූ) ශ්‍රොත්‍රවිඥානය; ඝාණවිඤ්ඤාණං, (ගන්ධාඝ්‍රාණයට හෙතුවූ ඝ්‍රාණය ඇසුරුකොට පවත්නාවූ); ඝ්‍රාණවිඥානය; ජිව්හාවිඤ්ඤාණං, (රසාස්වාදයට හෙතුවූ ජිහ්වාව ඇසුරුකොට පවත්නාවූ)ජිහ්වා විඥානය; කායවිඤ්ඤාණං, (ස්පර්ශයට හෙතුවූ කායහෙතුකොට පවත්නාවූ) කායවිඥානය;— මනොධාතු, (මනොවිඥානයාමෙන් බලවත් විජානනකෘත්‍ය රහිතව හුදු මනනමාත්‍රධාතුවක් හෙයින්) මනොධාතුවූ—සම්පටිච්ඡනං, (රූපාදීන් ප්‍රතිග්‍රහණය කරණ) සම්පටිච්ඡනචිත්තය— මනොවිඤ්ඤාණධාතු. (මනොධාතුනු සෙයින් මනන මාත්‍රකොට බලවත් විජානනකෘත්‍යය ඇතිහෙයින්) මනොවිඥානධාතුවූ—සන්තීරණං, (රූපාදීන් තීරණයකෙරෙමින් උපදනා) සන්තීරණ චිත්තය.

"රූපාදිවිසයෙ පාත මනෙතසුඛාදිසු පචසු,
තථා'නිට්ඨනාමනෙසු ගහණාදිසු තීසුපි.
හෙතුප්පත්තියා නත්ථි සම්භවො නාම කොචිපි.
තස්මා සහෙතුකස්සාපි පාකා හොන්ති අහෙතුකා"

14 සොමනස්සසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං සොමනස්සසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං උපෙක්ඛාසහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකං උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරිකමෙකන්ති ඉමානි අට්ඨ සහෙතුකකුසලවිපාක චිත්තානි, අට්ඨ සහෙතුක කුසලවිපාක චිත්තානි කුසලසදිසානි යෙව උප්පජ්ජන්ති, කිං නු විපාකානීති නානාකරණං.

---

රූපාදිවිසයෙ, රූපශබ්දාදිපඤ්චාලම්බනයෙහි; පාතමත්තෙනාසු, අභිනිපාතමාත්‍රවූ; හෙවත් ප්‍රවෘත්තිමාත්‍රවූ; ආදිසුපඤ්චසු, ආදිවූ (චක්ෂුර්විඥානාදි) පඤ්චවිඥානයන් කෙරෙහිද; තථා, එසේමැයි; අතිමනාමනෙසු, අතිශයෙන් මනාවූද නුවූද: ගහණාදි සුතීසුපි, සම්පටිච්ඡනාදී තුන්දෙනා කෙරෙහිද. හෙතුප්පත්තියා,(අලොභාදි අව්‍යාකෘත)හෙතූන්ගේ උත්පත්තියට; සමහවො නාම කොචිපි, කාරණවූ කිසිවෙකුත් නත්ථි, නැත; තස්මා, එහෙයින්; සහෙතුකස්සාපි, සහෙතුකවූද කුශලයාගේ; පාකා, විපාකයෝ; අහෙතුකා හොන්ති, අහෙතුකවෙත්–රූපාදි පඤ්චාලම්බනයෙහි අභිනිපාත මාත්‍රවූ පඤ්චවිඥානයන් කෙරෙහිද අතිමනාවූ සම්පටිච්ඡනයා කෙරෙහිද මනාවූ සන්තීරණයන් දෙදෙනා කෙරෙහිද ආලම්බනයෙහි සුප්‍රතිෂ්ඨිතභාවසාධක අලොභාදි සහජාත හෙතූන්ගේ උත්පත්තියට කාරණයක් නැතිහෙයින් සහෙතුකයාගේ විපාකවූද මොහුඅටදෙන අහෙතුක වෙති යනු භාවයි.

“එකනිස්සයචිත්තස්ස නානන්තර පවත්තිතො,
ආරම්මණ රසස්සාදෙ දුබ්බලං සම්පටිච්ඡනං,
තස්මා උපෙක්ඛා සහිතං හොති සන්තීරණම්පන,
තබ්බිපක්ඛෙන විසයෙ දුවිධෙ දුවිධං සියා”.

සම්පටිච්ඡනං, සම්පටිච්ඡන චිත්තයතෙම; එකනිස්සය චිත්තස්ස, සමානවස්තු නිශ්‍රය චිත්තයක්හට; නානන්තර පවත්තිතො, අනතුරුව නොපවත්නා හෙයින්; ආරම්මණරසස්සාදෙ, ආලම්බනරසානුභවයෙහි; දුබ්බලං, දුර්වලය; තස්මා, එහෙයින්; උපෙක්ඛාසහිතං හොති, උපෙක්ෂාසහගතවෙයි; සන්තීරණංපන, සන්තීරණ චිත්තය වනාහි; තබ්බිපක්ඛෙන, එයට විරුද්ධනයින්; දුවිධෙවිසයෙ, (ඉෂ්ට මධ්‍යස්ථවශයෙන්) ද්විප්‍රකාර විෂයෙහි; දුවිධංසියා, (සොමනස්ස උපෙක්ෂා විසින්) ද්විප්‍රකාරවේ.

13 කුසලසදිසානියෙව, කාමාවචර කුශල සදෘශවූවාහුම; උප්පජ්ජන්ති, (පරිත්තපඤ්චාලම්බනයෙහි) උපදිත්.

“සභූමිකුසලෙ'හෙ'ත් මහාපාකා සමා විනා,
කම්මද්වාරඤ්ච කම්මඤ්ච පුඤ්ඤානං ක්‍රියවුත්තිං.

---

එත්ථ, මේ කාමාවචරවිපාකයන් අතුරෙහි; මහාපාකා, මහාවිපාකයෝ අටදෙන; කම්මද්වාරඤ්ච, (කායකර්මාදි) කර්මද්වාරයද; කම්මඤ්ච, (කායකර්මාදි) කර්මයද; පුඤ්ඤානං ක්‍රියවුත්තිං, දානාදි දශපුණ්‍යක්‍රියාවස්තුවද; විනා, හැර; සභූමිකුසලෙහි, ස්වකීය භූමියෙහි වූ කාමාවචරකුශලයන් අටදෙනාගාම; සමා, සමයෝයි; තථාහි, එසේමැයි.

අවිඤ්ඤත්තිජනත්තාහි අවිපාකසභාවතො,
අප්පවත්තනතො චේ'වං පාකා පුඤ්ඤෙහි නො සමා”

පාකා, මහාවිපාකයෝ; අවිඤ්ඤත්තිජනත්තා, කර්මද්වාරවූ කායවාග් විඥප්ති* නොඋපදවන හෙයින්ද; අවිපාකසභාවතො, (කායකර්මාදිවූ) විපාකදෙන ස්වභාවයක් නැති හෙයින්ද; එවං අප්පවත්තනතො ච, දානශීලාදිපුණ්‍යක්‍රියාවශයෙන් නොපවත්නා හෙයින්ද; පුඤ්ඤෙහි, (සම්භූමික) කුශලචිත්තයන් හා; නොසමා, නොසම වෙත්.

කින්තු, නානත්වකිම; විපාකානීති, විපාකයහයි යනු; නානාකරණං,(කුසලවිපාක දෙදෙනාගේ) නානත්වයි– මොවුන් විපාකොත්පාදනයෙහි ව්‍යාපාර රහිතව වැටෙනබව නානත්වයයි සේයි.

“අසඞ්ඛාරසසඞ්ඛාර විධානම්පන පුඤ්ඤතො,
ඤෙය්‍යම්පච්චයතො චේව විපාකෙසු ච විඤ්ඤුනා.

විපාකෙසුච, විපාකයන් කෙරෙහිද; අසඞ්ඛාරසසඞ්ඛාර විධානම්පන, අසංස්කාර සසංස්කාර විධානයවනාහි; පුඤ්ඤතො, (සමාන විපාකජනකවූ අසංස්කාරික සසංස්කාරික) කුශලවශයෙන්; පච්චයතො ච, (ඍතුභොජනාදිසත්ප්‍රාය) ප්‍රත්‍යය වශයෙන්ද;(වන්නේයයි); විඤ්ඤුනා, නුවණැත්තහු විසින්; ඤෙය්‍යං, දතයුතුයි.

---

කාලොපධිප්පයොගානං ගතියා ච යථාරහං,
සම්පත්තිඤ්ච විපත්තිඤ්ච කම්මමාගම්ම පච්චති.

'නො උපන්හෙයින්ද' පොත්.

කම්මං, කුසලකර්මයතෙම; කාලොපධිප්පයොගානං, කාලය උපධිය ප්‍රයොගය යනමොවුන්ගේද; ගතියාව, ගතියගෙද; සම්පත්ති ඥව විපත්තිඥව, සම්පත්තියටද විපත්තියටද; යථාරහං, නිසිපරිද්දෙන්; ආගම්ම. පැමිණ; පච්චති, අසංස්කාර සංස්කාර විපාකදෙන්නේයි– කාලඋපධිප්‍රයොග ගති සම්පත්තියට පැමිණ කුසල කර්මය අසංස්කාරවිපාකදෙයි, කාලඋපධිප්‍රයොගගතිවිපත්තියට පැමිණ සසංස්කාර විපාකදෙයි යොදනු.

තිහෙතුපුඤ්ඤමුක්කට්ඨං පටිසන්ධිං තිහෙතුකං,
දත්වා සොළසපාකානි පවත්තෙ තු විපච්චති.

උක්කට්ඨං තිහෙතුපුඤ්ඤං, (ඡන්දාදිසහජාතාධිපතිවශයෙන්) උත්කෘෂ්ටවූ ත්‍රිහෙතුකවූ කුශලචිත්තය; තිහෙතුකං පටිසන්ධිං දත්වා, ත්‍රිහෙතුකවූ ප්‍රතිසන්ධියදී; පවත්තෙ තු, ප්‍රවෘත්තියෙහි වනාහි; සොළසපාකානි, (අහෙතුකඅෂ්ටක සහෙතුක අෂ්ටක වශයෙන්) සොළොස් විපාක චිත්තයන්; විපච්චති, උපදවන්නේයි.

තිහෙතුමොමකමුක්කට්ඨං ද්විහෙතු ච ද්විහෙතුකං,
සන්ධිං දත්වා පවත්තෙ තු තිහෙතුක විවජ්ජිතෙ.

තිහෙතුමොමකං, (යථොක්ත අධිපතිවශයෙන්ම) හීනවූ ත්‍රිහෙතුක කුශලචිත්තයද; උක්කට්ඨං ද්විහෙතුව. උත්කෘෂ්ටවූ ද්විහෙතුක කුශලචිත්තයවනාහි; ද්විහෙතුකං සන්ධිං දත්වා, ද්විහෙතුකවූ (සුගති) ප්‍රතිසන්ධියදී: පවත්තෙ තු, ප්‍රවෘත්තියෙහි වනාහි; තිහෙතුක විවජ්ජිතෙ. ත්‍රිහෙතුක විපාකයෙන්පිටත් ද්විහෙතුක අහෙතුකවූ දොළොස් විපාකචිත්තයන් (දෙන්නේයි).

ද්විහෙතුමොමකපුඤ්ඤං තු පටිසන්ධිමහෙතුකං,
දත්වා'හෙතුක පාකානි පවත්තෙ පන පච්චති.

ද්විහෙතුමොමකපුඤ්ඤං තු, හීනවූ ද්විහෙතුක කුශලචිත්තයවනාහි; අහෙතුකං පටිසන්ධිං දත්වා, අහෙතුකවූ සුගති ප්‍රතිසන්ධියදී; පවත්තෙ පන, ප්‍රවෘත්තියෙහි වනාහි; අහෙතුකපාකානි, අහෙතුක විපාකචිත්තයන් අටදෙනා; පච්චති, උපදවන්නේයි.

සන්ධිංමෙකහෙතුකම්ම'ම්මිකං ජනෙති න තතොපරං,
අනෙකානි විපාකානි සඤ්ජනෙති පවත්තියං.

එකහෙතුකම්මං, එකකර්මයෙක්; එකං සන්ධිං ජනෙති, එකම්පිළිසඳක් උපදවන්නේය; න තතොපරං, එයින් අන්‍යක් නොඋපදවන්නේයි; පවත්තියං, ප්‍රවෘත්තියෙහි; අනෙකානි විපාකානි, නොයෙක් විපාකයන්; සඤ්ජනෙති, උපදවන්නේයි.

අසඞ්ඛාරමසඞ්ඛාර සසඞ්ඛාරමපි දෙති හි,
සසඞ්ඛාරමසඞ්ඛාර සසඞ්ඛාරඵලං තථා.

අසඞ්ඛාරං, අසංස්කාරික කුශලචිත්තයතෙම; අසඞ්ඛාර, අසංස්කාරිකවද; සසඞ්ඛාරං, සසංස්කාරිකවූද (විපාකචිත්තය); දෙති, දෙයි; තථා, එසේම; සසඞ්ඛාරං, සසංස්කාරිකවූ කුසලචිත්තයතෙම; අසඞ්ඛාර, අසංස්කාරිකවූද. සසඞ්ඛාර,සසංස්කාරිකවූද; ඵලං, විපාකචිත්තය, දෙති, දෙන්නේයි.

ද්වාදසාපුඤ්ඤචිත්තානං විපාකා සත්ත සත්ත'ති,
භවන්ති චතුරාසීති පාපපාකා යථාරහං,

ද්වාදසාපුඤ්ඤචිත්තානං, දොළොස්අකුශල චිත්තයන්ගේ; විපාකා; විපාකයෝ; සත්තසත්තාඉති. සත්සත්දෙනෙක් වෙත්නුයි; පාපපාකා, අකුශලවිපාකයෝ; යථාරහං, නිසිපරිද්දෙන්; චතුරාසීතිභවන්ති, සුවාසූදෙනෙක්වෙති.

ලොභාදීනමපාකත්තා 'ලොභාදීනමසම්භවා,
සත්තාකුසලපාකානි අහෙතුකෙ'ව සබ්බදා.

ලොභාදීනං, (ඒකාන්තසාවද්‍යවූ) ලොභාදී හෙතූන්තුන්දෙනාගේ; අපාකත්තා, අවිපාකබවහෙයින්ද; අලොභාදීනං, අලොභාදී හෙතූන්ගේ; අසම්භවා, (අකුශලවිපාකයෙහිලා) සම්භවයක් නැති හෙයින්ද; සත්තාකුසලපාකානි, අකුශලවිපාකයෝසත්දෙන; සබ්බදා, හැමකල්හි; අහෙතුකෙව, අහෙතුකම්වෙත්.

අනිට්ඨානිට්ඨමජ්ඣත්තෙ වෙදනාය අභෙදතො,
මනොවිඤ්ඤාණධාතෙ'කා ඉති සත්තවිධෙ'ව'මෙ.

අනිට්ඨානිට්ඨමජ්ඣත්තෙ, අනිෂ්ටානිෂ්ටමධ්‍යස්ථ යන ආලම්බනයෙහි; වෙදනාය අභෙදතො, වෙදනාවගේ භෙදයක් නැතිහෙයින්; මනොවිඤ්ඤාණධාතු එකාඉති, මනො විඤ්ඤාණධාතු සන්තීරණ චිත්තය (කුශලවිපාකයෙහි මෙන් දෙවැදෑරුම් නොව) එකෙක්මවේ මැයි; ඉමෙ, මේඅකුශල විපාකචිත්තයෝ, සත්තවිධාඑව. සත් වැදෑරුම්ම වෙත්; (අහෙතුක කුශල විපාකයන් සේ අට වැදෑරුම් නොවෙත්).

තථාහෙ'ස්ස උපෙක්ඛා'ව දොමනස්සං න ලබ්භති,
පටිඝෙන විනා තස්ස කදාචිපි අසම්භවා.

තථාහි, එසේමැයි; එස්ස, මේ සන්තීරණචිත්තයෙහි; උපෙක්ඛාව, උපෙක්ෂාවෙදනාවම (ලැබෙයි); දොමනස්සං නලබ්භති, දෞර්මනස්‍ය වෙදනාතොමෝ නොලැබේ; කුමක්හෙයිනයත්?; තස්ස, ඒ දෞර්මනස්‍යයාගේ; පටිඝෙනවිනා, ප්‍රතිඝයා කෙරෙන්වෙන්ව; කදාචිපි අසම්භවා, කිසිකලෙක්හිදු සම්භවයක් නැතිහෙයිනි.

උපෙක්ඛාපි සමානා'යං දුක්ඛභාවෙන වත්තති,
න හි පාපවිපාකස්ස අත්ථි කාචි අදුක්ඛතා.

අයං, මේ අකුශලවිපාක සම්ප්‍රයුක්තවූ වෙදනාතොමෝ; උපෙක්ඛාපිසමානා, උපෙක්ෂාවිද; දුක්ඛභාවෙනවත්තති, දුඃඛස්වභාවයෙන් පවතියි; එසේමැයි; පාපවිපාකස්ස, අකුශලවිපාකයාගේ; කාචිඅදුක්ඛතා, කිසිඅදුක්ඛවෙක්; නහිඅත්ථි, නොමඇති,

ඉට්ඨාරම්මණයොගස්මිං චක්ඛුවිඤ්ඤාණකාදිසු,
සති කස්මා උපෙක්ඛාව වුත්තා'වතුසු සත්ථුනා.

ඉට්ඨාරම්මණයොගස්මිං සති, ඉෂ්ටවූ රූපාදිආලම්බනයන්ගේ (චක්ෂුඃප්‍රසාදදින්හා)ගෙදීමක් ඇතිකල්හි; හෙවත් ඉෂ්ටවූ රූපාදිසතර අරමුණ චක්ෂුර්ද්වාරාදි සතරදොරටහමුවූ කල්හි; චක්ඛුවිඤ්ඤාණකාදිසු, චක්ෂුර්විඥනාදිවූ; චතූසු, චතුර්විධ විඥනයන් කෙරෙහි; උපෙක්ඛාව, උපෙක්ෂාවෙදනාවම; සත්ථුනා, ශාස්තෲහුවිසින්; කස්මා වුත්තා, කුමක්හෙයින් කියනලදද?.

දුබ්බලත්තා'භිඝාතස්ස භූතිකෙනෙව භූතිකෙ,
චක්ඛාදිචතුවිඤ්ඤාණං සොපෙක්ඛංයෙව සබ්බදා.

භූතිකෙනෙව, (චක්ෂුඃප්‍රසාදාදි) උපාදාරූපයා විසින්ම; භූතිකෙ, (වර්ණාදි) උපාදාරූපයෙහි; අභිඝාතස්ස, ඝට්ටනයාගේ; දුබ්බලත්තා, දුර්වලහෙයින්; චක්ඛාදිචතු විඤ්ඤාණං, චක්ඛුසොතඝාණජිව්හායතන විඤ්ඤාණසතර; සබ්බදා, හැමකල්හි; සොපෙක්ඛංයෙව උපෙක්ෂා සහගතවම්මවේ.

කායන්ස්සයඵොට්ඨබ්බ භූතායං බලවත්තතො,
පටිඝාතස්ස සොපෙක්ඛං න සියා කායමානසං."

15 උපෙක්ඛාසහගතං අකුසලවිපාකං චක්ඛුවිඤ්ඤාණං තථා සොතවිඤ්ඤාණං ඝාණවිඤ්ඤාණං ජිව්හාවිඤ්ඤාණං දුක්ඛසහගතං කායවිඤ්ඤාණං අකුසලවිපාකාහෙතුකමනොධාතු උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනං අකුසලවිපාකාහෙතුකමනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතං සන්තීරණඤ්චාති ඉමානි සත්ත අකුසලවිපාකාහෙතුක චිත්තානි. පඤ්ච රූපාවචරවිපාකචිත්තානි කුසලසදිසානියෙව උප්පජ්ජන්ති. චත්තාරි අරූපාවචර විපාකචිත්තානි කුසලසදිසානියෙව උප්පජ්ජන්ති. චත්තාරි ලොකුත්තර විපාකචිත්තානි. සොතාපත්තිඵලචිත්තං සකදාගාමිඵලචිත්තං අනාගාමිඵලචිත්තං අරහත්ත ඵලචිත්තඤ්චෙවාති. ඉමානිචත්තාරි ලොකුත්තර ඵල චිත්තානි, ඉමානි ඡත්තිංස විපාකචිත්තානි.

16 කිරියචිත්තානි භූමිවසෙන තිවිධානි හොන්ති. කාමාවචරානි රූපාවචරානි අරූපාවචරානි චෙති එකාදස කාමාවචරානි, පඤ්ච රූපාවචරානි, චත්තාරි අරූපාවචරානි, කාමාවචරානි දුවිධානි, අහෙතුකානි සහෙතුකානි චෙති, අහෙතුකානිතීණි. සහෙතුකානි අට්ඨ, තත්ථකිරියාහෙතුක මනොධාතු උපෙක්ඛාසහගතං පඤ්චද්වාරාවජ්ජනං කිරියාහෙතුක මනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතං හසිතුප්පාද චිත්තං කිරියාහෙතුක මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතං වොත්ථප්පනඤ්චෙති ඉමානි තීණි අහෙතුක කිරියචිත්තානි.

---

කායනිස්සයඵොට්ඨබ්බභූතානං, කායප්‍රසාදයට නිශ්‍රයවූ භූත සත්භාස්ප්‍රෂ්ටව්‍යාලම්බනවූ භූතයන් දෙදෙනාසම්බන්ධිවූ; පරිඝාතස්ස, අන්‍යොන්‍යසඞ්ඝට්ටනයාගේ; බලවන්තතො. බලවත්හෙයින්; කායමානසං, කායවිඥානයතෙම; සොපෙක්ඛං නසියා, උපෙක්ෂාසහගත, නොවන්නේයි, (සුඛසහගතමවේ).

15 කුසලසදිසානියෙව උප්පජ්ජන්ති, (සම්ප්‍රයුක්ත ධර්මයන්හා ආලම්බන වශයෙන් ස්වකීය රූපාවචර) කුශලයන් හා සදෘශවම උපදිත්— අරූපාවචර යනු මතු වෙයසයි.

විපාක නිමි.

——-8——

16 තිවිධානි, (ලොකුත්තර ක්‍රියාභූමි නැතිහෙයින්) ත්‍රිවිධවෙත්, ක්‍රියාපුහුදුන් සත්තවතුදු ස්වභාවයෙන් ඵලදායක නොවනහෙයින් ක්‍රියානම්වූ මේ අර්ථය ආවර්ජනවයටමැයි–ආවජ්ජනං, (ආපාතගතවූ

17 අට්ඨසහෙතුකකිරියචිත්තානි කාමාවචර කුසලසදිසානියෙව අරහතො උප්පජ්ජන්ති. කිංතු කිරියචිත්තානීති නානාකරණං, පඤ්චරූපාවචරකිරියචිත්තානි කුසලසදිසානියෙව අරහතො උප්පජ්ජන්ති, චත්තාරි අරූපාවචර කිරියචිත්තානි, කුසලසදිසානියෙව අරහතො උප්පජ්ජන්ති. ඉමානි වීසති කිරියචිත්තානි, එවං සමාසතො එකූනනවුති චිත්තානි හොන්ති.

---

රූපාදියට චිත්තසන්තති යොමුකරණ) ආවජ්ජනචිත්තය—හසිතුප්පාද චිත්තං,(අනෞදාරික වස්තුවෙහි රහත්නට සිනාඋපදනා) හසිතොත්පාදසිතය;–වොත්ථපනං, (රූපාදි ආලම්බනයන් සනිටුහන්කරණ) ව්‍යවස්ථාපන සිතය.

> “අපුබ්බාරම්මණත්තා ච සකිංදෙවපවත්තිතො,
> විසයස්සාදරහිතා සොපෙක්ඛා'වජ්ජනක්‍රියා.

අපුබ්බාරම්මණත්තාච. පූර්වචිත්තොත්පාදයක්හු විසින් නොගන්නාලද අරමුණු ඇතිහෙයින්ද; සකිංදෙව, එකවිටක; පවත්තිතො, පවත්නාහෙයින්; විසයස්සාදරහිතා, (සුදුටු) ආලම්බනරසානුභවයක් නැත්තාවූ; ආවජ්ජනක්‍රියා, පඤ්චද්වාරාවජ්ජනක්‍රියාතොමෝ, සොපෙක්ඛා, උපෙක්ෂාසහගතවන්නේයි.

> එකනිස්සයචිත්තෙන දින්නසාමත්ථියම්පි ච,
> ව්‍යාපාරන්තරසාපෙක්ඛං සොපෙක්ඛං වොත්ථපං සියා.

එකනිස්සයචිත්තෙන, සමානවස්තු නිශ්‍රිතවූ චිත්තයක්හුවිසින්; හෙවත් මනොද්වාරවීථියෙහි ආවජ්ජනයක පවත්නාකල්හි තමා හා සමාන හෘදයවස්තුනිශ්‍රිතවූ අනන්තර භවාඞ්ගචිත්තයා විසින්ද පඤ්චද්වාර වීථියෙහි ව්‍යවස්ථාපන කෘත්‍යකාලයෙහි සන්තීරණ චිත්තයාවිසින්ද; දින්නසාමත්ථියම්පිච, දෙනලද්දාවූ සාමර්ථ්‍යඇති; වොත්ථපං, ව්‍යවස්ථාපන චිත්තයතොම; ව්‍යාපාරන්තරසාපෙක්ඛං, (විපාකචිත්තසන්තානයාගේ නිෂ්පාද්‍ය ක්‍රියාවය ජවනචිත්තසන්තානයාගේ පැවැත්වීමයයන)අන්‍යක්‍රියාවක අපෙක්ෂාකරන්නේ; සොපෙක්ඛංසියා, උපෙක්ෂා සහගතවන්නේයි.

16 කිරියචිත්තානීති නානාකරණං, රහත්සන්තාන ඉපද ඵලදායක නොවන හෙයින් ක්‍රියාචිත්තය යනු නානාත්වයි.

"ලොකුත්තරක්‍රියාචිත්තං පන කස්මා න විජ්ජති,
එකචිත්තක්ඛණිකත්තා හි මග්ගස්සා ති න විජ්ජති".

ලොකුත්තරක්‍රියාචිත්තං, ලොකොත්තරවූ ක්‍රියාචිත්තයෙක්; කස්මා නවිජ්ජති, කුමක්හෙයින් නැත්දයත්?; මග්ගස්ස, මාර්ගචිත්ත යාගේ; එකචිත්තක්ඛණිකත්තා හි, එකචිත්තක්ෂණිකබව හෙයින්ම; හෙවත් නිරනුශයසන්තාන ඇති අභිත්ඵලසර්ව දෙවනුව නූපදනා හෙයින්; නවිජ්ජති, (ලොකොත්තරවූ ක්‍රියාචිත්තයෙක්) නැත්මැයි.

## ක්‍රියා නිමි.

16 එවං, මෙසේ; (උක්තප්‍රකාරයෙන්); චිත්තානි, චිත්තයෝ; සමාසතො, (අපරිමාණලොකධාතුයෙහි අනන්තසත්ත්වයන්ට උපදනාහෙයින් අනන්තවූද) සංක්ෂෙපයෙන්; එකූනනවුති, එකූනනූවෙති.

"කාමෙසු චතුපඤ්ඤාස රූපෙසු දසපඤ්චච,
ද්වාදසාරූප්පචිත්තානි අට්ඨා'නුත්තරමානසා.

කාමෙසු, කාමභවයෙහි (චිත්තයෝ); චතුපඤ්ඤාස, සූපණසෙකි; රූපෙසු, රූපභවයෙහි(චිත්තයෝ); දසපඤ්චච, පසළොසෙක; ආරූප්පචිත්තානි, අරූපාවචරචිත්තයෝ; ද්වාදස, දොළොසෙක; අනුත්තරමානසා, ලොකොත්තරචිත්තයෝ; අට්ඨ, අටදෙනෙකි.

කාමෙ තෙවීස පාකානි පුඤ්ඤා'පුඤ්ඤානි වීසති,
එකාදස ක්‍රියා චෙති චතුපඤ්ඤාස සබ්බථා.

කාමෙ, කාමභවයෙහි; තෙවීසපාකානි, විපාකචිත්තයෝ තෙවිස්සෙක; පුඤ්ඤාපුඤ්ඤානිවීසති, කුශලාකුශලචිත්තයෝ විස්සද; එකාදසක්‍රියාචෙති; එකොළොස් ක්‍රියාචිත්තයෝදැයි කියා; සබ්බථා, සර්වප්‍රකාරයෙන්; චතුපඤ්ඤාස, සූපණසෙකි.

පුඤ්ඤපාකක්‍රියාභෙදා තයො රූපෙසු පඤ්චකා,
ආරූපෙපති චතුක්කානි සත්තවීස මහග්ගතා.

රූපෙසු, රූපභවයෙහි; පුඤ්ඤපාකක්‍රියාභෙදා, කුශලවිපාක ක්‍රියාභෙදයෙන්; තයොපඤ්චකා, (කුසල්පසෙක විපාකපසෙක ක්‍රියාපසෙකැයි චිත්තයෝ) පසළොසෙක; ආරූප්පෙ, අරූපභවයෙහි; චතුක්කානි, (කුසල්සතරෙක විපාක සතරෙක ක්‍රියාසතරෙකැයි

17 තෙසු ද්වෙ ආවජ්ජනචිත්තානි, ද්වෙ දස්සනචිත්තානි, ද්වෙ සවණචිත්තානි, ද්වෙ ඝායනචිත්තානි, ද්වෙ සායනචිත්තානි, ද්වෙ ඵුසනචිත්තානි, ද්වෙ සම්පටිච්ඡනචිත්තානි, තීණි සන්තීරණචිත්තානි, එකං වොට්ඨපනං ද්වෙ ද්විට්ඨානිකානි, නව තිට්ඨානිකානි, අට්ඨ චතුට්ඨානිකානි, ද්වෙ පඤ්චට්ඨානිකානි, එකූනවීසති පටිසන්ධිචිත්තානි, එකූනවීසති භවඞ්ගචිත්තානි, එකූනවීසති චුතිචිත්තානි, එකාදස තදාරම්මණචිත්තානි, තෙරස හසනචිත්තානි.

---

චිත්තයෝ) දොළොසෙකැයි; සත්තවීස, මොහු සත්විසිදෙන; මහග්ගතා, (කාමාවචරයන්ට වඩා මහත්බවට ගියහෙයින්ම) මහග්ගත නම් වෙත්.

චතුමග්ගප්පභෙදෙන චතුධා කුසලං තථා,
පාකං තස්ස ඵලත්තාති අට්ඨධානුත්තරං මතං”.

කුසලං, ලොකොත්තර කුශලචිත්තය තෙම; චතුමග්ගප්පභෙදෙන, සතරමාර්ගයන්ගේ ප්‍රභෙදයෙන්; චතුධා, සතරවැදෑරුම්වේයයි; තස්සඵලත්තාති, චතුර්විධ මාර්ගයාගේ ඵලබව හෙයින්; පාකං, ලොකොත්තර විපාකචිත්තයද; තථා, එසේම; (චතුවිධවේතුයි), අනුත්තරං, ලොකොත්තරචිත්තය තෙම; අට්ඨධා, අටපෙරිද්දෙකින්; මතං, දත් කාලදී.

17 තෙසු, ඒ කුශලචිත්තයන් කෙරෙහි; ද්වෙ ආවජ්ජනචිත්තානි, රූපාදිවූ අරමුණට චිත්තසන්තති යොමුකරණ චිත්තයෝ දෙදෙනෙක; ද්වෙ දස්සනචිත්තානි, (නීලපීතාදි රූ) දක්නා චිත්තයෝ; ද්වෙ, දෙදෙනෙක; ද්වෙ සවණචිත්තානි, (ශබ්ද) අසනචිත්තයෝ දෙදෙනෙක; ද්වෙ ඝායනචිත්තානි, ගන්ධාඝ්‍රාණයකරණ චිත්තයෝ දෙදෙනෙක; ද්වෙ සායනචිත්තානි, රසාස්වාදකරණ චිත්තයෝ දෙදෙනෙක; ද්වෙ ඵුසනචිත්තානි, ස්ප්‍රෂ්ටව්‍යස්පර්ශකරණචිත්තයෝ දෙදෙනෙක; ද්වෙ සම්පටිච්ඡනචිත්තානි, රූපාදි පඤ්චාලම්බනයන් පිළිගණිමින් උපදනා චිත්තයෝ දෙදෙනෙක; තීණි සන්තීරණචිත්තානි, රූපාදීන් තීරණයකරණ චිත්තයෝ තුන්දෙනෙක; එකං වොට්ඨපනං, රූපාදීන් සනිටුහන් කරණ එක්සිතෙක; ද්විට්ඨානිකානි, උත්පත්තිස්ථාන ද්වයක් ඇති චිත්තයෝ; ද්වෙ, දෙදෙනෙක; තිට්ඨානිකානි, උත්පත්ති ස්ථානත්‍රයක් ඇති චිත්තයෝ; නව, නවදෙනෙක; චතුට්ඨානිකානි,

18 බත්තිංසචිත්තානි රූපං සමුට්ඨාපෙන්ති ඉරියාපථං සන්නාමෙන්ති විඤ්ඤත්තිං ජනයන්ති, ඡබ්බීසතිචිත්තානි රූපං සමුට්ඨාපෙන්ති ඉරියාපථං සන්නාමෙන්ති විඤ්ඤත්තිං න ජනයන්ති, එකූනවීසතිචිත්තානි රූපං සමුට්ඨාපෙන්ති ඉරියාපථං නසන්නාමෙන්ති විඤ්ඤත්තිං නජනයන්ති, සොළසචිත්තානි රූපං න සමුට්ඨාපෙන්ති ඉරියාපථං න සන්නාමෙන්ති විඤ්ඤත්තිං ජනයන්ති, චතුපඤ්ඤාස කාමාවචරචිත්තානි, පඤ්චදස රූපාවචරචිත්තානි, ද්වාදස අරූපාවචරචිත්තානි, අට්ඨලොකුත්තරචිත්තානි අට්ඨාරස අහෙතුකානි, ද්වෙ එකහෙතුකානි; බාවීස ද්විහෙතුකානි; සත්තචත්තාළීස තිහෙතුකානි, පඤ්චපඤ්ඤාස ජවනචිත්තානීති, තත්ථ කිරියාහෙතුක මනොධාතු පඤ්චද්වාරෙ ආවජ්ජනං කරොති, කිරියාහෙතුක මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතං මනොද්වාරෙ ආවජ්ජනං කරොති, ඉමානි ද්වෙ ආවජ්ජනචිත්තානි.

---

උත්පත්තිස්ථාන සතරක් ඇත්තාහු; අට්ඨ, අටදෙනෙක; පඤ්චට්ඨානිකානි, උත්පත්තිස්ථාන පසක් ඇත්තාහු; ද්වෙ, දෙදෙනෙක; පටිසන්ධිචිත්තානි, චුති අනතුරෙහි භවයෙන් භවය ගළපන චිත්තයෝ; එකූනවීසති, එකුන්විස්සෙක, භවඞ්ගචිත්තානි, (භවයාගේ අපරිච්ඡින්න ප්‍රවෘත්තියට හෙතුවනහෙයින්) භවාඞ්ගයයි කියනලද චිත්තයෝ; එකූනවීසති, එකුන්විස්සෙක; චුතිචිත්තානි, නිවෘත්තභවයෙන් චුතියට හෙතුවූ චිත්තයෝ; එකූනවීසති, එකුන්විස්සෙක; තදාලම්බනචිත්තානි, ජවනාලම්බනයම අරමුණුකොට ඇති චිත්තයෝ; එකාදස, එකොළොසෙක; හසනචිත්තානි, නිෂ්ඨාන හාසජනක චිත්තයෝ; තෙරස, තෙලෙසෙක.

18 බත්තිංසචිත්තානි, දෙතිස් චිත්තයොනෙක්; රූපං සමුට්ඨාපෙන්ති (ශුද්ධාෂ්ටකාදි චිත්තජ) රූප උපදවති; ඉරියාපථං සන්නාමෙන්ති, (ස්ථානනිෂද්‍යාදි) ඊර්යාපථ උපදවති; විඤ්ඤත්තිං ජනයන්ති, කායවාග්විඥප්ති උපදවති,—පෙ— විඥප්ති නූපදවති,— තත්ථ, ඒ ද්වෙ ආවජ්ජනචිත්තානි යනාදීන් තබනලද උද්දෙශයෙහි; පඤ්චද්වාරෙ, (චිත්තප්‍රවෘත්තියට මුඛවූ චක්ෂුර්ද්වාරාදි) පස්දොර; ආවජ්ජනං කරොති, රූපාදි අරමුණට සිත්සතන් යොමුකරන්නේයි; මනොද්වාරෙ, (මනොද්වාරාවර්ජනයට පූර්වගාමොත්පන්න භවාඞ්ගයයිකියනලද) මනොද්වාරයෙහි; ආවජ්ජනං කරොති, රූපාදි ෂඩාලම්බනයට

සිත්සතත් යොමුකරන්නේයි—ඉමානිමෙ, මොහු දෙදෙන; ආවජ්ජනචිත්තානි, (භවාඞ්ගානන්තරයෙහි ඉපද) ආවර්ජන කෘත්‍ය කරණ චිත්තයහ.

“චක්ඛුසොත ඝානජිව්හා කායද්වාරඤ්ච පඤ්චධා,
මනොද්වාරං භවඞ්ගන්ති ඡද්වාරා චිත්තවීථියා,

පඤ්චධා, පස්පරිද්දකින් සිටි; චක්ඛු සොත ඝාන ජිව්හා කායද්වාරඤ්ච, චක්ෂුර්ද්වාරය ශ්‍රොත්‍රද්වාරය ඝ්‍රාණද්වාරය ජිව්හාද්වාරය කායද්වාරයයන මොහු; මනොද්වාරං භවඞ්ගන්ති, මනොද්වාරවූ භවාඞ්ගයදයන; ඡ. මොහුසදෙන; චිත්තවීථියා, විඥානවීථියට; ද්වාරා, (ප්‍රවෘත්තිමුඛ හෙයින්) ද්වාරනම් වෙත්.

රූපසද්ද ගන්ධරසා ඵොට්ඨබ්බා පඤ්ච ගොචරා,
ධම්මාරම්මණමඤ්ඤන්ති ඡද්වාරාරම්මණා කමා.

රූපසද්ද ගන්ධරසා ඵොට්ඨබ්බා, රූපාලම්බනය ශබ්දාලම්බනය ගන්ධාලම්බනය රසාලම්බනය ස්ප්‍රෂ්ටව්‍යාලම්බනය යන; පඤ්ච ගොචරා, ආලම්බනයෝ පස්දෙනද; අඤ්ඤං, (මොවුන්කෙරෙන්) අන්‍යවූ; ධම්මාරම්මණං. ධර්මාලම්බනයද යන මොහු සදෙන; කමා, පිළිවෙළින්; ඡද්වාරාරම්මණ, සදොරට අරමුණු වෙත්.

සබ්බං නාමඤ්ච රූපඤ්ච හිත්වා රූපාදි පඤ්චකං,
ලක්ඛණානි ච පඤ්ඤත්ති ධම්මාරම්මණ සඞ්ඛිතං.

රූපාදිපඤ්චකං හිත්වා, රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය යන ආලම්බන පඤ්චකය හැර, සබ්බං නාමඤ්ච, (එකූනනූ සිතද දෙපනස් චෛතසික නිර්වාණවශයෙන් සිටිය) සියලු නාමයද; රූපඤ්ච, (ප්‍රසාද සූක්ෂම වශයෙන් සිටිය සියලු) රූපයද; ලක්ඛණානිච, (අනිත්‍යාදි) ලක්ෂණයෝද; පඤ්ඤත්ති, ප්‍රඥප්තියද (යන මේ සියල්ල): ධම්මාරම්මණ සඞ්ඛිතං, ධර්මාලම්බනයයි සලකනලදී.

පාරිත්තාතිපරිත්තා ච මහන්තාතිමහන්තකා,
චතුබ්බිධා භවන්තෙවං පඤ්චද්වාරික ගොචරා.

පඤ්චද්වාරික ගොචරා, පඤ්චද්වාරයට විෂයවන රූපාදි ආලම්බනයෝ පස්දෙන; පරිත්තාතිපරිත්තාච, පරිත්තාලම්බනය අති

පරිත්තාලම්බනය; මහන්තාතිමහන්තකා, මහන්තාලම්බනය අතිමහන්තාලම්බනයයි කියා; එවං, මෙසේ; චතුබ්බිධාභවන්ති, සතර වැදෑරුම් වෙත්.

> තේ'තික්කන්තා හි චිත්තානං නවපණ්ණරසක්ඛණං,
> තික්ඛණෙකක්ඛණං යන්ති පරිත්තාදිප්පභෙදතං.

චිත්තානං, චිත්තයන් සම්බන්ධිවූ; නවපණ්ණරසක්ඛණං, නවක්ෂණයක්ද පසළොස් ක්ෂණයක්ද; තික්ඛණෙකක්ඛණං, ක්ෂණත්‍රයක්ද ඒකක්ෂණයක්ද; අතික්කන්තා, ඉක්මුනාවූ; තෙ, ඒ රූපාදි පඤ්චාලම්බනයෝ; පිරිත්තාදිප්පභෙදතං යන්ති, (යථාක්‍රමයෙන්) පරිත්ත අතිපරිත්ත මහන්ත අතිමහන්ත භෙදයට යෙති;—මෙයින් පරිත්තාදි ආලම්බනයන්ගේ අවකෂ්ඨ ප්‍රමාණයම කීබැවින් මෙහි කී අවකෂ්ඨියද නොකී උත්කෂ්ඨියද ස්වරූපභෙයින් මෙසේ දතයුතු.

රූපධර්මයන් සතළොස් චිත්තක්ෂණයකට ආයු ඇති බැවින් නව චිත්තක්ෂණයක් ඉක්ම අටචිත්තක්ෂණයකට ආයු ඇතිව විෂයවූද සත්චිත්තක්ෂණයක් ඉක්ම දසචිත්තක්ෂණයකට ආයුඇතිව විෂයවූද දසචිත්තක්ෂණයක් ඉක්ම එකොළොස් චිත්තක්ෂණයකට ආයු ඇතිව විෂයවූද පස්චිත්තක්ෂණයක් ඉක්ම දොළොස් චිත්තක්ෂණයකට ආයුඇතිව විෂයවූද සතර චිත්තක්ෂණයක් ඉක්ම තෙලෙස් චිත්තක්ෂණයකට ආයුඇතිව විෂයවූද ආලම්බනය උත්කෂ්ඨයෙන් පරිත්තනම්වෙයි. පසළොස් චිත්තක්ෂණයක් ඉක්ම දෙචිත්තක්ෂණයකට ආයුඇතිව විෂයවූ අරමුණ අවකෂ්ඨයෙන් අතිපරිත්තනම්වෙයි. තුදුස් චිත්තක්ෂණයක් ඉක්ම තුන්චිත්තක්ෂණයකට ආයුඇතිව විෂයවූද තෙලෙස් චිත්තක්ෂණයක් ඉක්ම සතර චිත්තක්ෂණයකට ආයු ඇතිව විෂයවූද දොළොස් චිත්තක්ෂණයක් ඉක්ම පස් චිත්තක්ෂණයකට ආයුඇතිව විෂයවූද සචිත්තක්ෂණයක් ඉක්ම සත්චිත්තක්ෂණයකට ආයුඇතිව විෂයවූද ආලම්බනය උත්කෂ්ඨයෙන් අතිපරිත්තනම්වේ, තුන් චිත්තක්ෂණයක් ඉක්ම තුදුස් චිත්තක්ෂණයකට ආයු ඇතිව විෂයවූ ආලම්බනය අවකෂ්ඨයෙන් මහන්තනම්වේ. දෙචිත්තක්ෂණයක් ඉක්ම පසළොස් චිත්තක්ෂණයකට ආයුඇතිව විෂයවූ ආලම්බනය උත්කෂ්ඨයෙන් මහන්ත නම් වෙයි. දෙ චිත්තක්ෂණයක් ක්ම පසළොස් චිත්තක්ෂණයකට ආයුඇතිව විෂයවූ ආලම්බනය අතිමහන්ත නම් වෙයි දතයුතු.

පරිත්තෙ'තිපරිත්තෙච මහන්තෙ'තිමහන්තකෙ,
වොට්ඨපන මොඝජවන තදාරම්මණා කමා.

පරිත්තෙ, පරිත්තාලම්බනයෙහිද; අතිපරිත්තෙච, අතිපරිත්තාලම්බනයෙහිද; මහන්තෙච, මහන්තාලම්බනයෙහිද; අතිපරිත්තෙච, අතිපරිත්තාලම්බනයෙහිද; මහන්තෙච, මහන්තාලම්බනයෙහිද; අතිමහන්තකෙ, අතිමහන්තාලම්බනයෙහිද; කමා, පිළිවෙළින්; වොට්ඨපනමොඝජවන තදාරම්මණා, ව්‍යවස්ථාපනය (වීථි චිත්තයන් විසින් ශූන්‍යවූ) මොඝවාරය ජවනවාරය තදාරම්මණය යන මොහු; සියුං, වෙත්.

පරිත්තාලම්බනයෙහි ව්‍යවස්ථාපනාවසානවූ වීථිචිත්තයෝ වෙති අතිපරිත්තාලම්බනයෙහි වීථිචිත්තයන් කෙරෙහි කිසිවෙකුදු නොව භවාඞ්ගචලනමාත්‍රයෙක්මදු වෙයි. මහන්තාලම්බනයෙහි ජවනාවසානවූ චිත්තයෝ වෙති අතිමහන්තාලම්බනයෙහි තදාලම්බනාවසානවූ චිත්තයෝ වෙති යනු මෙහි අභිප්‍රායයි.

අවිභූතා විභූතා ච මනොද්වාරික ගොචරා,
භූතොතු තදාලම්බ ම විභූතෙ සියා ජවො.

මනොද්වාරිකගොචරා, මනොද්වාරයට විෂයවන ආලම්බනයෝ; අවිභූතා, අවිභූතාලම්බනය; විභූතා, විභූතාලම්බනයයි; ච, දෙදෙනෙක්; විභූතෙ, විභූතාලම්බනයෙහි; තදාලම්බං, තදාලම්බනය වෙයි; අවිභූතෙතු, අවිභූතාලම්බනයෙහි වනාහි; ජවොසියා, ජවන් වන්නේයි.

විභූතාලම්බනයෙහි ආවජ්ජන ජවන තදාලම්බනයෝ වෙති අවිභූතාලම්බනයෙහි ආවජ්ජන ජවන චිත්තයෝ වෙති යනු මෙහි අභිප්‍රායයි.

රූපාදා රම්මණෙ චක්ඛු- ප්පසාදාදීනි ඝට්ටිතෙ,
ආවජ්ජනාදයො හොන්ති භවඞ්ගච්චලාපරං.

රූපාදාරම්මණෙ, රූපාදිපඤ්චාලම්බනය; චක්ඛුප්පසාදාදීනි ඝට්ටිතෙ, චක්ෂුප්‍රසාදාදි පඤ්චප්‍රසාදයන් ගැටුනුකල්හි; භවඞ්ගච්චලාපරං, භවාඞ්ගචලනයට තින්මත්තෙහි; ආවජ්ජනාදයොහොන්ති, ආවර්ජනාදි වීථිචිත්තයෝ වේත්; කෙසේදයත්?.

ආවජ්ජන පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන තීරණා,
වොට්ඨප්පකාමජවන තදාරම්මණා කමා.
චිත්තුප්පාද සියුං පඤ්චවාරෙ ජඨෙ තු මානසා,
ආවජ්ජන සබ්බජවනා තදාරම්මණ නාමකා.

ආවජ්ජන පඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන තීරණා, පඤ්චවාරාවර්ජනය (ඉෂ්ටානිෂ්ටාලම්බනයට නිසිපරිද්දෙන්) දෙපස් විඥානයෝ ද සම්පටිච්ඡනද්වයය (ඉෂ්ටානිෂ්ට මධ්‍යස්ථ අනිෂ්ටාලම්බනයට නිසිපරිද්දෙන්) සන්තීරණත්‍රයය යන මොහු ද; වොට්ඨප්පකාමජවන තදාරම්මණා, ව්‍යවස්ථාපනය එකුන්තිස් කාමාවචර ජවනයෝ ද එකොළොස් තදාලම්බනය යන; චිත්තුප්පාද, චිත්තෝත්පාදයෝ; කමා, පිළිවෙළින්; පඤ්චවාරෙ, පස්දොරෙහි ලා; සියුං, වෙත්; ජඨෙතු, සවන මනොද්වාරයෙහි වනාහි; ආවජ්ජන සබ්බජවන තදාරම්මණ නාමකා, මනොද්වාරාවර්ජන සියලු පස්පණස් ජවන එකොළොස් තදාරම්මණ නම්වූ; මානසා, චිත්තයෝ; සියුං, වෙත්

පඤ්චවාරෙ ජවා සත්ත පරිත්තජවනම්හි වෙ,
සකිං වෙ වා තදාලම්බං සකිමාවජ්ජනාදයො.

පඤ්චවාරෙ, පස්දොර; පරිත්තජවනං, කාමාවචරජවන්; ජවා සත්තාභවෙ, සවරෙක හෝ සත්වරෙක වන්නේයි; තදාලම්බං, තදාරමුණු; සකිං වෙ, එක්වරෙක දෙවරෙක වන්නේය; ආවජ්ජනාදයො, ආවර්ජනපඤ්චවිඥාන සම්ප්‍රතීච්ඡන සන්තීරණව්‍යවස්ථාපන චිත්තයෝ; සකිං, එකෙකිවරෙකම උපදනාහුයි.

මේවනාහි මහන්ත අතිමහන්තාලම්බනයෙහි වීථි චිත්තයන්ගේ වාර නියමයයි, පරිත්තාලම්බනයෙහි ව්‍යවස්ථාපනය දෙවරෙක උපදනේයි.

කාමාවචර සත්තානං කාමාවචර ගොචරෙ,
පරිත්තජවනෙ යෙව තදාරම්මණ මුද්දිසෙ.

කාමාවචර සත්තානං, කාමාවචර භවයෙහි උපන් සත්වයන්ට; කාමාවචර ගොචරෙ, කාමාවචරවූ ආලම්බනයෙහිම; පරිත්තජවනෙ යෙව, කාමාවචර ජවනුත් මදිවූකල්හි; තදාරම්මණං, තදාලම්බනය; උද්දිසෙ, කියන්නේයි.

ඝානජිව්හාකාය වීථි තදාරම්මණමෙවච,
රූපෙනත්ථි තථාරූපෙ චක්ඛුසොතාපි වීථියො.

ඝානජිව්හා කායවීථි, ඝ්‍රාණද්වාරවීථිය ජිහ්වාද්වාරවීථිය කායද්වාර වීථිය යන මොහුද; තදාරම්මණමෙවච, තදාලම්බනයද; රූපෙනත්ථි, රූපභවයෙහි නැත; ආරූපෙප, අරූපභවයෙහි; චක්ඛුසොතාපි වීථියො, චක්ෂුඃශ්‍රොත්‍රවීථිහු දෙදෙනද; තථා, එසේම නැති.

ඡබ්බා වීථියො කාමෙ රූපෙතිසෙසා පකාසිතා,
එකා වීථිපනාරූපෙ නත්ථා'සඤ්ඤිසු කාචිපි.

කාමෙ, කාමභවයෙහි; ඡබ්බාවීථියො, ෂට්ප්‍රකාරවූ වීථිහු; පකාසිතා, ප්‍රකාශකරණලදහ; රූපෙ, රූපභවයෙහි; තිසෙසා, චක්ෂුර්ද්වාර වීථිය ශ්‍රොත්‍රද්වාරවීථිය මනොද්වාරවීථිය යන වීථිහු තුන්දෙන(ප්‍රකාශකරණ ලදහ); ආරූපෙපන, අරූපභවයෙහි වනාහි; එකාවීථි, එක මනොද්වාර වීථිතොම(ප්‍රකාශකරණලද්‍ද);අසඤ්ඤිසු, අසංඥසත්ව යන් කෙරෙහි; කාචිපිවීථි නත්ථි, කවරවීථියෙක්ද නැති.

ඡළාරම්මණා ලබ්භනති කාමාවචරභූමියං,
තීණිරූපෙ පනාරූපෙ ධම්මාරම්මණ මෙකකං.

කාමාවචර භූමියං, කාමාවචර භූමියෙහි; ඡළාරම්මණා ලබ්භනති,(රූපාදි)ෂඩාලම්බනයෝ ලැබෙත්; රූපෙ, රූපභවයෙහි; තීණි, (රූපාලම්බන ශබ්දාලම්බන ධර්මාලම්බනයයි කියනලද ආලම්බනයෝ) තුන්දෙන ලැබෙත්; ආරූපෙපන, අරූපභවයෙහි වනාහි; එකකං ධම්මාරම්මණං, එකම ධර්මාලම්බනය ලැබේ.

එකාලම්බන චිත්තානි අනභිඤ්ඤ මහග්ගතං,
අවලං පඤ්ච විඤ්ඤාණං නවපඤ්ච භවනතිමෙ.

අනභිඤ්ඤ මහග්ගතං, අභිඥ චිත්තාවයම්ස යෙසු මහග්ගත සත්විස්සය; අවලං, ලොකොත්තර අටය; පඤ්චවිඤ්ඤාණං, දෙපස් විඥනය යන; ඉංම නවපඤ්ච, මොහු පන්සාළිස්දෙන; එකාරම්මණ චිත්තානිභවනති, තමතමන්ට ප්‍රතිනියතවූ එකෙකී අරමුණක්ම විෂයකරණ හෙයින් එකාලම්බන චිත්තයෝ නම් වෙත්.

19 කුසලවිපාකං චක්ඛු විඤ්ඤාණං අකුසලවිපාකං චක්ඛු විඤ්ඤාණන්ති ඉමානි ද්වෙ දස්සන චිත්තානි, එවමෙව ද්වෙ සවණ චිත්තානි ද්වෙ ඝායනචිත්තානි ද්වෙ සායන චිත්තානි ද්වෙ ඵුසන චිත්තානීති වෙදිතබ්බානි.

---

පඤ්චාලම්බං මනොධාතු සාභිඤ්ඤං කාමධාතුජං,
සෙසං ඡාරම්මණං තංහි තෙචත්තාළීස සබ්බතො.

මනොධාතු, ත්‍රිවිධ මනොධාතු තොමෝ; පඤ්චාලම්බං, (පඤ්චද්වාරයට විෂයවූ රූපාදි පඤ්චාලම්බනය විෂයකරණ හෙයින්) පඤ්චාලම්බනය; සාභිඤ්ඤං, අභිඥාචිත්තය හා සහිතවූ; සෙසංකාමධාතුජං, පඤ්චවිඥාන මනොධාතුත්‍රයින් අන්‍යවූ එක්සාළිස් කාමාවචරචිත්තය; ඡාරම්මණං, ෂඩාලම්බනිකයි; තංහි, ඒ ෂඩාලම්බනීය වන්හි; සබ්බතො, ගණන්හෙයින්; තෙචත්තාළීස, (අභිඥාචිත්තද්වය කාමාවචර එක්සාළිසයයි) තෙසාළිසෙකි.

කාම පාකරූසා චාදි මග්ගො චාදි ක්‍රියා දුවෙ,
රූපෙ සබ්බෙති 'රූපෙ න ඡ්චත්තාළීස හොන්ති මෙ

කාම්පාකරූසාච, තෙවිසි කාමාවචර විපාකයෝය ප්‍රතිඝද්වයය යන මොහුද; ආදි මග්ගාච, ප්‍රථමමාර්ගයද; ආදි ක්‍රියාදුවෙ, (පඤ්චද්වාරාවර්ජන හසිතොත්පාදන) ප්‍රථම ක්‍රියාවෝ දෙදෙනද; රූපෙසබ්බෙති, රූපභවයෙහි සියලු චිත්තයෝද යන; ඉමෙතිචත්තාළීස, මොහු තෙසාළිස්දෙන; අරූපෙ, අරූපභවයෙහි; නහොන්ති, නොවෙත්.

විනා ච රූපෙනාරූප්පා විපාකා චතුරො සියුං,
ඡචත්තාළීස සෙසානි චත්තානුභයථාපි ච".

චතුරොආරූප්ප විපාකා, අරූපාවචර විපාකයෝ සතරදෙන; රූපෙනවිනාච, රූපමිශ්‍රභව වෙන්වම; සියුං, වන්නාහ; හෙවත් අරූපභවයෙහිම උපදනාහ; සෙසානිඡචත්තාළීස, කාමාවචර කුශලයෝ අටදෙනය අකුශලයෝ දසදෙනය කාමාවචර ක්‍රියාවෝ නව දෙනය අරූපාවචරකුශල ක්‍රියාවෝ අටදෙනය ලොකුත්තරයෝ සත්දෙනය යන දෙසාළිස් චිත්තයෝ; උභයථාපිච වත්තන්ති, (රූපමිශ්‍රභවයෙහිද අරූපභවයෙහිද උපදනා හෙයින්) දෙපර්ද්දෙන් පවතිත්.

20 කුසලවිපාකාහෙතුක මනොධාතු උපෙක්ඛාසහගතං සම්පටිච්ඡනචිත්තං අකුසලවිපාකා හෙතුක මනොධාතු උපෙක්ඛාසහගතං සම්පටිච්ඡන චිත්තඤ්චාති ඉමානිද්වෙපි සම්පටිච්ඡන චිත්තානි, කුසලවිපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතං සන්තීරණං කුසලවිපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතං සන්තීරණං අකුසලවිපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතං සන්තීරණන්ති ඉමානි තීණි සන්තීරණ චිත්තානි කිරියාහෙතුක මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතං ඉදමෙකං වොට්ඨපනචිත්තං පඤ්චද්වාරෙ වොට්ඨපනං මනොද්වාරෙ ආවජ්ජනඤ්චකරොති, කුසලවිපාකා හෙතුක මනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතං පඤ්චද්වාරෙ සන්තීරණං ඡද්වාරෙ තදාරම්මණඤ්ච කරොති, ඉමානි ද්වෙ ද්විට්ඨානිකානි. පඤ්චරූපාවචර විපාකචිත්තානි චත්තාරි අරූපාවචර විපාකචිත්තානි බ්‍රහ්මලොකෙ පටිසන්ධි භවඞ්ගං චුතිච හොන්ති, ඉමානි නවතිට්ඨානිකානි. අට්ඨකාමාවචර මහාවිපාකචිත්තානි දෙවමනුස්සෙසු පටිසන්ධි භවඞ්ගං ඡද්වාරෙ තදාරම්මණං චුතිච හොන්ති, ඉමානි අට්ඨචතුට්ඨානිකානි. කුසලවිපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතං මනුස්සෙසු ජච්චන්ධ ජාතිබධිරාදීනං පටිසන්ධි භවඞ්ගං පඤ්චද්වාරෙ සන්තීරණං ඡද්වාරෙ තදාරම්මණං චුති ච හොති, අකුසලවිපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛා සහගතං චතුසු අපායෙසු පටිසන්ධි භවඞ්ගං පඤ්චද්වාරෙ සන්තීරණං ඡද්වාරෙ තදාරම්මණං චුති ච හොති, ඉමානි ද්වෙ පඤ්චට්ඨානිකානි. අට්ඨකාමාවචර විපාකචිත්තානි ද්වෙ උපෙක්ඛාසහගත විපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතුයො ච කාමාවචරෙ කම්මං වා කම්මනිමිත්තං වා ගතිනිමිත්තං වා ගහෙත්වා පටිසන්ධි හොන්ති, පඤ්චරූපාවචර විපාකචිත්තානි චත්තාරි අරූපාවචර විපාකචිත්තානි යස්ස යස්ස කුසලස්ස ඣානස්ස යං යං ආරම්මණං තං තං ආරම්මණං ගහෙත්වා බ්‍රහ්මලොකෙ පටිසන්ධි හොන්ති, ඉමානි එකූනවීසති පටිසන්ධිචිත්තානි හොන්ති. එතානියෙව පවත්තික්ඛණෙ භවඞ්ගානි චුතික්ඛණෙ චුතිච හොන්ති.

19 ඉමානිමෙ, මොහු දෙදෙන; දස්සන චිත්තානි, ආවජ්ජනානන්තරයෙහි ඉපද රූපදර්ශනයකරණ චිත්තයහ; මෙසවණ චිත්තානි, ආවජ්ජනා නන්තරයෙහි ඉපද ශබ්දශ්‍රවණ කෘත්‍යයකරණ චිත්තයෝ දෙදෙනාය, ඝායන චිත්තානි, ආවජ්ජනානන්තරයෙහි ඉපද ගන්ධා

ඝ්‍රාණයකරණ චිත්තයෝ දෙදෙනෙක; මෙසායතනචිත්තානි, ආවජ්ජනානන්තරව ඉපද රසාස්වාදනකරණ චිත්තයෝ දෙදෙනාද; මෙඵුසන චිත්තානි; ආවජ්ජනානන්තරව ඉපද ස්ප්‍රෂ්ටව්‍ය ස්පර්ශකරණ චිත්තයෝ දෙදෙනාද; එවමෙව, මෙසේම (කුශලවිපාකවශයෙන්); වෙදිතබ්බානි, දතයුත්තාහුයි. 20 සම්පටිච්ඡනචිත්තානි, චක්ඛුවිඤ්ඤාණානන්තරයෙහි ඉපද ආලම්බන ප්‍රතිග්‍රහණ කෘත්‍යකරණ චිත්තයහ; සන්තීරණචිත්තානි, සම්පටිච්ඡනානන්තරයෙහි ඉපද රූපාදීන් තීරණයකරණ චිත්තයහ;— ඉදමෙකං වොට්ඨපනං, සන්තීරණානන්තරයෙහි ඉපද රූපාදීන් සනිටුහන් කෘත්‍යකරණ එකම ව්‍යවස්ථාපනසිතය; තදාරම්මණද්ව කරොති, (ජවනානන්තරයෙහි) තදාලම්බනකෘත්‍යය කෙරෙයි— යන මේ නවමහග්ගත විපාකචිත්තයෝ ප්‍රතිසන්ධිච්‍යුතිඅනන්තරයෙහි ප්‍රතිසන්ධිවද භවාඞ්ගප්‍රතිසන්ධියෙන්මතෙනසි භවාඞ්ගවද—චුති ච හොනති, අන්තයෙහි ච්‍යුතිවදවෙත්,—කම්මංවා, (බාරත්‍රයෙහි පැවති කුශලා කුශල) කර්මයක්හෝ; කම්මනිමිත්තංවා, (කුශලා කුශලයට කාරණවූ යාගුභත්තාසරචාපාදී) කර්මනිමිත්තක්හෝ; ගතිනිමිත්තංවා, (ඉපැද්දයුතු සුගති දුර්ගති භවයේ පැනෙන මාතෘකුක්ෂි කල්පවෘක්ෂ වග්නිපවාලාදිගති චර්ණයයි කියන ලද) ගතිනිමිත්තක්හෝ;: ගහෙත්වා,. (ආලම්බනකරණ වශයෙන්) ගෙන,— යස්ස යස්ස කුසලස්ස ඣානස්ස, (ප්‍රථමධ්‍යානාදී) යම් යම් කුශලධ්‍යානයකට; යං යං ආරම්මණං, පඨවිකසිණාදී යම් යම් අරමුණෙක්ද; තං තං ආරම්මණං, ඒ ඒ අරමුණ; ගහෙත්වා, ගෙන; බ්‍රහ්මලොකෙ, (ඒ ඒ ධ්‍යානවිපාකයෙන් ඉපැද්දයුතු ඒ ඒ) බ්‍රහ්මලොකයෙහි— එතානිසෙව, මොහුම;. පවත්තික්ඛණෙ, ප්‍රතිසන්ධියහා චුති දෙදෙනාඅතුරෙහි; භවඞ්ගානි, සදුරවීපි සමාරයක් නැතිසද භවාඞ්ගවද්දන්, චුතික්ඛණෙ, (අන්තයෙහි) ච්‍යුතික්ෂණයෙහි; චුතිචහොන්ති; (ජවන්තදාලම්බන භවාඞ්ගයන් අතුරෙන් එක්තරා ඉක්බිතිව) ච්‍යුතිදවෙත්.

"කම්මං කම්මනිමිත්තංච තථා ගතිනිමිත්තකං,
ඉදං හි තිවිධං තෙසං මාරම්මණ මුදීරිතං,

කම්මං, (බාරත්‍රයෙහි සිඩවූ) කුශලා කුශල කර්මයද; කම්මනිමිත්තංච, කුශලා කුශල කර්මයට නිමිත්තවූ යාගුභත්ත සරචාපාදියද; තථා, එසේම; ගතිනිමිත්තකං, (ඉපැද්දයුතු සුගති දුර්ගතියෙහි

21 අට්ඨකාමාවචරවිපාකචිත්තානි තිස්සොවිපාකාහෙතුකමනොවිඤ්ඤාණධාතුයො ච ජවනචිත්තානමනන්තරා තදාරම්මණානි හුත්වා කාමාවචර සත්තානමෙව ජායන්ති, ඉමානි එකාදස තදාරම්මණචිත්තානි. කාමාවචරකුසලානි චත්තාරි සොමනස්ස සහගතානි අකුසලානි චත්තාරි සොමනස්සසහගතානි පඤ්චකිරිය චිත්තානි සොමනස්සසහගතානීති ඉමානි තෙරස හසනචිත්තානි, තෙසු පුථුජ්ජනානං අට්ඨසු කුසලාකුසලෙසු හසනං උප්පජ්ජති, සෙඛානං ච දිට්ඨිගතානි අපනෙත්වා ඡසු හසනං උප්පජ්ජති, අරහන්තානං පන පඤ්චසු කිරියචිත්තෙසු හසනං උප්පජ්ජති.

අට්ඨකාමාවචර කුසලචිත්තානි ද්වාදසඅකුසලචිත්තානි දස කිරියචිත්තානි ඛීණාසවස්ස අභිඤ්ඤාචිත්තං සෙඛපුථුජ්ජනානං අභිඤ්ඤාචිත්තඤ්චාති ඉමානි ද්වත්තිංස චිත්තානි රූපං සමුට්ඨාපෙන්ති ඉරියාපථං සන්නාමෙන්ති විඤ්ඤත්තිං ජනයන්ති. පඤ්ච රූපාවචරකුසලානි පඤ්ච කිරියචිත්තානි චත්තාරි අරූපාවචර කුසලානි චත්තාරි කිරියානි චත්තාරි මග්ගචිත්තානි චත්තාරි ඵලචිත්තානීති ඉමානි ඡබ්බීසතිචිත්තානි රූපං සමුට්ඨාපෙන්ති ඉරියාපථං සන්නාමෙන්ති විඤ්ඤත්තිං න ජනයන්ති, එකාදස කාමාවචර කුසල විපාකානි ද්වෙඅකුසලවිපාකානි කිරියා හෙතුකමනොධාතු ආවජ්ජනං පඤ්චරූපාවචර විපාකචිත්තානීති ඉමානි එකූනවීසති චිත්තානි රූපංසමුට්ඨාපෙන්ති ඉරියාපථං න සන්නාමෙන්ති විඤ්ඤත්තිං න ජනයන්ති.

---

මාතෘකුක්ෂිඋද්‍යාන විමාන වහ්නිජ්වාලාදි ගති වර්ණ සංඛ්‍යාතවූ) ගති නිමිත්තයද යන; ඉදංතිවිධං, මේ ත්‍රිවිධවූ නිමිත්තය; තෙසං, ඒ ප්‍රතිසන්ධිචිත්තයන්ට; ආරම්මණ මුදීරිතං, ආලම්බනයයි කියනලදී.

කාමාවචර සන්ධීනං පරිත්තාරම්මණං මතං,
පච්චුප්පන්න මතීතං වා නත්ථිකිඤ්චි දනාගතං,

කාමාවචර සන්ධීනං, කාමාවචර ප්‍රතිසන්ධීන්ට; පච්චුප්පන්නං අතීතංවා, වර්තමානවූ හෝ අතීතවූ හෝ; පරිත්තාරම්මණං, කාමාවචර ආලම්බනය; මතං, (අරමුණුවන්නේයයි) දත්තාලදී; අනාගතං කිඤ්චි, (උත් විෂයවන) අනාගතවූ කිසි අරමුණෙක්; නත්ථි, නැති.

කුසලාකුසල විපාකානි විපඤ්ච විඤ්ඤාණානි චත්තාරි අරූ
පාවචර විපාකානි ඛීණාසවස්ස චුතිචිත්තං සබ්බසත්තානං පටිසන්ධි
චිත්තඤ්චාති ඉමානි සොළස චිත්තානි රූපං න සමුට්ඨාපෙන්ති
ඉරියාපථං හසනන්තාමේතානි විඤ්ඤත්තිං න ජනයන්ති. අට්ඨකාමා
වචර කුසලානි ද්වාදසඅකුසලානි අට්ඨ මහාවිපාකානි අට්ඨපරිත්ත
කුසලවිපාකානි සත්තඅකුසලවිපාකානි අට්ඨමහාකිරියානි තිණි ප
රිත්තකිරියානීති ඉමානිචතුපඤ්ඤාස කාමාවචර චිත්තානි. පඤ්ච
රූපාවචරකුසලානි පඤ්චවිපාකානි පඤ්චකිරියානීති ඉමානි පඤ්ච
දස රූපාවචරචිත්තානි. චත්තාරිඅරූපාවචර කුසලානි චත්තාරිවිපා
කානි චත්තාරිකිරියානීති ඉමානි ද්වාදස අරූපාවචරචිත්තානි. ච
ත්තාරිමග්ගචිත්තානි චත්තාරි ඵල චිත්තානීති ඉමානිඅට්ඨ ලොකු
ත්තරචිත්තානි ද්විපඤ්චවිඤ්ඤාණානි තිසෙසා මනොධාතුයො පඤ්ච
අහෙතුක මනොවිඤ්ඤාණධාතුයොචාති ඉමානිඅට්ඨාරස අහෙතුක
චිත්තානි. විචිකිච්ඡාසහගතමෙකං උද්ධච්චසහගත මෙකන්ති ඉමා
නි ද්වෙ එකහෙතුකානි, ද්වෙ දොසමොහ හෙතුකානි අට්ඨ ලොභමො
හ හෙතුකානි ද්වාදස ලොභදොස හෙතුකානීති ඉමානිද්වාවීසති දු
හෙතුකානි. තිහෙතුකානි සෙසානි සත්තචත්තාලීසචිත්තානි. කු
සලාකුසලානි තෙත්තිංස චත්තාරිලොකුත්තරවිපාකානි ආවජ්ජ
නං වොට්ඨපනඤ්ච වජ්ජෙත්වා සෙසානි අට්ඨාරස කිරියචිත්තා
නීති ඉමානිපඤ්චපඤ්ඤාස ජවනචිත්තානීති.

**පකිණ්ණකං නිට්ඨිතං**

—0—

22 කතමෙ ධම්මාකුසලා? යස්මිංසමයෙ කාමාවචරං කුසලං
චිත්තං උප්පන්නං හොති සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං
අසඞ්ඛාරිකං රූපාරම්මණංවා සද්දාරම්මණංවා ගන්ධාරම්මණංවා
රසාරම්මණංවා ඵොට්ඨබ්බාරම්මණංවා ධම්මාරම්මණංවා යංයං වා
පනාරබ්භ,

---

21 ඉ. හසනං උප්පජ්ජති, සිනාඋපදී- හසන නම් ජවනසොම
නස්සයන් තුෂ්ටිප්‍රාප්තවූ මුඛසොභාවයි.

පකිණ්ණකං.

—૪—

22 කතමෙ ධම්මා කුසලා, අනවද්‍යසුඛ විපාකධර්මයෝ කවරයන
යස්මිං සමයෙ සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරි
කං කාමාවචරං කුසලං චිත්තං රූපාරම්මණං වා —පෙ— යංයංවා
පනාරබ්භ උප්පන්නං හොති තස්මිං සමයෙ ඵස්සො හොති—පෙ—
අවික්ඛෙපො හොතියනු සම්බන්ධයි". යස්මිං සමයෙ,යම්සමයෙක්හි-

"සමවායො ඛණො කාලො සමූහො හෙතු එව ච,
එතෙ පඤ්චපි විඤ්ඤෙය්‍යා සමයා ඉධ විඤ්ඤුනා.

සමවායො, සාමග්‍රියද; ඛණො, ක්‍ෂණයද; කාලො, කාලයද; සමූහො, රාශියද; හෙතුඑවච, ප්‍රත්‍යයදයයි, එතෙපඤ්චපි, මොහුපස් දෙනම; ඉධ, මේ 'යස්මිංසමයෙ'යනාදි පාළියෙහි; සමයා, සමයශබ්ද වාච්‍යයහයි; විඤ්ඤුනා, නුවණැත්තහු විසින්; ඤෙය්‍යා, දතයුත්තාහුයි.

තෙසු පච්චයසාමග්ගි සමවායො ඛණො පන,
එකොව නවමො ඤෙය්‍යො චක්කානි චතුරොපිවා.

තෙසු, ඒපඤ්චප්‍රකාර සමයාර්ථයන් අතුරෙහි පච්චයසාමග්ගි, (චාරාලම්බනාදීන් අතුරෙහිවූ) ප්‍රත්‍යයන්ගේ සමාගමයතෙමේ; සමවායො, සමවායනම්වෙයි; නවමො, (අෂ්ටක්‍ෂණයට) නවවනුවූ; එකොවඛණොපන, එකම්බුද්ධොත්පාදක්‍ෂණයවනාහි; ඛණොඤෙය්‍යො, ක්‍ෂණයයි දතයුත්තේය; චක්කානිචතුරොපිවා (සත්පුරුෂසංසෙවා සද්ධර්මශ්‍රවණ යොනිසො මනසිකාර ආත්මසම්‍යක් ප්‍රණිධියයි කියනලද; සම්පත්ති) චක්‍රයෝ සතරදෙනාහෝ (ක්‍ෂණයයි දතයුත්තාහුයි).

තංතං උපාදපඤ්ඤත්තො කාලො වොහාර මත්තකො,
පුඤ්ජො ඵස්සාදි ධම්මානං සමූහො ති විභාවිතො.

තංතංඋපාදපඤ්ඤත්තො, (චන්ද්‍රසූර්‍ය්‍යපරිවර්තනාදි) ඒඒක්‍රියාවන්නිසා පණවනලදාවූ වොහාරමත්තකො, (රාත්‍රිදිවාදි) ව්‍යවහාරමාත්‍රය; කාලො, කාලනම්වෙයි; ඵස්සාදිධම්මානං, (එක්වඋපදනාවූ) ස්පර්ශාදිධර්මයන්ගේ; පුඤ්ජො, රාශිය; සමූහොති, සමූහයයි, විභාවිතො, ප්‍රකාශකරණලදී.

හෙතූති පච්චයො චෙත්‍ථ තස්ස චාර වසෙනවා,
අනෙකභාවො විඤ්ඤෙය්‍යො පච්චයානං වසෙන වා".

එත්‍ථ, මෙහිලා; හෙතූති, හෙතුයයි; පච්චයොච, ප්‍රත්‍යයම (කීයනුලැබේ); තස්ස, ඒඒ ප්‍රත්‍යයාගේ, චාරවසෙනවා, චක්‍ෂුරාදි චාරවශයෙන්හෝ; පච්චයානංවසෙනවා, (පට්ඨානයෙහිකියනලද හෙත්වාලම්බනාදි) ප්‍රත්‍යයන්ගේ වශයෙන් හෝ; අනෙකභාවො, අනෙකත්වය; විඤ්ඤෙය්‍යො, දතයුතුයි.

රූපාරම්මණංවා, (නීලපීතාදි) රූපාලම්බනයක් හෝ; සද්දාරම්මණංවා, (ශඞ්ඛමෘදඞ්ගාදි) ශබ්දාලම්බනයක් හෝ; ගන්ධාරම්මණංවා, (මූලගන්ධාදි) ගන්ධාලම්බනයක් හෝ, රසාරම්මණංවා, (ඵාණිත ලවණාම්ලාදි) රසාලම්බනයක් හෝ; ඵොට්ඨබ්බාරම්මණංවා, (අබ්ධාතුවර්ජිත භූතත්‍රය සඞ්ඛ්‍යාත) ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයක් හෝ; ධම්මාරම්මණංවා, (රූපාදිය සහැර සියලු රූප චිත්තචෛතසික නිර්වාණ ප්‍රඥප්ති සඞ්ඛ්‍යාත) ධර්මාලම්බනයක් හෝ.

රූපං සද්දො රසො ගන්ධො ඵොට්ඨබ්බං ධම්මමෙවච,
ඡධා ආරම්මණං ආහු ඡළාරම්මණකොවිදා.

රූපං, රූපාලම්බනයද; සද්දො, ශබ්දාලම්බනයද; රසො, රසාලම්බනයද; ගන්ධො, ගන්ධාලම්බනයද; ඵොට්ඨබ්බං, ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයද; ධම්මමෙවච, ධර්මාලම්බනයයිකියා; ඡළාරම්මණකොවිදා, ෂඩාලම්බනය දන්නාහු; ආරම්මණං, ආලම්බනය; ඡධාආහු, සපරිද්දකින් කීහු.

තත්ථ භූතෙ උපාදය වණ්ණො චතුසමුට්ඨිතො,
සනිදස්සන සප්පටිඝො රූපාරම්මණ සඤ්ඤිතො.

තත්ථ ඒ ෂඩාලම්බනයන් අතුරෙහි; භූතෙ උපාදය, සතරමහාභූතයන් නිසා පවත්නාවූ; චතුසමුට්ඨිතො, කර්මචිත්ත ඍතුආහාරයන සතර ප්‍රත්‍යයෙන් උපන්නාවූ; සනිදස්සන සප්පටිඝො, (දෘෂ්ටව්‍යවහාරයයි කියනලද නිදර්ශනය හා සමග පවත්නා හෙයින්) සනිදර්ශිතවූ (ප්‍රසාදාභිමුඛ භාවයයි කියනලද ප්‍රතිඝාතනය හා සමග පවත්නා හෙයින්) සප්‍රතිඝවූ; වණ්ණො, වර්ණයතෙම; රූපාරම්මණ සඤ්ඤිතො, රූපාරම්මණයයි කියනලදී.

දුවිධොති සමුද්දිට්ඨො සද්දො චිත්තොතුසම්භවො,
සවිඤ්ඤත්තික සද්දොව හොති චිත්තසමුට්ඨිතො.

චිත්තොතුසම්භවො, චිත්ත ඍතුදෙකින් උපන්නාවූ; සද්දො, ශබ්දයතෙම; දුවිධොති, (ජනක භෙදයෙන්) ද්විප්‍රකාරයයි; සමුද්දිට්ඨො, දක්වනලදී; සවිඤ්ඤත්තිකසද්දොව, වචීවිඤ්ඤත්ති සහිත වූම ශබ්දය; චිත්තසමුට්ඨිතො හොති, චිත්තජ නම්වෙයි.

අවිඤ්ඤත්තික සද්දො යො සො හොති උතුසමුට්ඨිතො,
දුවිධොපි අයං සද්දො සද්දාරම්මණතං ගතො.

අවිසඤ්ඤතන්තික සද්දයො, විසඤ්ඤතානිරහිතවූ යම්ශබ්දයෙක් ඇද්දෑ සො, ඒ ශබ්දයතෙම; උතුසමුට්ඨිතොහොති, සෘතුජවෙයි, ද්‍රවිඩොපි, විප්‍රකාරවූ; අයංසද්දො, මේශබ්දයතෙම; සද්දාරම්මණතං, ශබ්දාලම්බනභාවයට; ගතො, ගියේයි.

ධරීයතීති ගච්ඡන්තො ගන්ධො සූචනතොපිවා,
අයං චතුසමුට්ඨානො ගන්ධාරම්මණ සම්මතො,

ගච්ඡන්තො, යන්නේ; ධරීයතීති, (ගන්ධාදිවශයෙන්) දරනු ලැබේනුයි; සූචනතොපිවා, (තමාටනිශ්‍රයවූ පුෂ්පාදිවස්තුව) ප්‍රකාශ කරණ හෙයින්හෝ; ගන්ධො, ගන්ධනම්වෙයි; චතුසමුට්ඨානො, (කර්මාදි) සතරින් උපදනා; අයං, මේගන්ධයතෙම; ගන්ධාරම්මණසම්මතො, ගන්ධාලම්බනයයි දන්නාලදී.

රම්මාන්තා රසන්තීති රසොති පරිකිත්තිතො,
රසො චතුසමුට්ඨානො රසාරම්මණ නාමකො.

රම්මන්තා, ඇලෙන්නාහු; රසන්තීති, ආස්වාදකෙරෙත්නුයි; රසොති, රසයයි; පරිකිත්තිතො, කියනලද්දී, චතුසමුට්ඨානො, චතුජවූරසයතෙම; රසාරම්මණනාමකො, රසාලම්බනනම්.

ඵුසීයතීති ඵොට්ඨබ්බං පඨවීතෙජවායවො,
ඵොට්ඨබ්බං චතුසම්භූතං ඵොට්ඨබ්බාරම්මණං මතං,

ඵුසියතීති, ස්පර්ශකරනුලැබේනුයි; ඵොට්ඨබ්බං, ස්ප්‍රෂ්ටව්‍යනම් වෙයි; (ශේකවරහයන්) පඨවීතෙජවායවො, පෘථිවීධාතුය තෙජොධාතුය වායොධාතුය (යන මොහුනුත් දෙනය); චතුසම්භූතං, චතුජවූ; ඵොට්ඨබ්බං, ස්ප්‍රෂ්ටව්‍යතෙම; ඵොට්ඨබ්බාරම්මණං, ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයයි, මතං, දන්නාලදී.

සබ්බං නාමඤ්ච රූපඤ්ච හිත්වා රූපාදි පඤ්චකං,
ලක්ඛණානිච පඤ්ඤත්ති ධම්මාරම්මණ සඤ්ඤිතං

යංයංවාපනාරබ්භ, (හුදෙක් රූපාදිපිළිවෙළින්ම නොව මොවුන් කෙරෙන්) යමක් යමක්හෝ අරමුණුකොට, උප්පන්නංහොයී, උත්පාදදික්ෂණත්‍රයගතව වර්තමානවූද.

මේගාථාව පූජ්යෙයි ව්‍යාඛ්‍යාතයි.

23 තස්මිංසමයෙ ඵස්සො හොති වෙදනාහොති සඤ්ඤා හොති චෙතනා හොති චිත්තං හොති- ඵස්ස පඤ්චකරාසි--විතක්කො හොති විචාරො හොති පීති හොති සුඛං හොති චිත්තස්සෙකග්ගතාහොති-- ඣානපඤ්චකරාසි--සද්ධින්ද්‍රියං හොති විරියින්ද්‍රියං හොති සතින්ද්‍රියං හොති සමාධින්ද්‍රියං හොති පඤ්ඤින්ද්‍රියං හොති මනින්ද්‍රියං හොති සොමනස්සින්ද්‍රියං හොති ජීවිතින්ද්‍රියං හොති- ඉන්ද්‍රියට්ඨකරාසි--සම්මාදිට්ඨි හොති සම්මාසඞ්කප්පො හොති සම්මාවායාමො හොති සම්මාසති හොති සම්මාසමාධි හොති--මග්ගපඤ්චකරාසි--සද්ධාබලං හොති විරියබලං හොති සතිබලං හොති සමාධිබලං හොති පඤ්ඤාබලං හොති හිරිබලං හොති ඔත්තප්පබලං හොති-- බලසත්තකරාසි--අලොභො හොති අදොසො හොති අමොහො හොති--හෙතු

---

තස්මිං සමයෙ, ඒ ක්ෂණයෙහි, ඵස්සොහොති, (භිත්තිස්පර්ශ කරණ හිරුරශ්මියක්මෙන් ආලම්බනස්පර්ශකරණ) ස්පර්ශය වෙයි; වෙදනා හොති, (රජසුව වළඳන රජකුනුමෙන් අරමුණු රස වළඳන) වෙදනාවවෙයි; සඤ්ඤාහොති, (වඩු ආදීන් දැව ආදියෙහි සල කුණු කිරීමක්මෙන් අරමුණු හඳුනන ආකාරයෙන් පවත්නා) සංඥාව වෙයි; චෙතනා හොති, (ප්‍රධාන ශිෂ්‍යයාමෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් ස්වකීය කෘත්‍යයෙහි යොදන) චෙතනාව වෙයි; චිත්තං හොති, (විෂය විජානනයකරණ) චිත්තයවෙයි;- විතක්කොහොති, (නගරවාසීනු රජගෙට නැග අමාත්‍යයාමෙන් සම්ප්‍රයුක්තධර්මයන් අරමුණට පමුණුවන) විතර්කයවෙයි; විචාරොහොති, (රජහු මුහුණු හැඳිනී නගරවාසීහු රජගෙයි හැසිරීමක්මෙන් අරමුණෙහි අනුමජ්ජනය කරණ) විචාරයවෙයි; පීතිහොති, (ද්‍රව්‍යප්‍රතිලාභයෙහි දුගියකුමෙන් ආලම්බන ප්‍රතිලාභයෙහි පීනනයකරණ) ප්‍රීතියවෙයි; සුඛංහොති, (ප්‍රතිලබ්ධාලම්බනයෙහි රසාස්වාදයකරණ) සුඛයවෙයි; චිත්තස්සෙකග්ගතාහොති. (නිර්වාතස්ථානයෙහි දිලියෙන ප්‍රදීපයක්මෙන් වික්ෂෙප රහිත අරමුණෙහි පවත්නා) චිත්තෛකාග්‍රතාව වෙයි-ධ්‍යාන පඤ්චකයයි ස්පර්ශදෙන් දතයුතු-

සද්ධින්ද්‍රියං හොති, (උදකප්‍රසාද මාණික්‍යයක්මෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් ප්‍රසන්න කිරීමෙහි ආධිපත්‍යකරණ) සද්ධින්ද්‍රියවෙයි;

තාතිකරාසි—අනභිජ්ඣා හොති අබ්‍යාපාදො හොති සම්මාදිට්ඨි හොති—කම්මපථනිකරාසි— හිරි හොති ඔත්තප්පං හොති— ලොකපාලදුකරාසි— කායපස්සද්ධි හොති චිත්තපස්සද්ධි හොති, කායලහුතා හොති චිත්තලහුතා හොති, කායමුදුතා හොති චිත්තමුදුතා හොති කායකම්මඤ්ඤතා හොති චිත්තකම්මඤ්ඤතා හොති, කායපාගුඤ්ඤතා හොති චිත්තපාගුඤ්ඤතා හොති, කායුජ්ජුකතා හොති චිත්තුජ්ජු

---

විරියින්ද්‍රියං හොති, (භාරොවහනයෙහි ධුර වෘෂභයාමෙන් කුශලධර්‍මයන්ට ප්‍රයොගකිරීමෙහි ආධිපත්‍යකරණ) වීර්‍යින්ද්‍රියවෙයි; සතින්ද්‍රියං හොති, (ප්‍රගුණග්‍රන්ථයක්මෙන් ආලම්බන ස්මරණයෙහි ආධිපත්‍යකරණ) සතින්ද්‍රියවෙයි; සමාධින්ද්‍රියං හොති, (අවික්ෂෙපභාවයෙහි ආධිපත්‍යකරණ) සමාධින්ද්‍රියවෙයි; පඤ්ඤින්ද්‍රියං හොති, (යථාස්වභාව ප්‍රතිවෙධයෙහි ආධිපත්‍යකරණ) ප්‍රඥෙන්ද්‍රියවෙයි; මනින්ද්‍රියං හොති, (විෂය විජානනයෙහි මෙන් ආධිපත්‍ය කරණ)මනින්ද්‍රිය වෙයි; සොමනස්සින්ද්‍රියං හොති, (ඉෂ්ටානුභවයෙහි ආධිපත්‍යකරණ) සෞමනස්සින්ද්‍රියවෙයි; ජීවිතින්ද්‍රියං හොති, (උත්පලාදියට ජලයක්මෙන් සහජාත අරූපධර්‍ම පරිපාලනයෙහි ආධිපත්‍යකරණ) ජීවිතින්ද්‍රියවෙයි;—සම්මාදිට්ඨි හොති, (යථාස්වභාව ප්‍රතිවෙධකරවූ) සම්‍යග්දෘෂ්ටියවෙයි; සම්මාසඞ්කප්පො හොති, (මනාකොට ආලම්බනාභිරොපණය කරණ)සම්‍යක්සඞ්කල්පය වෙයි; සම්මාවායාමො හොති, (කුශලධර්‍මයට මනාකොට ප්‍රයොගකරණ) සම්‍යග්ව්‍යායාමයවෙයි; සම්මාසති හොති, (මනාකොට ආලම්බන ස්මරණයකරණ) සම්‍යක් ස්මෘතියවෙයි; සම්මාසමාධි හොති, (ආලම්බනයෙහි මනාකොට සමාධානයකරණ)සම්‍යක්සමාධියවෙයි;—සද්ධාබලං හොති, (අශ්‍රද්ධායෙන් අකම්ප්‍යවූ) ශ්‍රද්ධාබලයවෙයි; විරියබලං හොති, (කෞසීද්‍යයෙන් අකම්ප්‍යවූ) වීර්‍යබලයවෙයි; සතිබලං හොති, (මොෂ්‍යයෙන* අකම්ප්‍යවූ) ස්මෘතිබලයවෙයි; සමාධිබලං හොති, (ඖද්ධත්‍යයෙන් අකම්ප්‍යවූ) සමාධිබලයවෙයි; පඤ්ඤාබලං හොති, (අවිද්‍යායෙන් අකම්ප්‍යවූ) ප්‍රඥාබලයවෙයි; හිරිබලං හොති, (අහිරිකයෙන්අකම්ප්‍යවූ) හිරිබලයවෙයි; ඔත්තප්පබලං හොති, (අනොත්තප්පයෙන් අකම්ප්‍යවූ) ඔත්තප්පබලයවෙයි— අලොභොහොති, (කමලපත්‍රගත ජලබින්දුවක්මෙන් අරමුණෙහි අලග්නස්වභාවවූ) අලොභයවෙයි; අදොසොහොති, (අනුකූල ප්‍රවෘත්තිඇති මිත්‍රයෙකු මෙන් අවිරොධලක්ෂණවූ)අද්වෙෂයවෙයි; අමොහොහොති, (අරණ්‍ය යානසුවදක්නාමෙන් අරමුණෙහි නොමුළාවිපවත්නා) අමොහයවෙයි.

මූලට්ඨයෙන් තොන.

කතා හොති— ජ්ජුගලදුකරාසි— සති හොති සම්පජඤ්ඤං හොති— උපකාරද්දුකරාසි— සමථො හොති විපස්සනා හොති— යුගනන්ධදුකරාසි— පග්ගාහො හොති අවික්ඛෙපො හොති— විරියසමථ දුකරාසි— යෙ වා පන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්චසමුප්පන්නා අරූපිනො ධම්මා ඉමෙ ධම්මා කුසලා.

---

අනභිජ්ඣා හොති, (අරමුණෙහි අලගනව පවත්නාවූ) අනභිජ්ඣාව වෙයි; අව්‍යාපාදො හොති, (අරමුණෙහි නොගැටෙනාවූ) අව්‍යාපාදකවෙයි; සම්මාදිට්ඨි හොති, (යථාස්වභාව ප්‍රතිවෙධ කරවූ) සම්‍යක් දෘෂ්ටියවෙයි; හිරි හොති, (පාපධර්මයන් අශුචිමෙන් දැක පිළිකුල් සාකාරයෙන් පවත්නා) හිරිවෙයි; ඔත්තප්පං හොති, (පාපධර්මයන් විෂයක් සේ දැක භයාකාරයෙන් පවත්නා) ඔත්තප්පයවෙයි; කායපස්සද්ධි හොති, (වේදනාදි ස්කන්ධත්‍රයාගේ දරථයයි කියනලද ඖද්ධත්‍යාදි කෙලෙසයන් සන්හිඳුවන) කායපස්සද්ධිය වෙයි; චිත්තපස්සද්ධි හොති, (විඥානස්කන්ධයාගේ දරථයයි කියනලද ඖද්ධත්‍යාදි කෙලෙසයන් සන්හිඳුවන) චිත්තපස්සද්ධියවෙයි; කායලහුතා හොති, (වේදනාදිස්කන්ධත්‍රයාගේ ගරුභාවයයි කියනලද ථිනමිද්ධාදීන් සන්හිඳුවන) කායලහුතාව වෙයි; චිත්තලහුතා හොති, (විඥානස්කන්ධයාගේ ගරුභාවයයි කියනලද ථිනාදීන් සන්හිඳුවන) චිත්තලහුතාව වෙයි; කායමුදුතා හොති, (වේදනාදි ස්කන්ධත්‍රයාගේ ථද්ධභාවයයි කියනලද දෘෂ්ටිමානාදීන් සන්හිඳුවන) කායමුදුතාව වෙයි; චිත්තමුදුතා හොති, (විඥානස්කන්ධයාගේ ථද්ධභාවයයි කියනලද දෘෂ්ටිමානාදීන් සන්හිඳුවන) චිත්තමුදුතාව වෙයි; කායකම්මඤ්ඤතා හොති, (වේදනාදි ස්කන්ධත්‍රයාගේ දානශීලාදි පුණ්‍යකර්මයෙහි අයොග්‍යතාවයයි කියනලද කාමච්ඡන්දාදි කෙලෙසයන් සන්හිඳුවන) කායකර්මණ්‍යතාව වෙයි; චිත්තකම්මඤ්ඤතා හොති, (විඥානස්කන්ධයාගේ දානශීලාදි පුණ්‍යකර්මයෙහි අයොග්‍යතාවයයි කියනලද කාමච්ඡන්දාදීන් සන්හිඳුවන) චිත්තකම්මඤ්ඤතාව වෙයි; කායපාගුඤ්ඤතා හොති, (වේදනාදිස්කන්ධත්‍රයාගේ ගෙලඤ්ඤභාවයයි කියනලද අශ්‍රද්ධාදි පාපධර්මයන් සන්හිඳුවීම කරණ) කායපාගුඤ්ඤතාව වෙයි; චිත්තපාගුඤ්ඤතා හොති, (විඥානස්කන්ධයාගේ ගෙලඤ්ඤභාවයයි කියනලද අශ්‍රද්ධාදි පාපධර්මයන් සන්හිඳුවන) චිත්තපාගුඤ්ඤතාව වෙයි; කායුජ්ජුකතා හොති, (වේදනාදිස්කන්ධත්‍රයාගේ කුටිලභාවයයි කියනලද මායාදීන් සන්හිඳුවන) කායුජ්ජුකතාව වෙයි, චිත්තුජ්ජුකතා හොති

---

'නොසැලෙමින් පවත්නාවූ' ඇතැම්පොත.

24 පදවිභාගතො ඡපඤ්ඤාස පදානි හොන්ති නියතයෙවාපනකෙහි සහ සමසට්ඨිපදානි හොන්ති, තත්ථ නියතයෙවාපනකා නාම ඡන්දො, අධිමොක්ඛො තත්‍රමජ්ඣත්තතා මනසිකාරොති, යදාපන අනියත යෙවාපනකෙහි සහ උප්පජ්ජන්ති, තදා එකසට්ඨි පදානි හොන්ති, තත්ථ අනියත යෙවාපනකානාම කරුණා මුදිතා සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවොති.

---

විඤ්ඤාණස්කන්ධයාගේ කුටිලභාවයයි කියනලද මායාදීන් සන්හිඳුවන) චිත්තුජ්ජුකතාව වෙයි- සති හොති, (කර්තව්‍යා කර්තව්‍ය දෙක්හි එලඹසිටින) සම්‍යතිය වෙයි- සම්පජඤ්ඤං හොති, (අරමුණු පිරිසිඳ ගන්නා) සම්පජඤ්ඤය වෙයි; සමථො හොති, (කාමච්ඡන්දාදි ප්‍රතිපක්ෂධර්මයන් සන්හිඳුවමින් පවත්නා) ශමථයවෙයි; විපස්සනා හොති, (අනිත්‍යාදි නානාප්‍රකාරයෙන් ධර්මයන් දක්නා) විපස්සනාවවෙයි- පග්ගාහො හොති, (සම්ප්‍රයුක්තධර්මයන් නොපසුබැස්සදී පවත්නා) ප්‍රග්‍රාහයවෙයි; අවික්ඛෙපො හොති, (උද්ධච්චතැමැති වික්ෂෙපයට ප්‍රතිපක්ෂවූ) අවික්ෂෙපයවෙයි;-- තස්මිං සමයෙ අඤ්ඤෙපි පටිච්චසමුප්පන්නා අරූපිනො යෙවාපන*ධම්මා අත්ථි ඉමෙධම්මාකුසලාති යොදනු:= තස්මිං සමයෙ, ඒ ප්‍රථමමහාකුශල චිත්තය උපන් සමයෙහි; අඤ්ඤෙපි, (ස්පර්ශාදි යථොක්ත ධර්මයන්කෙරෙන්) අන්‍යවූද; පටිච්චසමුප්පන්නා, ස්වකීය ස්වකීය ප්‍රත්‍යයෙන් උපන්නාවූ; අරූපිනො, (රූපාභාවයෙන්) අරූපීවූ; යෙවාපන ධම්මා අත්ථි, (පරමාර්ථයෙන් විද්‍යමානවූ) යම් ධර්මකෙනෙක් ඇද්ද; ඉමෙධම්මා, (යෙවාපනකයන් හා සමග ස්පර්ශාදි) මේ සියලු ධර්මයෝ; කුසලා, අනවද්‍යසුඛ විපාකධර්මයෝයි.

21 පදවිභාගතො. (එසෙසා'යනාදි) පදවිභාගයෙහයින්; නියත යෙවාපනකෙහි සහ, (ඉපැද්දයුතු ඒ ඒ චිත්තයෙහි නියමයෙන් උපදනා හෙයින් නියතවූ ස්පර්ශාදි ධර්මයන්මෙන් ස්වරූපයෙන් පාළිගතනොවූ) යෙවාපනක යන්හින් ආවවුන්හා සමග උපදනාසඳ; සමසට්ඨිපදානි හොන්ති, සමසැට පදකෙනෙක් වෙත්; තත්ථ, එහි; ඡන්දො, සත්තුකාමතාලක්ෂණවූ කුශලච්ඡන්දය; අධිමොක්ඛො, (ආලම්බනයෙන් යථා තථානිශ්චයාකාරයෙන් පවත්නා) අධිමොක්ෂය; තත්‍රමජ්ඣත්තතා, (සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන් ස්වකීය කෘත්‍යයෙහි

---

යෙවාපනකා, පොත්.

25 දුකවග්ගාදීසු යස්මා සඞ්ගහඤ්ච න යන්ති'ති,
චිත්තස්ස ච පුථුභාවං දීපෙතුඤ්ච අපණ්ණකං.
තස්මා යෙවාපනා ධම්මා මුනින්දෙන පකාසිතා'ති.

සම්පවෘත්තියට හෙතුවූ) තත්‍රමජ්ඣත්තතාවය; මනසිකාරො, (සම්ප්‍රයුක්තධර්මයන් ආලම්බනාභිමුඛකොට ප්‍රතිපාදනයකරණ) මනසිකාරය යන මොහුයි- යන්, සම්සාලෙක්හි; අනියතයෙවාපන කෙතිසන, (ඉපැද්දයුතු ඒ ඒ චිත්තයෙහිදු කරුණාභාවනාදීහු සිසිකලෙක්හි උපදනාහෙයින්) අනියතවූ (ස්වරූපයෙන් නොඅවුත්) යෙවාපනකයන්මින් ආවවත්හා සමග; උප්පජ්ජන්ති, (ස්පර්ශාදීහු) උපදිත්ද; නද, එකල්හි; එකසටයිපදුනි නොනැති, (අනියත යෙවාපනකයන්හා සමග නොඉපද එකක්එකක්ම උපදනා හෙයින්) එක්සැටපදංසාගෙනෙක් වේත්; කරුණා, (දුඃඛිත සත්වයන්ගේ දුඃඛාපගමනය කැමැති) කරුණාද; මුදිතා, (සුඛිත සත්වයන්ගේ සුඛයෙහි ප්‍රමුදිතාව පවත්නාවූ) මුදිතාද; සම්මාවාචා, (මෘෂාවාදාදී චතුර්විධ වාග්දුශ්චරිතයෙන් විරමණයයි කියනලද) සම්‍යක්වාචාද; සම්මාකම්මන්තා, (ප්‍රාණාතිපාතාදී ත්‍රිවිධකාය දුශ්චරිතයෙන් විරමණයයි කියනලද) සම්‍යක් කර්මාන්තද; සම්මාආජීවො හි, (මිථ්‍යාජීවයෙන් විරමණයයි කියනලද) සම්‍යගාජීවයද යන මොහුයි.

25 දුකවග්ගාදීසු—පෙ—මුනින්දෙන පකාසිතා—

දුකවග්ගාදීසු, දුකරාසිය ආදි සතළිස් රැස්හි; යස්මා, යම්හෙයකින්; සඞ්ගහං න යන්ති, (කිසිතැනකයෙකිනුඅ) සඞ්ග්‍රහයකටනොයෙද්ද; තස්මාච එහෙයින්ද; චිත්තස්ස අපණ්ණකං පුථුභාවං දීපෙතුඤ්ච, (කිසිවානුගමකොට හැන අසම්භාව්‍යනාකරණ දෙවියන්ගේ මාතප්‍රහාණීයකොට) චිත්තයාගේ නරවද මහත්තත්වය හඟවනු පිණිසද; යෙවාපනාධම්මා, යෙවාපනකධර්මයෝ; මුනින්දෙන මුනීන්ද්‍රයාවිසින්; පකාසිතා, (ස්වරූපයෙන් නොදසා යෙවාපනකනාමින්) දෙසන ලදනු.

' චිත්තුප්පාදෙසු ධම්මා ච ඛන්ධායතනධාතුයො,
ආහාරා ච යථායොගං එස්සපඤ්චකරාසියං,
සබ්බෙ සඞ්ගහිතා හෙ නාපි තස්මා නාමපරිග්ගහෙ
මූල රාසිව සො සබ්බ සඞ්ගහෙ හොති පවුච්චති"

26 රාසිතො සත්තරසරාසී හොන්ති, ඵස්සපඤ්චකරාසි ඣානපඤ්චකරාසි ඉන්ද්‍රියට්ඨකරාසි මග්ගපඤ්චකරාසි බලසත්තකරාසි හෙතුත්තිකරාසි කම්මපථත්තිකරාසි ලොකපාලදුකරාසි ඡයුගලදුකරාසි උපකාරදුකරාසි යුගනන්ධදුකරාසි විරියසමථදුකරාසි චෙති.

---

චිත්තුප්පාදෙසු, චිත්තොත්පාදයෙහිලා ලැබෙන්නාවූ; ධම්මා ච, (චිත්තචෛතසික) ධර්මයෝද; ඛන්ධායතනධාතුයො; ස්කන්ධය ආයතනය ධාතුය යන මොහුද; ආහාරා ච, ආහාරයෝද සතර; සබ්බෙ මොහු හැමදෙන; යථායොගං යෙදෙනයෙදෙන පරිද්දෙන්; ඵස්සපඤ්චකරාසියං, ඵස්සපඤ්චකරාසියෙහිලා, යස්මා, යම්හෙයකින් සඞ්ගහිතා හොන්ති, සඞ්ග්‍රහකරණලද්දාහු වෙද්ද; තස්මා, එහෙයින් සො, ඒ ඵස්සපඤ්චකරාසියතෙම; නාමපරිග්ගහො; නාමපරිග්‍රහයයිද; මූලරාසි ච, මූලරාසියයිද; සබ්බසඞ්ගහො ති ච, සර්වසඞ්ග්‍රහයයිද පවුච්චති, කියනුලැබේ.

මේ ඵස්ස පඤ්චකරාසියෙහි වෙදනායයි සුඛදුක්ඛාදි සියලු වෙදනාද සඤ්ඤායයි රූපසංඥාදි සියලුසංඥාද ඵස්සය චෙතනායයි සියලු සංස්කාරයන්ද චිත්තයයි සියලුවිඥානයන්ද ගත්හෙයින් සියලු චිත්තචෛතසිකධර්මයෝ සඞ්ග්‍රහවෙත්, වෙදනායයි වෙදනාස්කන්ධයද සඤ්ඤායයි සංඥාස්කන්ධයද ඵස්සය චෙතනායයි සංස්කාරස්කන්ධයද චිත්තයයි විඥානස්කන්ධයද යනමේ සතර අරූපීහුද සඞ්ග්‍රහවෙති, ඵස්සය වෙදනාය සඤ්ඤාය චෙතනායයි චෛතසිකස්වභාවවූ ධර්මායතනයෙහි එකදෙශයද චිත්තයයි මනායතනයද ගත්හෙයින් සියලු අරූපායතනයෝද සඞ්ග්‍රහවෙති, ඵස්සය වෙදනාය සඤ්ඤාය චෙතනායයි චෛතසිකස්වභාවවූ ධර්මායතනයෙහි එකදෙශයද චිත්තයයි සප්තවිඥාන ධාතූන්ද ගත්හෙයින් සියලුඅරූපධාතූහුද සඞ්ග්‍රහවෙත් ඵස්සයයි ඵස්සාහාරයද චෙතනායයි මනොසඤ්චෙතනාහාරයද චිත්තයයි විඥානාහාරයද ගත්හෙයින් සියලු අරූපාහාරයෝද සඞ්ග්‍රහවෙති, එහෙයින් ඵස්ස පඤ්චකරාසිය නාමපරිග්‍රහයයිද කියනු ලැබෙයි, ධ්‍යානපඤ්චකාදි සෙසු සොළොස් රාසීන්ට මාතෘකාස්ථානීය හෙයින් මූලරාසියයිද කියනුලැබෙයි, කුශලාදි භෙදයෙන සංස්කාර ස්කන්ධාදිභෙදයෙන් භින්නවූ සියලු අරූපධර්මයන් සංග්‍රහකරණහෙයින් සර්වසඞ්ග්‍රහයයිද කියනුලැබෙයි යනු භාවයි.

27 යෙවාපනකෙහි විනා පාළියෙ ආගතා (a) අසම්භින්නා තිංසධම්මා හොන්ති, යථා–, ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො පීති චිත්තස්සෙකග්ගතා සද්ධා විරියං සති පඤ්ඤා ජීවිතින්ද්‍රියං හිරි ඔත්තප්පං අලොභො අදොසො කායපස්සද්ධාදයො ද්වාදස ධම්මා චෙති ඉමෙ තිංසධම්මා අසම්භින්නා හොන්ති, සවිභත්තික අවිභත්තික වසෙන දුවිධා හොන්ති. අට්ඨාරස (b) අවිභත්තිකා ද්වාදස සවිභත්තිකා, යථා ඵස්සො සඤ්ඤා චෙතනා විචාරො පීති ජීවිතින්ද්‍රියං කායපස්සද්ධාදයො ද්වාදසධම්මා චෙති ඉමෙ අට්ඨාරස ධම්මා අවිභත්තිකා. වෙදනා චිත්තං විතක්කො චිත්තස්සෙකග්ගතා සද්ධා විරියං සති පඤ්ඤා හිරි ඔත්තප්පං අලොභො අදොසොති ඉමෙ ද්වාදස ධම්මා සවිභත්තිකා,

(c) තත්ථ චිත්තං ඵස්සපඤ්චකෙ චිත්තං ඉන්ද්‍රියට්ඨකෙ මනින්ද්‍රියං. විතක්කො ඣානපඤ්චකෙ විතක්කො මග්ගපඤ්චකෙ සම්මාසඞ්කප්පො, සද්ධා ඉන්ද්‍රියට්ඨකෙ සද්ධින්ද්‍රියං බලසත්තකෙ සද්ධාබලං. හිරි බලසත්තකෙ හිරිබලං ලොකපාලදුකෙ හිරි. ඔත්තප්පං බලසත්තකෙ ඔත්තප්පබලං ලොකපාලදුකෙ ඔත්තප්පං, අලොභො හෙතුත්තිකෙ අලොභො කම්මපථත්තිකෙ අනභිජ්ඣා, අදොසො හෙතුත්තිකෙ අදොසො කම්මපථත්තිකෙ අබ්‍යාපාදො, වෙදනා ඵස්සපඤ්චකෙ වෙදනා ඣානපඤ්චකෙ සුඛං. ඉන්ද්‍රියට්ඨකෙ සොමනස්සින්ද්‍රියං, විරියං ඉන්ද්‍රියට්ඨකෙ විරියං මග්ගපඤ්චකෙ සම්මාවායාමො බලසත්තකෙ විරියබලං විරියසම්බොජ්ඣඞ්ගෙ පග්ගාහො, සති ඉන්ද්‍රියට්ඨකෙ සතින්ද්‍රියං මග්ගපඤ්චකෙ සම්මාසති බලසත්තකෙ සතිබලං උපකාර දුකෙ සති, සමාධි ඣානපඤ්චකෙ චිත්තස්සෙකග්ගතා ඉන්ද්‍රියට්ඨකෙ සමාධින්ද්‍රියං මග්ගපඤ්චකෙ සම්මාසමාධි බලසත්තකෙ සමාධිබලං යුගනද්ධදුකෙ සමථො විරියසමථදුකෙ අවික්ඛෙපො, පඤ්ඤා ඉන්ද්‍රියට්ඨකෙ පඤ්ඤින්ද්‍රියං මග්ගපඤ්චකෙ

---

27(a) අසම්භින්නා, (නානාවශයෙන් ඒ ඒ රාශියෙහි) අසම්මිශ්‍ර කොට ගන්නා ලද්දාහු.–

(b) අවිභත්තිකා, (නානාවශයෙන් නානා ස්ථානයෙහි) බෙද යක් නැත්තාහු–(c) තත්ථ, එහි; චිත්තං, චිත්තය තෙම; ඵස්සපඤ්චකෙ, ඵස්සපඤ්චකයෙහි; චිත්තං, චිත්තයයි කියන ලදී; ඉන්ද්‍රියට්ඨකෙ, ඉන්ද්‍රියාෂ්ටකයෙහි මනින්ද්‍රියං, මනින්ද්‍රියයයි කියාද; (වුත්තං, කියන ලදී).

---

සමථොච අවික්ඛෙපොචෙව, ආදුකපොත්ථකෙ,

සම්මාදිට්ඨි බලසත්තකෙ පඤ්ඤාබලං හෙතුත්තිකෙ අමොහො කම්මපථත්තිකෙ සම්මාදිට්ඨි උපකාරදුකෙ සම්පජඤ්ඤං යුගනද්ධදුකෙ විපස්සනාති.

චිත්තං චිත්තෙකතා සඞ්ඛා ච හිරොත්තප්පං දුහෙතුසො,
ඉමෙ ඡිට්ඨානිකා සත්ත නිට්ඨානිකා ච වෙදනා.
විරියං සති චතුට්ඨානා ඡට්ඨානෙ'කග්ගතාපි ච,
සත්තට්ඨානා මති වුත්තා ඝිනානා ඩාදසධා ඉමෙ, ති.

## පඨමචිත්තං නිට්ඨිතං.

——o——

දුතියෙ සසඞ්ඛාරිකනානි විසෙසො, තතියෙ සොමනස්සසහගතෙ ඤාණවිප්පයුත්තෙ අසඞ්ඛාරිකෙ පදවිභාගතො එකූනපඤ්ඤාසපදානි හොන්ති, අසම්භින්නපදානි එකූනතිංසං හොන්ති, තෙසු අවිභත්තිකානි අට්ඨාරස සවිභත්තිකානි එකාදස, සත්තට්ඨානිකා පඤ්ඤාපරිහීනා, එත්තකං නානාකරණං, චතුත්ථෙ සසඞ්ඛාරිකනානි විසෙසො, පඤ්චමෙ උපෙක්ඛාසහගතෙ ඤාණසම්පයුත්තෙ අසඞ්ඛාරිකෙ පඤ්චපඤ්ඤාස පදානි හොන්ති, යථා ඵස්සො වෙදනාසඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො උපෙක්ඛා චිත්තස්සෙකග්ගතා සද්ධා විරියං සතිසමාධි පඤ්ඤා මනින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං ජීවිතින්ද්‍රියං සම්මාදිට්ඨිඑවමාදයො පඨමචිත්තාසදිසා,ඣානං පඤ්චකෙ *පීතිපරිහීනත්තා චතුරඞ්ගිකං ඣානං හොති. අසම්භින්නපදානි

"චතුත්තිංසාච තෙත්තිංසා තෙත්තිංසා තිංසකා දුවෙ,
අනියතෙසු හි එකෙකං අධිකානාපි විජානියං.

චතුත්තිංසාච, (කාමාවචර කුශලයන් අතුරෙන් ප්‍රථම චිත්තොත්පාදයෙහි ධර්මයෝ)සූතිසෙක; තෙත්තිංසා, (ද්විතීය-චිත්තොත්පාදයෙහි) තෙතිසෙක; තෙත්තිංසා, (තෘතීය චිත්තොත්පාදයෙහි) තෙතිසෙක; තිංසකාදුවෙ, (චතුර්ථ චිත්තොත්පාදයෙහි) දෙතිසෙක; අනියතෙසු හි, අනියත යෙවාපනකයන් පස්දෙනා අතුරෙන්; එකෙකං, එකෙක් එකෙක්; අධිකානාපි, අධිකයයි; විජානියං, දතයුත්තේයි= එහෙයින් අනියතයන් අතුරෙන් එකක් හා සමග සූතිස පන්තිසෙක්වෙයි තෙතිස සූතිසෙක්වෙයි දෙතිසතෙතිසෙක් වෙයි.

* 'පීතිපරිහීනා තථා චතුරඞ්ග ඣානකොති පරිහීනා තථාචතුරඞ්ග සම්භින්නපදානි' ඉති ආදාසපොත්ථකෙ,

එකූනතිංසා හොන්ති, අවිභත්තිකානි සත්තරස, සවිභත්තිකානි ද්වාදස, එත්තකං නානාකරණං, ඡට්ඨෙ සසඞ්ඛාරිකන්ති විසෙසො, සත්තමෙ උපෙක්ඛාසහගතෙ ඤාණවිප්පයුත්තෙ අසඞ්ඛාරිකෙ අට්ඨචත්තාලීසපදානි හොන්ති, අසම්භින්නපදානි අට්ඨවීසති හොන්ති, පීතියා ච ඤාණස්ස ච පරිහීනත්තා අවිභත්තිකානි සත්තරස, සවිභත්තිකානි එකාදස, අට්ඨමෙ සසඞ්ඛාරිකන්ති විසෙසො.

## කාමාවචරචිත්තකථා නිට්ඨිතා.

28 රූපාවචරපඨමජ්ඣානං කාමාවචරකුසලචිත්තසදිසං. දුතියජ්ඣානෙ චතුපඤ්ඤාසපදානි හොන්ති. විතක්කස්ස පරිහීනත්තා චතුරඞ්ගිකං ඣානං හොති, චතුරඞ්ගිකො මග්ගො හොති, අසම්භින්නපදානි එකූනතිංසා හොන්ති, අවිභත්තිකානි අට්ඨාරස, සවිභත්තිකානි එකාදස.

තතියජ්ඣානෙ තෙපඤ්ඤාසපදානි හොන්ති, විතක්කවිචාර පරිහීනත්තා තිවඞ්ගිකං ඣානං හොති, අසම්භින්නපදානි අට්ඨවීසති හොන්ති, අවිභත්තිකානි සත්තරස, සවිභත්තිකානි එකාදස.

චතුත්ථජ්ඣානෙ ද්වෙපඤ්ඤාසපදානි හොන්ති, පීතියා ච පරිහීනත්තා දුවඞ්ගිකං ඣානං හොති, අසම්භින්නපදානි සත්තවීසති හොන්ති, අවිභත්තිකානි සොළස, සවිභත්තිකානි එකාදස.

ඉමෙසු චතූසු ඣානෙසු චත්තාරො නියතයෙවාපනකා සබ්බදා උප්පජ්ජන්ති, කරුණා මුදිතා අනියතයෙවාපනකා අප්පමඤ්ඤා භාවනාකාලෙ නානා උප්පජ්ජන්ති(a).

---

(a) "උපෙක්ඛායුත්තචිත්තෙසු න දුක්ඛසුඛපීතියො,
ජායන්තෙව විසුං පඤ්ච කරුණාමුදිතාදයො".

පඤ්චමජ්ඣානෙ චෙපඤ්ඤාසපදානි හොන්ති, වේදනාක්ඛන්ධෙසු උපෙක්ඛා හොති, ඉන්ද්‍රියෙසු උපෙක්ඛින්ද්‍රියං හොති, අසම්භින්නපදානි පන්නවීසති හොන්ති, අවිභත්තිකානි සොළස, සවිභත්තිකානි එකාදස, නියතයෙවාපනකා චත්තාරො යෙව සබ්බදා උප්පජ්ජන්ති.

## රූපාවචරකුසලචෙතසිකා නිට්ඨිතා.

—(o)—

29 අරූපාවචරානි චත්තාරිඣානානි* රූපාවචරපඤ්චමජ්ඣානසදිසචෙතසිකානිපි ආරම්මණමෙව ආකාසාදි තෙසං නානාකරණං.

සොතාපත්තිමග්ගචිත්තෙන සහජාතධම්මා සමසට්ඨිපදානි හොන්ති, රාසිතො පන්නරසරාසී හොන්ති, චත්තාරො ධම්මා අධිකා උප්පජ්ජන්ති, සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො (ක) අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියඤ්ච(ඛ), තස්මා ච, මග්ගො අට්ඨඞ්ගිකො මග්ගො හොති, නවින්ද්‍රියානි හොන්ති අසම්භින්නපදානි තෙත්තිංසා හොන්ති, සම්මාවාචාදීනං පවිට්ඨත්තා, අවිභත්තිකානි එකවීසති, සවිභත්තිකානි ද්වාදස. සකදාගාමිඅනාගාමිඅරහත්තමග්ගාපි සොතාපත්තිමග්ගසදිසාව, ඉන්ද්‍රියෙසු අඤ්ඤින්ද්‍රියං හොති, එත්තකං නානාකරණං, එතෙසු චතූසු මග්ගෙසු ඡන්දාදයො චත්තාරො නියතයෙවාපනකා උප්පජ්ජන්ති.

## කුසලචෙතසිකා නිට්ඨිතා.

---

“කථං කරුණාමුදිතා උපෙක්ඛාසහගතෙ සම්භවන්ති?, පුබ්බභාගභාවතො, අප්පණාප්පත්තායෙව හි කරුණාමුදිතා උපෙක්ඛාසහගතා න හොන්ති, තතො අඤ්ඤත්ථ පන උපෙක්ඛාසහගතාපි හොන්තීති ආචරියා, සුවිසුද්ධකායකම්මාදිකස්ස චිත්තසමාධානවසෙන රූපාරූපාවචර කුසලප්පවත්ති, න කායකම්මාදීනං සොධනවසෙනාපි, දුච්චරිතදුරාජීවානං සමුච්ඡින්දනපටිප්පස්සම්භනවසෙනාති මහග්ගතවිපාකෙසු විරතීනං සම්භවො යෙව”.

(ක) “තං තං වාරිත දුස්සීල්‍ය චෙතනුච්ඡෙද කිච්චතො,
මග්ගෙ ච තුල්‍යපාකත්තා ඵලෙ ච ත්‍රයතා සියුං”.

---

* “රූපාවචරානි පඤ්චමජ්ඣානසදිසානි චෙතසිකානීති” ඉති ආදූයපොත්ථකෙ.

30 සොමනස්සසහගතෙ දිට්ඨිගතසම්පයුත්තෙ අසඞ්ඛාරිකෙ චතුත්තිංස ධම්මා හොන්ති, යථා ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො පීති සුඛං චිත්තෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං මනින්ද්‍රියං සොමනස්සින්ද්‍රියං (ජීවිතින්ද්‍රියං) මිච්ඡාදිට්ඨි මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි විරියබලං සමාධිබලං අහිරිකබලං අනොත්තප්පබලං ලොභො මොහො අභිජ්ඣා මිච්ඡාදිට්ඨි අහිරිකං අනොත්තප්පං සමථො පග්ගාහො අවික්ඛෙපො චෙති.

---

තං තං වාරික දුස්සීල්‍ය චෙතනාචෙඡද කිච්චතො. කායාදි ද්වාරයෙහි සිඬවන කායදුශ්චරිත වාග්දුශ්චරිත මිථ්‍යාජීවල [illegible] දෞඃශීල්‍ය චෙතනාවගේ එකක්ෂණයෙහිම සමුච්ඡෙද කිරීම [illegible] තාකොට ඇතිහෙයින්; මාර්ගච, චතුර්විධමාර්ග චිත්තයෙහිද තුල්‍යපාකත්වා, මාර්ගයහා සදෘශවිපාකයක් වූ හෙයින්; [illegible], චතුර්විධ ඵල චිත්තයෙහිද; නියතාසිද්ධං, ("සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො"යි කියනලද අනියතයෙවාපනකයෝ තුන්දෙන) [illegible]තව උපදිත්.

(b) අනමතග්ගෙ සංසාරෙ අනඤ්ඤාතං අමතං පදං චතුසච්චධම්මමෙව වා ඤස්සාමි ජානිස්සාමීති එවං පටිපන්නස්ස උප්පජ්ජනතො ඉන්ද්‍රියට්ඨසම්භවතො ච අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, සොතාපත්තිමග්ගඤාණං, අනඤ්ඤාතං ඤස්සාමීති පටිපන්නස්ස ඉන්ද්‍රියං අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං, අනමතග්ගත්ථ අඤ්ඤාතතාව. අථවා අනඤ්ඤාතතො අග්ගා අස්සාති අනමතග්ගා, තස්මිං, ආජානනතො ඉන්ද්‍රියට්ඨසම්භවතො ච අඤ්ඤින්ද්‍රියං, මජ්ඣෙ ඡඤාණානි, ආජානාතීති අඤ්ඤා අඤ්ඤා ච තං ඉන්ද්‍රියඤ්චාති අඤ්ඤින්ද්‍රියං, චත්තාරි සච්චානි පටිවිජ්ඣිත්වා ඨිතත්තා අඤ්ඤාතාවිනො චතුසච්චෙසු නිට්ඨිතඤාණකිච්චස්ස ඛීණාසවස්ස උප්පජ්ජනතො ඉන්ද්‍රියට්ඨසම්භවතො ච අඤ්ඤාතාවින්ද්‍රියං, අරහත්තඵලඤාණං. දුබ්බිඤ්ඤෙය්‍යාදමනතික[illegible] අඤ්ඤසිත් අඤ්ඤාතාවී— පඤ්ඤින්ද්‍රියය ධම්මසඞ්ගරූපදක්වා [illegible] වදූරා එම ප්‍රස්තාවයෙහි පුද්ගලාධ්‍යාශය ප්‍රකාශකරනු නැමතිව "අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං" යනාදීන් වදාළහ.

කුසල් නිමි.

—◦—

30 මිච්ඡාදිට්ඨි, (මිරිඟුයෙහි ජලබුද්ධියක්මෙන් විපරීතාභිනිවෙශ ස්වභාවවූ) මිථ්‍යාදෘෂ්ටිය; මිච්ඡාසඞ්කප්පො, (විපරීතාකාරයෙන්

රාසිතො. නවරාසි හොන්ති, ඵස්සපඤ්චකරාසි ඣානපඤ්චක රාසි ඉන්ද්‍රියපඤ්චකරාසි මග්ගචතුක්කරාසි බලචතුක්කරාසි හෙතුදුකරාසි කම්මපථදුකරාසි කණ්හදුකරාසි(a) පිට්ඨිදුකරාසි * චෙති(b), සොළස අසම්භින්නපදානි හොන්ති, එත්ථ වෙදනා

---

ආලම්බනාභිනිරොපණය කරණ)මිථ්‍යාසඞ්කල්පය; මිච්ඡාවායාමො, (කුශල ධර්මයට විපරීතකොට ප්‍රයොගකරණ)මිථ්‍යාව්‍යායාමය; මිච්ඡාසමාධි, (ආලම්බනයෙහි විපරීතකොට සමාධානයකරණ) මිථ්‍යාසමාධිය; විරියබලං, (සහජාතධර්මයන් කෙරෙහි අකම්ප්‍යව පවත්නා) විරියබලය—මොහො, (ආලම්බනයෙහි ස්වභාව ප්‍රච්ඡාදනයකරණ) මොහය— අභිජ්ඣා, (පරසම්පත්තියෙහි ලෝභස්වභාව ලක්ෂණ) අභිධ්‍යාවය— අහිරිකං, (අමෙධ්‍යයෙහි ග්‍රාමශූකරසෙයින් පාපයෙහි අජුගුප්සාකාරයෙන් පවත්නා) අහිරිකය; අනොත්තප්පං, (වහ්නියෙහි අනුත්‍රස්තව පවත්නා ශලභයාමෙන් පාපයෙහි අනුත්‍රස්තව පවත්නා) අනොත්තප්පය—

"නාග්රීරජුගුප්සතෙ පාපා දමෙධ්‍යාදිව ශූකරඃ,
ශලභො,ශෙනරි වෛතස්මාතන ත්‍රස්‍යත්‍යනපත්‍රපඃ".

අග්රීඃ, අහිරිකයතෙම; අමෙධ්‍යාත්, අශුචීන්; ශූකරඃ ඉව, ග්‍රාම්ශූරයක් හුසේ; පාපාත්, අකුශලයෙන්; නජුගුප්සතෙ, පිළිකුල් නොකරන්නේයි; අනපත්‍රපඃ, අනොත්තප්පය තෙම; අග්නෙඃ, ගිනින්; ශලභඃඉව, පළඟකුමෙන්; එනස්මාත්, මේ පාපය හෙතුකොටගෙන; න ත්‍රසති, නොබෙන්නේයි.

සමථො (අභ්‍යන්තරයෙහි වික්ෂෙප සන්සිඳුවන) ශමථය; පග්ගාහො, (අකුශලප්‍රවෘත්තියෙහි වියාතනා හුවම්න් පවත්නා) ප්‍රග්‍රාහය; අවික්ඛෙපො, (නානාකාර්‍යයෙහි අවික්ෂිප්තව පවත්නා) අවික්ෂෙපය.

(a) චිත්තය අප්‍රභාස්වර කරණහෙයින් කණ්හදුකනම්.
(b) හැමරාශියට පසුව කියනලදහෙයින් පිට්ඨිදුකනම්.

---

අත්ථසාලිනියං පන පිට්ඨිදුකරාසීති වුත්තං, තංපන උපකාරදුකාදීනි තිණි දුකානිසඞ්ඛරාසිතො පච්ඡාවුත්තත්තා පිට්ඨිදුකරාසිති වත්වා,තතොයෙව තත්ථ සමාධිස්ස සමථා වික්ඛෙපවසෙන විසුං දුකෙසු විභත්තත්තා තං පජීච්ච 'අයං එකො ධම්මො ද්වීසු ඨානෙසු විභත්තො" තිච වුත්තං, එත්ථපන නයො සමථපග්ගාහාවික්ඛෙපෙ රාසිවසෙන එකමෙව රාසිං කත්වා පිට්ඨිදුකරාසීතිච උපරිපඤ්ඤාසු ධම්මානං එකන්තිවිධාන පරිච්ඡෙදනවසෙන එකග්ගතා පඤ්චමට්ඨානි ගණ්හාතිව වුත්තයන්ති, විචාරණසම්පදං ආයිධම්මිකයි.

සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො පීති චිත්තස්සෙකග්ගතා වීරියින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාදිට්ඨි අහිරිකං අනොත්තප්පං ලොභො මොහො චෙති(c). තෙසු අවිභත්තියාති සත්ත, සවිභත්තිකාති යාව, ඵස්සො සඤ්ඤා චෙතනා විචාරො පීති ජීවිතින්ද්‍රියං මොහො චෙති ඉමෙ සත්ත අවිභත්තිකා ධම්මා, වෙදනා චිත්තං විතක්කො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං මිච්ඡාදිට්ඨි අහිරිකං අනොත්තප්පං ලොභො චෙති ඉමෙ නව සවිභත්තිකා නාම.

තත්ථ චිත්තං ඵස්සපඤ්චකෙ චිත්තං, ඉන්ද්‍රියපඤ්චකෙ මනින්ද්‍රියං, විතක්කො ඣානපඤ්චකෙ විතක්කො, මග්ගචතුක්කෙ මිච්ඡාසඞ්කප්පො. මිච්ඡාදිට්ඨි මග්ගචතුක්කෙ මිච්ඡාදිට්ඨි. කම්මපථද්වයෙ මිච්ඡාදිට්ඨි. අහිරිකං බලචතුක්කෙ අහිරිකබලං, කණ්හද්වයෙ අහිරිකං. අනොත්තප්පං බලචතුක්කෙ අනොත්තප්පබලං, කණ්හද්වයෙ අනොත්තප්පං. ලොභො හෙතුද්වයෙ ලොභො, කම්මපථද්වයෙ අභිජ්ඣා. වෙදනා ඵස්සපඤ්චකෙ වෙදනා, ඣානපඤ්චකෙ සුඛං. ඉන්ද්‍රියපඤ්චකෙ සොමනස්සින්ද්‍රියං. විරියං ඉන්ද්‍රියපඤ්චකෙ විරියින්ද්‍රියං, මග්ගචතුක්කෙ මිච්ඡාවායාමො, බලචතුක්කෙ විරියබලං, පිට්ඨිදුකෙ පග්ගාහො. සමාධි ඣානපඤ්චකෙ චිත්තෙකග්ගතා, ඉන්ද්‍රියපඤ්චකෙ සමාධින්ද්‍රියං, මග්ගචතුක්කෙ මිච්ඡාසමාධි, බලචතුක්කෙ සමාධිබලං, පිට්ඨිදුකෙ සමථො අවික්ඛෙපො චෙති.

චිත්තං විතක්කො දිට්ඨි අහිරිකං අනොත්තප්පං ලොභො චෙති ඉමෙ ඡ ද්විට්ඨානිකා, වෙදනා තිට්ඨානිකා, විරියං* චතුට්ඨානිකං, එකග්ගතා පඤ්චට්ඨානිකා, දුතියෙ සසඞ්ඛාරිකත්තං විසෙසො.

---

(c) අකුසලචිත්තෙ සද්ධා සති පඤ්ඤා ඡ යුගලකානීති ඉමෙ ධම්මා න ගහිතා, කස්මා? අස්සද්ධියචිත්තෙ පසාදො නාම නත්ථි, තස්මා තාව සද්ධා න ගහිතා, කිම්පන දිට්ඨිගතිකා අත්තනො අත්තනො සත්ථාරානං න සද්දහන්තීති, සද්දහන්ති. සා පන සද්ධා නාම න හොති වචනසම්පටිච්ඡනමත්තමෙව එතං. අනුපපරික්ඛා වා හොති දිට්ඨි වා, අසතියචිත්තෙ පන සති නත්ථීති න ගහිතා, කිං දිට්ඨිගතිකා අත්තනා කතකම්මං න සරන්තීති, සරන්ති, සා පන සති නාම න හොති, කෙවලං තෙනාකාරෙන අකුසල චිත්තප්පවත්ති, තස්මා සති න ගහිතා, අථ කස්මා මිච්ඡාසතීති සුත්තෙ වුත්තා,

---

''චතුට්ඨානෙකග්ගතා.''

සොමනස්සසහගතෙසු වීසුදිට්ඨිගතවිප්පයුත්තෙසු විචිකිච්ඡා-දිට්ඨි පරිහීනා, තිංසපදානි හොන්ති, පණ්ණරස අසම්භින්නපදානි හොන්ති, අවිභත්තිකානි සත්ත, සවිභත්තිකානි අට්ඨ, ඵස්සො සඤ්ඤා චෙතනා විචාරො පීති ජීවිතින්ද්‍රියං මොහො චෙති ඉමෙ සත්ත අවිභත්තිකා ධම්මා, වෙදනා චිත්තං විතක්කො එකග්ගතා විරියින්ද්‍රියං අහිරිකං අනොත්තප්පං ලොභො චෙති ඉමෙ අට්ඨ සවිභත්තිකා ධම්මා.

උපෙක්ඛාසහගතෙසු වීසු දිට්ඨිගතසම්පයුත්තෙසු පීති පරිහීනා, එකතිංසපදානි හොන්ති, වෙදනා ඣානඞ්ගෙ උපෙක්ඛා හොති, ඉන්ද්‍රියෙසු උපෙක්ඛින්ද්‍රියං හොති, පණ්ණරස අසම්භින්නපදානි හොන්ති. ඡ අවිභත්තිකානි, නව සවිභත්තිකානි. උපෙක්ඛාසහගතෙසු වීසු දිට්ඨිගත† විප්පයුත්තෙසු දිට්ඨි පරිහීනා, එකූනතිංසපදානි හොන්ති.

වීසු දොමනස්සසහගතෙසු එකූනතිංසපදානි හොන්ති, ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො දුක්ඛං චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං මනින්ද්‍රියං දොමනස්සින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි විරියබලං සමාධිබලං අහිරිකබලං අනොත්තප්පබලං දොසො මොහො බ්‍යාපාදො අහිරිකං අනොත්තප්පං සමථො පග්ගාහො අවික්ඛෙපො චෙති. චුද්දස අසම්භින්නපදානි හොන්ති, යථා ඵස්සො (වෙදනා) සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං ජීවිතින්ද්‍රියං අහිරිකං අනොත්තප්පං දොසො මොහො චෙති.

---

සා අකුසලක්ඛන්ධානං සතිරහිතත්තා සති පටිපක්ඛත්තා ච මිච්ඡාමග්ගමිච්ඡත්තානං පූරණත්ථං තත්ථ පරියායෙන දෙසනා කතා, නිප්පරියායෙන පනෙසා නත්ථි, තස්මා න ගහිතා, දණ්ඩබාලචිත්තෙ පන තස්මිං සද්ධා නත්ථීති න ගහිතා,. කිං දිට්ඨිගතිකානං සද්ධා නාපසද්ධා පසීදති, අත්ථි න පනෙසා පසද්ධා මායා සාමෙසා හොති, සා අත්ථතො තණ්හාව, ඉදං පන චිත්තං සදරථං ගරුකං භාරියං කක්ඛළං ථද්ධං අකම්මඤ්ඤං ගිලානං වඞ්කං කුණ්ඨං, තස්මා පස්සද්ධාදීනි ඡයුගලකානි න ගහිතානි—අට්ඨසාලිනියෙහි නයට එකාමයෙයින් කාරණා දිනයයි කාරණාවය යිහු.

---

† "සම්පයුත්තෙසු" ආදසපොත්ථකෙ.

ඡ අවිභත්තිකා, අට්ඨ සවිභත්තිකා ච, යථා ඵස්සො සඤ්ඤා චෙතනා විචාරො ජීවිතින්ද්‍රියං මොහො ඉමෙ ඡ අවිභත්තිකා ධම්මා. වෙදනා චිත්තං විතක්කො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං අහිරිකං අනොත්තප්පං දොසො ඉමෙ අට්ඨ සවිභත්තිකා ධම්මා.

විචිකිච්ඡාසහගතෙ තෙවීසතිපදානි හොන්ති, ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො උපෙක්ඛා චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං (මනින්ද්‍රියං) උපෙක්ඛින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො විරියබලං අහිරිකබලං අනොත්තප්පබලං විචිකිච්ඡා මොහො අහිරිකං අනොත්තප්පං පග්ගාහො චෙති. චුද්දස අසම්භින්නපදානි හොන්ති, යථා ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං (ජීවිතින්ද්‍රියං) විචිකිච්ඡා මොහො අහිරිකං අනොත්තප්පඤ්චාති. අට්ඨ අවිභත්තිකානි, ඡ සවිභත්තිකානි, ඵස්සො සඤ්ඤා චෙතනා විචාරො චිත්තෙකග්ගතා ජීවිතින්ද්‍රියං විචිකිච්ඡා මොහො ඉමෙ අට්ඨ අවිභත්තිකා ධම්මා, වෙදනා චිත්තං විතක්කො විරියින්ද්‍රියං අහිරිකං අනොත්තප්පං ඉමෙ ඡ සවිභත්තිකා ධම්මා. චිත්තෙකග්ගතා ඨිතිමත්තාමෙව හොති(1). සමාධින්ද්‍රියාදීනි පදුට්ඨානානි පරිහායන්ති.

උද්ධච්ච සහගතෙ අට්ඨවීසතිපදානි හොන්ති, ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො උපෙක්ඛා චිත්තෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං (මනින්ද්‍රියං) උපෙක්ඛින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මිච්ඡාසඞ්කප්පො මිච්ඡාවායාමො මිච්ඡාසමාධි විරියබලං (සමාධිබලං) අහිරිකබලං අනොත්තප්පබලං උද්ධච්චං මොහො අහිරිකං අනොත්තප්පං සමථො පග්ගාහො අවික්ඛෙපො චෙති. චුද්දස අසම්භින්නපදානි හොන්ති, ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං ජීවිතින්ද්‍රියං උද්ධච්චං මොහො අහිරිකං අනොත්තප්පඤ්චාති, සත්ත අවිභත්තිකානි, සත්ත සවිභත්තිකානි, ඵස්සො සඤ්ඤා චෙතනා විචාරො ජීවිතින්ද්‍රියං උද්ධච්චං මොහො චෙති ඉමෙ සත්ත අවිභත්තිකා ධම්මා, වෙදනා චිත්තං විතක්කො එකග්ගතා විරියින්ද්‍රියං අහිරිකං අනොත්තප්පඤ්චාති ඉමෙ සත්ත සවිභත්තිකා ධම්මා.

---

(1) චිත්තෙකග්ගතා, චිත්තෛකාග්‍රතා තොමෝ; ඨිතිමත්තාමෙව හොති, (අධිමොක්ෂසහාය විරහයෙන් දුබල වූ) ස්ථිතිමාත්‍රම වෙයි.

ඡන්දො අධිමොක්ඛො උද්ධච්චං මනසිකාරො (a) ඉස්සා මච්ඡරියං මානො ථීනං මිද්ධං කුක්කුච්චඤ්චාති ඉමෙ දස අකුසලා යෙවාපනකා. ඡන්දො අධිමොක්ඛො උද්ධච්චං මනසිකාරො ථීනං මිද්ධඤ්චාති ඉමෙ ඡ යෙවාපනකා පඤ්චසු සසඞ්ඛාරිකෙසු අකුසලෙසු උප්පජ්ජන්ති, අසඞ්ඛාරිකෙසු පඤ්චසු ථීනං මිද්ධං අපනෙත්වා සෙසා චත්තාරො හොන්ති, චතූසු දිට්ඨිගතවිප්පයුත්තෙසු ලොභසහගතෙසු මානො උප්පජ්ජති, ඉස්සා මච්ඡරියං කුක්කුච්චඤ්චාති ඉමෙ තයො ද්වීසු දොමනස්සසහගත චිත්තෙසු නානා හුත්වා උප්පජ්ජන්ති. විචිකිච්ඡාසහගතෙ උද්ධච්චං මනසිකාරො ච ද්වෙ උප්පජ්ජන්ති. උද්ධච්චසහගතෙ අධිමොක්ඛො මනසිකාරො ච ද්වෙ උප්පජ්ජන්ති.

## අකුසලචෙතසිකා නිට්ඨිතා.

—0—

කුසලවිපාකෙ චක්ඛුවිඤ්ඤාණෙ දසධම්මා හොන්ති ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා උපෙක්ඛා චිත්තෙකග්ගතා මනින්ද්‍රියං උපෙක්ඛින්ද්‍රියං ජීවිතින්ද්‍රියං මනසිකාරො චෙති, තයො රාසී හොන්ති, ඵස්සපඤ්චකරාසි ඣානඞ්ගරාසි ඉන්ද්‍රියත්තිකරාසි චෙති, සත්ත අසම්භින්නපදානි හොන්ති. ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං එකග්ගතා ජීවිතින්ද්‍රියං, පඤ්ච අවිභත්තිකානි, ඵස්සො සඤ්ඤා චෙතනා එකග්ගතා ජීවිතින්ද්‍රියං චෙති, ද්වෙ සවිභත්තිකානි, වෙදනා චිත්තඤ්චාති, සොතඝානජිව්හාවිඤ්ඤාණානි චක්ඛුවිඤ්ඤාණසදිසානි, කුසලවිපාකෙ කායවිඤ්ඤාණෙ සුඛා වෙදනා හොති, සුඛින්ද්‍රියං හොති, එත්තකං නානාකරණං, කුසලවිපාකෙ මනොධාතු සම්පටිච්ඡන චිත්ත විතක්කවිචාරෙහි සහ ද්වාදසධම්මා හොන්ති, සෙසං චක්ඛුවිඤ්ඤාණසදිසං, කුසලවිපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතු සොමනස්සසහගතචිත්ත පීතියාසහ තෙරසධම්මා හොන්ති,

---

(a) ඉස්සා, (පරසම්පත්තියෙහි අසහනලක්ෂණවූ) ඊර්ෂ්‍යාය; මච්ඡරියං, (ස්වසම්පත්තියෙහි මෙරමාහා අසාධාරණභාවලක්ෂණවූ) මාත්සර්ය— මා ඉදං අච්ඡරියං අඤ්ඤෙසං හොතූති මච්ඡරියං—ථීනං, (ආලම්බනග්‍රහණයෙහි චිත්තයාගේ ලීනභාවයකරණ) ථීනය; මිද්ධං, (වෙදනාදි ස්කන්ධත්‍රයාගේ අසාමර්ථ්‍යභාවය කරණ) මිද්ධය; කුක්කුච්චං, (කෘතාකෘතදුශ්චරිතසුචරිතානුශොචනලක්ෂණවූ) කුක්කුච්චය,

සුඛාවෙදනා හොති සොමනස්සින්ද්‍රියං හොති, එත්තකං නානාකර
ණං, කුසලවිපාකාහෙතුක මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතෙ
මනොධාතු සදිසාති අට්ඨමහාවිපාකචිත්තානි කාමාවචර කුසලසදි
සානි a. රූපාවචරවිපාකානි රූපාවචරකුසලසදිසානි, අරූපාවච
රවිපාකානි අරූපාවචර කුසලසදිසානි, චත්තාරි ලොකුත්තරවිපා
කානි ලොකුත්තර කුසලසදිසානි b. චතුත්ථෙ* විපාකෙ අඤ්ඤාතා
වින්ද්‍රියං හොති, එත්තකං නානාකරණං.

### කුසලවිපාකචෙතසිකා නිට්ඨිතා.

——o——

අකුසලවිපාකානි චක්ඛුසොතඝානජිව්හා විඤ්ඤාණානි කුස
ලවිපාකසදිසානි, ඉධ අනිට්ඨාරම්මණෙයෙව උප්පජ්ජන්ති. ඉදං තෙ
සං නානාකරණං, අකුසලවිපාකෙ කායවිඤ්ඤාණෙ දුක්ඛාවෙදනා
හොති, දුක්ඛින්ද්‍රියං හොති, එත්තකං නානාකරණං, සම්පටිච්ඡන
සන්තීරණානි චෙපි කුසලවිපාක සදිසානි.

### අකුසලවිපාකචෙතසිකා නිට්ඨිතා.

——(o)——

කිරියාහෙතුකමනොධාතු සම්පටිච්ඡනසදිසා. කිරියාහෙතුක
මනොවිඤ්ඤාණධාතුසොමනස්සසහගතෙ චිත්තෙ එකාදසධම්මා
හොන්ති, එසෙසා වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො වි
චාරො පීති සුඛං චිත්තෙකග්ගතා විරියින්ද්‍රියං සමාධින්ද්‍රියං මනින්ද්‍රියං

---

a "කුසලසදිසානි"යනු සවරූපයෙන් පාඨාගතයක් ගෙන කීහු.

b චතුත්ථෙවිපාකෙ, ප්‍රතිලොමානුලොමයෙන් සතරවනවූ සො
වාන්ඵලයහා රහත්ඵලයෙහි, අඤ්ඤාතාවින්ද්‍රියං හොති, යථාක්‍රම
යෙන් අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රියවේ.

ආජානාතීති අඤ්ඤා අඤ්ඤාතං අවති රක්ඛතීති අඤ්ඤාතාවී,
අඤ්ඤා ච අඤ්ඤාතාවීච අඤ්ඤාතාවිනො තෙසං ඉන්ද්‍රියං අඤ්ඤාතා
වින්ද්‍රියං, අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං චාති වුත්තං හොති.

ආදිමග්ගෙ අනඤ්ඤාත ඤ්ඤස්සාමීතින්ද්‍රියමහාවෙ,
මජ්ඣෙ අඤ්ඤින්ද්‍රියං අන්තෙ අඤ්ඤාතාවින්ද්‍රියමහාවෙ.

---

* අරහත්ත ඵලෙ, ආදශපොත්ථකෙ.

සොමනස්සින්ද්‍රියං ජීවිතින්ද්‍රියං චෙති, තයො රාසී හොන්ති, ඵස්සපඤ්චකරාසි ඣානපඤ්චකරාසි ඉන්ද්‍රියපඤ්චකරාසි චෙති, එකාදස අසම්භින්නපදානි හොන්ති, ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා චිත්තං විතක්කො විචාරො පීති චිත්තස්සෙකග්ගතා විරියින්ද්‍රියං ජීවිතින්ද්‍රියඤ්චාති, අට්ඨ අවිභත්තිකානි, ඵස්සො සඤ්ඤා චෙතනා විතක්කො විචාරො පීති විරියින්ද්‍රියං ජීවිතින්ද්‍රියඤ්චාති, තීනි සවිභත්තිකානි, වෙදනා චිත්තං එකග්ගතා චෙති. ඉමෙ තයො සවිභත්තිකා ධම්මා. චිත්තෙකග්ගතා තිට්ඨානිකා, වෙදනා තිට්ඨානිකා. කිරියාහෙතුක මනොවිඤ්ඤාණධාතු උපෙක්ඛාසහගතා ඉමෙහෙව සදිසා පීතිපරිහීන උප්පජ්ජති, අවසෙසානි කිරියචිත්තානි සභූමික කුසලසදිසානියෙව උප්පජ්ජන්ති, පඤ්චවිඤ්ඤාණෙසු මනසිකාරො එකො යෙවාපනකො උප්පජ්ජති, සෙසෙසු පරිත්තවිපාකකිරියෙසු ච අධිමොක්ඛො මනසිකාරො ජායන්ති, අට්ඨමහාවිපාකෙසු අට්ඨමහාකිරියෙසු ච මහග්ගතවිපාකකිරියචිත්තෙසු විරතිවජ්ජා සෙසා කුසලසදිසායෙව උප්පජ්ජන්තීති කාමාවචරවිපාකෙසු මහාකිරියෙසු ච තිස්සො විරතියො න උප්පජ්ජන්ති එකන්තකුසලත්තා(a). අප්පමඤ්ඤායො ච කාමාවචරමහාවිපාකෙසු න උප්පජ්ජන්ති එකන්තපරිත්තාරම්මණත්තා(b). චතූසු උපෙක්ඛාසහගතෙසු මහාකිරියෙසු කරුණාමුදිතා න දිස්සන්තීති වදන්ති, ලොකුත්තරවිපාකචිත්තෙසු කුසලසදිසා යෙව උප්පජ්ජන්ති.

කිරියචෙතසිකා නිට්ඨිතා.

---

(a) එකන්තකුසලත්තා, එකාන්තයෙන් කුසල්හෙයින්—

"තථා විරතියො තිස්සො න පාකෙ'තෙසු ජායරෙ,
පඤ්චසික්ඛාපදා වුත්තා කුසලාති හි සඤ්ඤුනා".

එතෙසුපන, මේ කාමාවචර විපාකයන් කෙරෙහි; තථා, එසේම; විරතියො තිස්සො, විරතීහු තුන්දෙන; න ජායරෙ, නොඋපදනාහුයි; කුමක්හෙයින්දයත්? පඤ්චසික්ඛාපදා, පඤ්චශික්ෂාපදයෝ; සඤ්ඤුනා. සර්වඥයන් විසින්; කුසලාතිහි, කුශලයෝමයයි; වුත්තා, කියනලදහ; (එහෙයිනැයි සේයි)— ඉදින් විරතීහු විපාකචිත්තයෙහි උපදිත් නම් බුදුහු පඤ්චශික්ෂාපදයන් අව්‍යාකෘතයයි වදුරන්නාහ

1 පඨවී ආපො තෙජො ච වායොධාතු තථෙව ච,
මහ භූතානි එතානි චත්තාරීති පවුච්චරෙ.

---

එසෙ හොවද්දුරා "පඤ්චසික්ඛාපද කුසලා එව"යි ශික්ෂාපදවිභඞ්ගයෙහි දෙසූහෙයින් විපාකචිත්තයෙහි විරතීහු නොඋපදිති යනු භාවයි.

(b) එකන්තපරිත්තාරම්මණත්තා, එකාන්තයෙන්ම කාමාවචරාලම්බනහෙයිනි—

පරිත්තාරම්මණත්තා ච තෙසමෙකන්තතො පන,
කරුණාමුදිතා තෙසු න ජායන්ති කදාචිපි.

තෙසං, ඒ විපාකන් තාමන්: එකන්තතො, එකාන්තයෙන්ම; පරිත්තාරම්මණත්තා, කාමාවචරධර්මයම අරමුණුකොට ඇතිහෙයින්; තෙසු, ඔවුන් කෙරෙහි; කරුණාමුදිතා, (සත්ත්වප්‍රඥප්තියම විෂයකොට උපදනාවූ) කරුණාමුදිතාදෙදෙනා; කදාචිපි, කිසිකලෙක්හිදු; න ජායන්ති, නොඋපදත්.

සිත්ශේෂි නිමි.

—o—

1 පඨවී; (සත්ථිඩලක්ෂණවූ) පෘථිවිධාතුවද; ආපො ච, (ද්‍රවලක්ෂණවූ) ආපොධාතුවද; තෙජො ච, (උෂ්ණත්වලක්ෂණවූ) තෙජොධාතුවද; වායොධාතු, (සමුදීරණලක්ෂණවූ) වායොධාතුවද යන; එතානි චත්තාරි, මොහු සතරදෙන; මහාභූතානීති, (දෙවබ්‍රහ්මාදීන්ගේ තිගාවුතාදිප්‍රමාණ ආත්මභාව වශයෙන් මහත්ව පහළවූ බැවින්ද නැත්තක්ඇතිකොට දක්වන මායාකාරවූ මහාභූතසාදෘශ්‍යයෙන්ද අනිෂ්ටදෘශ්‍යසර්පාස ඈ ගිව යක්ෂමහාභූතයන් වැනිහෙයින්ද ව්‍යක්තකාව්‍යයෙහි යක්ෂිණීමහාභූතසාදෘශ්‍යයෙනද) මහාභූතයහයි; පවුච්චරෙ, කියනු ලැබෙත්.

"මහන්තා පාතුභූතාති මහ භූතසමාති වා.
වඤ්චකත්තා අභූතාන මහාභූතාති සම්මතා,

මහන්තා පාතුභූතාති; (මහාපෘථිවි සමුද්‍ර නරක වජ්‍ර චක්‍රවාතාදි ප්‍රමාණයෙන් හා රාහු තිමි තිමිඞ්ගිලාදීන්ගේ අනේක සහශ්‍රයොජනිකාදි ආත්මභාවප්‍රමාණයෙන්) මහත්ව පහළවුනුයි කියා ද; මහාභූත සමාතිවා, (නැත්තක් ඇතවත් කොට දක්වන හෙයින්

2 චක්ඛු සොතඤ්ච ඝානඤ්ච ජිව්හා කායො තථෙව ච,
වණ්ණො සද්දො රසො ගන්ධො ඉත්ථිපුරිසින්ද්‍රියං තථා.

හා යොකිය හැක්කාවූ ස්ථාන ඇත්තේහයින්) මායාකාර මහාභූත යක්ෂමහාභූතයන් හා සමයෝත්‍රායි කියාද; අභූතෙන, අවිද්‍යමානවූ ආකාරයෙන්; වඤ්චකත්තා, (යක්ෂිණී මහාභූතයන් මෙන්) වඤ්චාකරණ හෙයින්ද; මහාභූතාති, මහාභූතයයි; සම්මතා, සලකනලදනු.

පඨවී පත්ථටත්තා ච වායො වායනතො තථා ච,
තෙජො තෙජෙති රූපානි ආපො ආපෙති පාලනා".

පත්ථටත්තා, පලල් හෙයින්; පඨවීහවෙ, පෘථිවී නම් වෙයි; වායනතො, වයනබැවින්; වායොහවේ, වායු නම් වෙයි; තෙජෙතීති, (සහජාතරූපයන්) තියුණු කෙරේනයිකියා; තෙජොහවෙ, තෙජ නම්වෙයි; පාලනා, (මලිනනොවියදී) රක්ෂාකිරීමෙන්; රූපානි, රූපයන්; ආපෙතීති, වඩානුයිකියා; ආපො හවෙ, ආප නම් වේ.

2 චක්ඛු, (සසම්භාරචක්ෂුසෑ ශ්වෙතමණ්ඩලමධ්‍යගත කෘෂ්ණමණ්ඩලමධ්‍යයෙහි සප්තාක්ෂිපටලව්‍යාප්ත තෙලයක්මෙන් සප්තාක්ෂිපටලයෙහි ව්‍යාප්තව ධාරණබන්ධනපරිපාචන සමුදීරණකෘත්‍යඇති චතුර්විධ ධාතූන්විසින් කෘතොපකාරව සෘතු චිත්තාහාරයෙන් උපස්තම්භ්‍යමානව ජීවිතෙන්ද්‍රියෙන් සංරක්ෂ්‍යමාණව වර්ණාදීන්විසින් පරිවෘතව යූකාශිර්ෂප්‍රමාණස්ථානයෙහි, චක්ෂුර්විඥානාදීන්ට වස්තුවාරභාව සාධමින් පවත්නා දුෂ්ටුකාමතාසඞ්ඛ්‍යාත රූපතෘෂ්ණාව හෘදය කොට ඇති කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාදලක්ෂණවූ) චක්ෂුඃප්‍රසාදය-

"යෙන චක්ඛුප්පසාදෙන රූපානි මනු පස්සති,
පරිත්තං සුඛුමං එතං ඌකාසිරසමූපමං".

යෙන චක්ඛුප්පසාදෙන, යම් චක්ෂුඃප්‍රසාදයක් කරණකොට ගෙන; මනු, සත්ත්වතෙම; රූපානි පස්සති, රූපයන් දක්නේද; එතං, මේ චක්ෂුඃප්‍රසාදය; පරිත්තං, ස්වල්පය; සුඛුමං, සියුම; ඌකාසිරසමූපමං, (උකුණුහිසක් පමණ ප්‍රදෙශයෙහි පැතිර සිටිහෙයින් ප්‍රමාණයෙන්) උකුණුහිසක් සදෘශොපමානා ඇත්තේයි.

සොත ඝාන ජිව්හා කාය යන මේ සතරෙහිද "ධාරණ බන්ධන" යන්නෙහි පටන් "වණ්ණාදීන් විසින් පරිවෘතව" යනු දක්වා මතු කියන අර්ථ එක්කොට සුදුසුපරිද්දෙන් යොදා කියයුතු--- සොතඤ්ච, (ශ්‍රොත්‍රබිලය ඇතුළත සිහින් තඹමුන්දක්වැනි තුඩු තඹලොමයෙන් ගැවසීගත්තාවූ තන්හී ශ්‍රොත්‍රවිඥානාදීන්ට වස්තුද්වාරභාව සාධමින් පවත්නා ශ්‍රොතුකාමතාසඞ්ඛ්‍යාත ශබ්දතෘෂ්ණාව නිදානකොට ඇති කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාද ලක්ෂණවූ) ශ්‍රොත්‍රප්‍රසාදයද; ඝානඤ්ච. (නාසිකාභ්‍යන්තරයෙහි අජපදසණ්ඨාන ප්‍රදේශයෙහි අභිව්‍යාප්තව ඝ්‍රාණවිඥානාදීන්ට වස්තුද්වාරභාව සාධමින් පවත්නා ඝ්‍රාතුකාමතාසඞ්ඛ්‍යාත ගන්ධතෘෂ්ණාව නිදානකොටඇති කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාද ලක්ෂණවූ) ඝ්‍රාණප්‍රසාදයද; ජිව්හා, (ජිහ්වාමධ්‍යයෙහි උත්පලදලාග්‍රාකාර සංස්ථානයෙහි අභිව්‍යාප්තව ජිහ්වාවිඥානාදීන්ට වස්තුද්වාරභාව සාධමින් පවත්නා සායිතුකාමතාසඞ්ඛ්‍යාත රසතෘෂ්ණාව නිදානකොට ඇති කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාද ලක්ෂණවූ) ජිහ්වාප්‍රසාදයද; කායො, (කෙශාග්‍රනඛාග්‍ර ශුෂ්කචර්මවර්ජිත සකල ශරීරයෙහි තිලබීජයෙහි පතල තෙලක්මෙන් ව්‍යාප්තව කායවිඥානාදීන්ට වස්තුද්වාරභාව සාධමින් පවත්නා ඵුසිතුකාමතා සඞ්ඛ්‍යාත ස්ප්‍රෂ්ටව්‍ය තෘෂ්ණාව නිදානකොට ඇති කර්මයෙන් සමුද්භූත භූතප්‍රසාද ලක්ෂණවූ) කායප්‍රසාදයද; වණ්ණො. (විඥානොත්පත්ති හෙතුභාවයෙන් චක්ෂුඃ ප්‍රතිඝාතන ස්වභාවවූ) වර්ණායතනයද; සද්දො, විඥානොත්පත්තිහෙතුභාවයෙන් ශ්‍රොත්‍රප්‍රතිඝාතන ස්වභාවවූ) ශබ්දායතනයද; රසො, (විඥානොත්පත්තිහෙතුභාවයෙන් ජිහ්වාප්‍රතිඝාතනස්වභාවවූ) රසායතනයද; ගන්ධො. (විඥානොත්පත්තිහෙතුභාවයෙන් ඝ්‍රාණප්‍රතිඝාතනස්වභාවවූ) ගන්ධායතනයද; ඉත්ථිදන්ද්‍රියං පුරිසින්ද්‍රියං තථා. (ස්වකීය කර්මාදි ප්‍රත්‍යයෙන් උපදනාවූ බාහුල්‍යයෙන් ස්ත්‍රීපුරුෂෙන්ද්‍රිය සහිත සන්තානයෙහි යථාතත්‍වාකාරයෙන් පවත්නා ස්ත්‍රීපුරුෂ ලිඞ්ගනිමිත්තාකල්පාදියට හෙතුභාවයයි කියනලද ආධිපත්‍යය කරණ) ස්ත්‍රීපුරුෂෙන්ද්‍රියද—

"ලිඞ්ගං සණ්ඨානාදීසණ්ඨානං නිමිත්තං මිහිතාදිකං,
කුත්තං සුපපාදනා කීළා ආකප්පො ගමනාදිකං".

සණ්ඨානාදීසණ්ඨානං, (ස්ත්‍රීපුරුෂයන්ගේ) හස්තපාදාදිසංස්ථානය; ලිඞ්ගං, ලිඞ්ග නම් වෙයි; මිහිතාදිකං, සිනාආදිය; නිමිත්තං. නිමිත්ත

3 ජීවිතං චෙව විඤ්ඤත්ති ආකාසො ලහුතාපි ච.
මුදු කම්මඤ්ඤතා චෙව උපචයො සන්තතී ජරා.

නම්වෙයි; ඛුප්පාදිනා කීළා, (බාලකාලයෙහි) කුලුආදීන් කෙළීම ඛුපාණං, කෘත්‍ය නම්වෙයි; ගමනාදිකා විශදවිශදවූ ගමනාගමනාදී ඉද්ධ්‍යාදිය; ආකප්පො, ආකල්පනම්වේ:

3 ජීවිතං, (උත්පලාදීන්ට දණ්ඩගත ජලයමෙන් තමා විද්‍යමාන ක්‍ෂණයෙහි සහජාත කර්මජරූප පරිපාලනයෙහි ආධිපත්‍යය කරණ) ජීවිතෙන්ද්‍රියද; චෙව විඤ්ඤත්ති; (අභික්කමපටික්කමාදි ජනක චිත්තජ වායොධාතුහුගේ රූපසන්තමන චලනධාරණාදි කෘත්‍යයට සහකාරිකාරණවූ වායුධාත්වධික චිත්තජමහාභූතයන්ගේ ආකාර විශෙෂයයි කියනලද කායවිඥප්තියද වාග්විශෙෂජනක චිත්තජපෘථිවීධාතුවයේ අක්‍ෂරොත්පත්තිස්ථානසංඝට්ටිත කර්මජරූපයන්ගේ ඝට්ටනකෘත්‍යයට සහකාරිකාරණවූ පෘථිවීධාත්වධික චිත්තජමහාභූතයන්ගේ විකාරයයි කියනලද වාග්විඥප්තියද යන) විඥප්තීහු දෙදෙන—

“චක්ඛුතො චලමානස්ස වණ්ණං දිස්වාන චක්ඛුනා,
විඤ්ඤත්ති මනසා ඤෙය්‍යා සාඛාකම්පාදිවානිලො.

චලමානස්ස චක්ඛුතො, සැලෙන්නාවූ හස්තපාදාදි වස්තුහුගේ; වණ්ණං, වර්ණය; චක්ඛුනා. (විඥානාධිෂ්ඨිත) චක්‍ෂුඃප්‍රසාදයෙන; දිස්වාන, දැක; මනසා. මනොද්වාරික චිත්තයෙන්; විඤ්ඤත්ති, විඥප්තී තොමෝ; ඤෙය්‍යා, (මනොද්වාරික ජවනයෙන්) දතයුත්තීය, කුමක් මෙන්දයත්? සාඛාකම්පාදී, අතුසැලීම්ආදිය දැක; අනිලොඉව, (මනොද්වාරිකචිත්තයෙන් දතයුතු) වාතයමෙනි,

චිත්තජස්ස හි භූතස්ස විඤ්ඤත්ති චිත්තජා මතා
තස්මිං චලන්තෙ තනුට්ඨා චලන්ති තිසමුට්ඨිතා;

චිත්තජස්ස හි භූතස්ස, චිත්තජ මහාභූතයාගේ; විඤ්ඤත්ති, විඥප්තිතොමෝ; චිත්තජා මතා, චිත්තජයයි දන්නාලදු; තස්මිං, ඒ සවිඥප්තිකවූ චිත්තජමහාභූතයා; චලන්තෙ, සැලෙනකල්හි; තනුට්ඨා. එහි පිහිටියාවූ හෙවත් චිත්තජමහාභූතයන් හා එකාබද්ධවූ; තිසමුට්ඨිතා, අවශෙෂත්‍රිජරූපයෝ; චලන්ති, සැලෙත්.

ලඞ්ඝිත්වානමුපත්ථම්භා මෙකාවජ්ජනවීථියං.
හෙට්ඨාජ්ඣානිපි චිත්තානි වායොධාතු සමුට්ඨිතා.

සත්තමෙන තු චිත්තෙන වායොධාතු සමුට්ඨිතා,
චාලෙති සහජං රූපං විඤ්ඤත්තිසහිතා'නතා.

එකාවජ්ජනවීථියං, එකාවර්ජනවීථියෙහිලා; හෙට්ඨා ඣානිපි චිත්තානි, යට උපන්නාවූ ජවන්සිත්ම; සමුට්ඨිතා, උපන්නාවූ; වායොධාතු, වායොධාතුව; උපත්ථම්භං ලඞ්ඝිත්වා, උපස්තම්භයක් ලදීන්— සත්තමෙන තු චිත්තෙන, සත්වනවූ ජවනචිත්තයෙන්; සමුට්ඨිතා, උපනනාවූ; විඤ්ඤත්තිසහිතා, විඥප්තිසහිතවූ; වායොධාතු, වායොධාතු තොමෝ; අනතා සහජං රූපං, තමාහා සමග උපන් නාවූ චිත්තජරූපය; චාලෙති, සලන්නීයි.

සද්දො න චිත්තජො අත්ථි විනා විඤ්ඤත්තිඝට්ටනං,
ධාතුසංඝට්ටනෙනෙව සහ සද්දො තු ජායති.

විඤ්ඤත්තිඝට්ටනං විනා, විඥප්තිය හා කණ්ඨාදි අක්ෂරොත්පත්තිස්ථානගතවූ කර්මජභූතයන්ගේ අන්‍යොන්‍යසඞ්ඝර්ෂණයක් හැර උපන්නාවූ; චිත්තජො සද්දො, චිත්තජශබ්දයෙක්; න අත්ථි, නොම ඇති; ධාතුසංඝට්ටනෙනෙව සහ. කර්මජවූ පෘථිවිධාතුවගේ සංඝර්ෂණ සහා සමග; සද්දොතු, චිත්තජශබ්දය වනාහි; ජායති; උපදී.

විඤ්ඤාපෙතීති කායෙන වාචාය ච විචින්තිතං,
සයං විඤ්ඤායති චාති විඤ්ඤත්තීති පකාසිතා.

කායෙන, චලමානවූ කයකරණකොටගෙනද; වාචාය, වචනය කරණකොටගෙනද; විචින්තිතං, සිතුවා; විඤ්ඤාපෙතීති. හඟවානුයි කියාද; සයංච, තොමෝද; විඤ්ඤායතීති, දන්නාලැබේනුයි කියාද; විඤ්ඤත්තීති, විඥප්තියයි; පකාසිතා, ප්‍රකාශකරණලද.

සා විඤ්ඤාපනතො චෙව සයං විඤ්ඤෙය්‍යතොපිච,
විඤ්ඤත්තීති සියා තස්සා සම්භවො කාරකචයෙ.

සා, ඒ විඥප්තිතොමෝ; විඤ්ඤාපනතො චෙව, හෘදයගතවූ අභිප්‍රාය හඟවනහෙයින්ද, සයංවිඤ්ඤෙය්‍යතොපිච, තමාදන්නාල බනහෙයින්ද; විඤ්ඤත්තීති, විඥප්තියයි; තස්සා, ඒ විඥප්තියගේ

හෙවත් විඥප්තිශබ්දයාගේ; කාරකාවයෙ, කර්මකාරකය කර්තෘකාරකය යන කාරකාවයෙහි; සමෙගොවො සියා, නිෂ්පන්නය වන්නේයි"–

ආකාසො, (කර්මාදි එකෙකි ප්‍රත්‍යයෙන් සමුත්ථිතවූ චක්ෂුර්දශකාදි කලාපයන් කලාපාන්තරයා සඞ්කරනොවනපරිද්දෙන් පිරිසිඳිනා ස්වභාවවූ) අකාශධාතුවද—

"න කස්සතීති ආකාසො රූපානං විවරො පන,
යො රූපානං පරිච්ඡෙදෙ ස්වාකාසොති පවුච්චති.

රූපානං: (සමූහසන්තානවශයෙන් ප්‍රවෘත්තවූ) රූපධර්මයන්ගේ; විවරො පන. (කර්ණනාසාච්ඡිද්‍ර කණ්ඨගුහාදි) විවරයවනාහි; න කස්සතීති. නොලියනුලැබේනුයි (නොහිරිය හැකිනුයි); ආකාසො, ආකාශනම් වේයි; රූපානං, චක්ෂුර්දශකාදි කලාපරූපයන්ගේ; පරිච්ඡෙදෙ. (කලාපාන්තර රූපයන්හා මිශ්‍රනොවනපරිද්දෙන්) යම් පිරිසිඳීමෙක් ඇද්ද; සො, හෙතෙම; ආකාසොති, ආකාශයයි; පවුච්චති, (මේ උපාදාරූපයන්කෙරෙහි) කියනුලැබේ"—

ලහුතාපිච. (සත්ප්‍රාය සෘතුචිත්තාහාර ප්‍රත්‍යය ප්‍රතිලාභයෙන් ලඝුප්‍රවෘත්තව නිෂ්පන්න රූපයන්ගේ වන්නාවූ දිවසසන්තාපිත අයඃස්කන්ධයක්මෙන් සැහැල්ලුබවයයි කියනලද) ලඝුතාවද; මුදුතාච, (සුපරිමර්දිත චර්මයක්මෙන් නොදැඩිබවයයි කියනලද) රූපමෘදුතාවද; කම්මඤ්ඤතාච, (සුතප්ත කනකයක්මෙන් ශරීරයෙහි කටයුතු ක්‍රියාවට අනුකූලබවයයි කියනලද) රූපකර්මණ්‍යතාවද; උපචයො, (නදීතීරයෙහි බන කූපයාගේ උදකොද්ගමනයෙන් සම්පූර්ණතාව මෙන් උත්පද්‍යමාන අධ්‍යාත්මිකාදශරූපයන්ගේ මතුමත්තෙහි උත්පත්තිවශයෙන් අභිවෘද්ධියයි කියනලද) උපචයද; සන්තති, (පරිපූර්ණකූපයෙන් ඉතිරි උදකයාගේ බහිර්ගමනයක් මෙන් උපචිතක්‍රමයෙන් උපචිත රූපයන්ගේ පුනඃපුනඃප්‍රබන්ධොත්පත්ති වශයෙන් උත්පත්තියයි කියනලද) සන්තතියද.

"රූපානමාචයො යොහි වුච්චතා උපචයොති සො,
අනුප්පබන්ධතා තෙසං සන්තතීති පවුච්චති.

රූපානං, රූපයන්ගේ; යො ආචයො, යම්පළමුවාභිවෘද්ධියෙක් ඇද්ද; සො, හෙතෙම, උපචයොති වුච්චති, උපචයයි කියනලදී; තෙසං, ඒ උපචිතරූපයන්ගේ; අනුප්පබන්ධතා, පුනරුත්පත්තිවශයෙන් නොසිඳී පැවැත්මතෙම; සන්තතීති, සන්තතියයි; පවුච්චති, කියනුලැබේ.

4 අනිච්චතාච ඔජා ච වත්‍ථුරූපං තථේව ච,
චතුවීසති එතානි උපාදානි පවුච්චරේ.

---

අත්‍ථතො උභයමෙතං ජාතිරූපනති දීපිතං,
වුත්තමාකාරනානත්තා වෙනෙය්‍යානං වසෙන වා.

එතං උභයම්පි, මේ උපචය සන්තතිරූපචයද; අත්‍ථතො, වස්තුහෙයින්; ජාතිරූපනති, ජාතිරූපයයි; දීපිතං, දක්වනලදී; කුමක්හෙයින් ජාතිරූපය ද්විප්‍රකාර කොට කියනලද්දයත්? ආකාරනානත්තා,(ප්‍රථමාභිවෘද්ධි ප්‍රබන්ධප්‍රවෘත්තියයි කියනලද) ආකාරවිශෙෂයෙන් හෝ; වෙනෙය්‍යානං වසෙනවා, (ඒ ඒ නාමයෙන් දෙසූකල්හි ජාතිරූපය අවබොධකරන්නාවූ) විනෙයජනයන්ගේ අධ්‍යාශය වශයෙන් දැවුත්තං,(උපචයසන්තතියයි ද්විප්‍රකාරකොට)කියනලදී"–

ජරා, (රූපයන්ගේ උත්පාදවස්ථායෙන් මතුයෙහි භඞ්ගාභිමුඛාවස්ථායයි කියනලද) ජරතාවද—

"දුවිධායං ජරානාම පාකටා පාකටාති ච,
පාකටා රූපධම්මෙසු අරූපෙසු අපාකටා.

අයං ජරානාම, ජරානම්වූ මේතොමෝ; පාකටා පාකටානිච, ප්‍රකට ප්‍රකට ජරායයි; දුවිධා, ද්විප්‍රකාරවෙයි; රූපධම්මෙසු. රූපධර්මයන් කෙරෙහිවූ ජරාතොමෝ; පාකටා, ප්‍රකටජරානම්වෙයි: අරූපෙසු, අරූපධර්මයන් කෙරෙහිවූ ජරාතොමෝ; අපාකටා, අප්‍රකට ජරානම්වේ".

4 අනිච්චතාච, (භඞ්ගනිම්නරූපයන්ගේ ප්‍රභෙද ස්වභාවවූ) අනිත්‍යතාවද; ඔජාච, (රසෙන්ද්‍රියකායොපස්තම්භහෙතු ව යාපනස්වභාව් වූ අඞ්ගප්‍රත්‍යඞ්ගානුසාරී රස සාරයයි කියයලද) අභ්‍යවහාර්‍යයීමාණ අන්නාදි වස්තූන්ගේ සෙනහයද—

"යාය ඔජාය යාපෙන්ති යත්‍ථ යත්‍ථ ච පාණිනො,
අයන්තු කබලිංකාරො ආහාරොති පවුච්චති.

යත්‍ථ යත්‍ථ ච පාණිනො, යම් යම් තැනෙකහි සත්ත්වයෝ; යාය ඔජාය, යම් ඔජාවෙකින්; යාපෙන්ති, යපෙද්ද; අයන්තු මේ ඔජාතොම; කබලිංකාරො ආහාරොති, (තමාට නිශ්‍රයවූ කබලකොට අනුභවකටයුතුහෙයින් කබලිංකාරාහාරනම්වූ අන්නපානාදි වස්තූන්ගේ නාමයෙන්)කබලිංකාරාහාරයයි; පවුච්චති, කියනුලැබේ"–

වත්ථුරූපං. (හෘදයකොශමධ්‍යයෙහි අඩපතක් පමණ රුධිර යෙහි සතරමහාභූතයන් නිසා පැවති චක්ෂුර්විඥානාදි වස්තූහු චක්ෂූ රාදීන්මෙන් මනොධාතු මනොවිඥානධාතූන් දෙදෙනාට වස්තුමාර භාව සාධමින් පවත්නා) හෘදයවස්තුවද--

“යං නිස්සාය මනොධාතු මනොවිඤ්ඤාණධාතු ච,
වත්තන්ති පඤ්චවොකාරෙ තං වත්ථූති පවුච්චති.

පඤ්චවොකාරෙ, පඤ්චවොකාරභවයෙහි; යං නිස්සාය, යම් රූපයක් නිසා; මනොධාතු මනොවිඤ්ඤාණධාතු ච, මනොධාතුද මනොවිඥානධාතුද යන මොහු දෙදෙන; වත්තන්ති, පවතිද්ද; තං, ඒ රූපය; වත්ථූති, හෘදයවස්තුයයි; පවුච්චති, කියනුලැබේ.

මජ්ඣෙ හදයකොසම්හි අඩ්ඪපසතලොහිතෙ,
භූතරූපමුපාදාය චක්ඛාදී විය වත්තති.

මජ්ඣෙ හදයකොසම්හි, දෙඹපතක්වැනි හෘදයකොශමධ්‍යයෙහි සිටි; අඩ්ඪපසතලොහිතෙ, කුළුදුල්ලක්පමණලෙයෙහි; භූතරූපං, කර්මජ භූතරූපය; උපාදාය, නිසා; චක්ඛාදිවිය, චක්ෂුඃප්‍රසාදාදීන්මෙන්; වත්තති, (හෘදයවස්තුරූපය) පවත්නේයි.

වස්ත්වාශ්‍රයොර්මයොර්ධාත්වො රූපාවබද්ධවෘත්තිතඃ,
දෘග්ධීවත්තාවුපදාය රූපාශ්‍රයෞ භවද්වයෙ.

වස්ත්වාශ්‍රයොඃ, වස්තුව ඇසුරුකොට පවත්නාවූ; මයොර් ධාත්වොඃ, මනොධාතු මනොවිඥානධාතූන් දෙදෙනාගේ; රූපාවබද්ධ වෘත්තිතඃ, රූපප්‍රතිබද්ධවූ ප්‍රවෘත්ති ඇති; තෞ, ඒ සවිස්තුකවූ මනො ධාතු මනොවිඥානධාතූහු දෙදෙන; දෘග්ධීවත්, ඕඩඥානයමෙන්; භ වද්වයෙ, කාමරූපභවදෙක්හි; උපාදායරූපාශ්‍රයෞ නිෂ්පන්න උපාදා රූපයක්ම පිහිටකොට ඇත්තාහුයි.

තද්වස්තුභාවාත්කර්මොත්ථං දෘග්වත්ප්‍රතිනියතක්‍රියම්,
හෘදඃ බෙදූචව විනාතායාං තත්‍රස්ථිති ගම්‍යතෙ.

තත්, ඒ හෘදයරූපය තෙම; දෘග්වත්, චක්ෂුර්වස්තුවමෙන්; වස්තුභාවාත්, මනොධාතු මනොවිඥානධාතූන් දෙදෙනාට පිහිටව නහෙයින්; කර්මොත්ථං, කර්මජය; ප්‍රතියතක්‍රියම්, ප්‍රතිනියතකෘත්‍ය

ඇත්තේය; චිත්තායාම්,සූක්‍ෂම පීඩිතකල්හි; හෘදඃ බෙදුවව. හෘදය කම්පාවන හෙයින්ද; තත්‍රස්ථමිති, හෘදයකෝශ මධ්‍යයෙහි සිටියේ යසි; ගම්‍යතෙ, දත්තාලැබේ”—

උපාදාති පවුච්චරෙ, (සතරමහාභූතයන් නොහැරනිසා පව ත්නා හෙයින්) උපාදාරූපයහයි කියනුලැබෙත්--

“මහාභූතානි නිස්සාය අමුඤ්චිත්වා පවත්තතො,
උපාදාරූපම්ච්චාහ නිරූපාදානමානසො,

මහාභූතානි නිස්සාය, සතරමහාභූතයන්නිසා; අමුඤ්චිත්වා, ඔවුන්නොවූත් නොහැරම; පවත්තතො, පවත්නාහෙයින්; උපාදාරූපම්ති, උපාදාරූපයයි; නිරූපාදානමානසො, කාමාදි උපාදානයන් හැත්තාවූ චිත්තසන්තානඇති සර්වඥතෙම; ආහ, කීය.

ජලාදෙරාශ්‍රිතස්‍යාපි නාසත්‍යුපාදායරූපතා,
රූපාදීනාං ස්වරූපෙණ නිශ්‍රයත්වාවධාරණාත්.

ආශ්‍රිතස්‍යාපි, පෘථිවිධාත්වාදීන් ආශ්‍රයකොට පවත්නාවූද; ජලාදෙඃ අබ්ධාත්වාදි භූතරූපයාගේ; උපාදායරූපතා, උපාදායරූපත්වය; නාස්ති, නැති; කුමක්හෙයින්දයත්? රූපාදීනාම්, වර්ණායතනාදීන්ම; ස්වරූපෙණ, ස්වරූපහෙයින්; නිශ්‍රයත්වාවධාරණාත්, භූතරූපයන්ගේ නිශ්‍රයත්වයම නියතහෙයිනි-- “උපාදායෙව පවත්තං”යි නිශ්‍රයකොට නිශ්‍රිතවූ රූපයාගේ උපාදාරූපත්වය කියනලද හෙයින් නිශ්‍රයත්වයෙහි නියතවූ භූතරූපයෝ ඔවුනොවුන් ආශ්‍රයකරන්නාහුද උපාදාරූපනම් නොවෙත්* යනුභාවයි.

සමස්තානි හි භූතානි යත්ප්‍රතීත්‍යොපපද්‍යතෙ,
තස්‍යොපාදායරූපත්වම්බාද්‍යා නාත්මනිශ්‍රිතාඃ.

හි, එසේමැයි; යත්, යම්රූපයක්තෙම; සමස්තානි භූතානි, සියලුසතරමහාභූතයන්ම; ප්‍රතීත්‍ය, නිසා; උපපද්‍යතෙ, උපදීද; තස්‍ය, ඒරූපයාගේ; උපාදායරූපත්වම්, උපාදායරූපත්වයවන්නේය; අබාද්‍යාඃ, අබ්ධාත්වාදීහු; ආත්මනිශ්‍රිතාඃ න, ආත්මනිශ්‍රිත නොවෙත්-- තමූ තමානිසා පවත්නාහු නොවෙති එහෙයින් භූතරූපයෝ උපාදාරූප නම් නොවෙති යනු මෙහි සාභිප්‍රායාර්ථයි”.

* “වෙයි” හැම.

5 බලසම්භවජාතී ච රෝගරූපඤ්චයං මතං,
වායුවාරිචය භෙදෙහි සඞ්ගහිතානි යථාක්කමං.

6 රූපං සද්දෝ ගන්ධරසා පඨවී ච තථෙව ච,
තෙජො වායො ච එතානි පඤ්ච චක්ඛාදිකානිච.

7 සප්පටිඝානි වුච්චන්ති තථා ඔළාරිකානි ච,
සොළස අවසෙසානි සුඛුමාප්පටිඝානි ච.

8 චක්ඛාදිකානි පඤ්චෙව අජ්ඣත්තිකානි වුච්චරෙ,
තෙවීසති අවසෙසානි බාහිරානෙව හොන්තිහි.

---

5 බල. බලරූපයද; සම්භව, සම්භවරූපයද; ජාති, ජාති රූපයද; රෝගරූපඤ්ච, රෝගරූපයද යන; යං, යම් ධර්මකෙනෙක්; මතං, (අනුන් විසින්) සලකනලදහුද; (තානි, ඔහු;) යථාක්කමං, පිළිවෙළින්; වායු, (බලනම් වායුධාතුහුගේ විස්තාරයක් බැවින් බල රූපය) වායුධාතුවෙන්ද; වාරි, (සම්භවනම් කාමභවයෙහි සමහර සත්ත්වකෙනෙකුන්ට ඉන්ද්‍රියපරිපාකයෙන් වන අබ්ධාතුහුගේම ප්‍රවෘත්ත්‍යාකාර විශේෂයක්බැවින් සම්භවරූපය)අබ්ධාතුවෙන්ද; චය, (උපචය සන්තති විනිර්මුක්ත ජාතියක්නැතිබැවින් ජාතිරූපය) උපචය සන්තතිචයෙන්ද; භෙදෙහි (රූපයන්ගේ ස්ථිතිභඞ්ගක්ෂණයෙහිවූ විකාරාවස්ථාව රෝගනම් වන බැවින් රෝගරූපය) ජරතා අනිත්‍යතාවෙන්දැයි; සඞ්ගහිතානි, සංග්‍රහකරණලදහු.

7 සප්පටිඝානි, (විෂයවිෂයී සංඝට්ටනයයි කියනලද ප්‍රතිඝනතය හා සමග පවත්නාහෙයින්) සප්‍රතිඝරූපයෝහයිද; ඔළාරිකානිච, (වාරාලම්බන භාවයෙන් පාකට හෙයින්) ඖදාරිකයෝහයිද.

8 අජ්ඣත්තිකානි, (චිත්තසඞ්ඛ්‍යාත ආත්මයනිසා වාරභාවයෙන් පැවැත ආත් ග්‍රාහයට විශේෂකාරණහෙයින්) ආධ්‍යාත්මිකයහ-- චිත්තසඞ්ඛාතමත්තානං අධිකිච්ච උද්දිස්ස වාරමත්තං. අජ්ඣත්තං-- බාහිරානි, (උක්තප්‍රකාර ආධ්‍යාත්මිකරූපයන්කෙරෙන් පිටත්වූහෙයින්) බාහ්‍යරූපනම්වෙත්.

9 රූපං සනිදස්සනං වුත්තං අවසෙසානිදස්සනං,
සත්තවීස විධං හොති තං සබ්බං පරිපිණ්ඩිතං,

10 අට්ඨින්ද්‍රියානි චක්ඛුඤ්ච කම්මෙනෙව භවන්ති හි,
විඤ්ඤත්තියො තථා චෙපි චිත්තෙනෙව භවන්ති හි.

11 සද්දො උතුඤ්ච චිත්තඤ්ච උපාදාය ජායතෙ හි සො,
ලහුතා චෙව මුදුතා කම්මඤ්ඤතා තථෙව ච;
උතුං චිත්තඤ්ච ආහාරං උපාදාය පභවන්ති හි.

12 වණ්ණො ගන්ධො රසො චෙව පඨවී තෙජො ච මාලුතො,
උපචයො සන්තති ආපො ඔජා'කාසං චතුබ්භි තු.

13 චිත්තං චිත්තජරූපානං උප්පාදෙ හොති පච්චයො,
චිත්තස්ස තික්ඛණෙ කම්මං උතු ඔජා ඨිතික්ඛණෙ.

---

9 සනිදස්සනං, (චක්ෂුර්විඥානයට විෂයභාවයයි කියනලද නිදර්ශනය හා සමඟ පවත්නාහෙයින්) සනිදර්ශනයයිද– දට්ඨබ්බභාව සඞ්ඛාතෙන සහ නිදස්සනෙනාති සනිදස්සනං, දට්ඨබ්බභාවො චක්ඛුවිඤ්ඤාණස්ස විසයභාවො– අනිදස්සනං, (උක්තවිපර්යාසයෙන්) අනිදර්ශනයයිද.

11 උතුඤ්ච, (ස්ථිතිප්‍රාප්ත) ඍතුවද; චිත්තඤ්ච, (ජාතමාත්‍ර) චිත්තයද; ආහාරං, (ස්ථිතිප්‍රාප්ත) ඕජාවද.

13 චිත්තං, (ආරූප්‍යවිපාක පඤ්චවිඥානවර්ජිත රූපොත්පාදක පඤ්චසප්තතිවිධ) චිත්තයතෙමේම; උප්පාදෙ (අනන්තර සමනන්තරොපනිශ්‍රය * නාස්ති විගත ප්‍රත්‍යයප්‍රතිලාභයෙන් උත්පාදක්ෂණයෙහිම බලවත්වනහෙයින්) ආත්මොත්පත්තික්ෂණයෙහිම; චිත්තජරූපානං, ශුද්ධාෂ්ටකාදි චිත්තජරූපයන්ට; පච්චයො හොති, ජනක ප්‍රත්‍යය වේ; කම්මං, (කුශලාකුශල කර්මවශයෙන් කාමාවචර රූපාවචර පඤ්චවිංශතිවිධවූ චෙතනාලක්ෂණවූ) කර්මයතෙමේම; චිත්තස්ස, (ප්‍රතිසන්ධියෙහි පටන් ච්‍යුතියෙන් යට සත්තලොස්වන චිත්තය දක්වා උත්පන්නමාත්‍ර සකල) චිත්තයාගේ; තික්ඛණෙ, (උත්පාදස්ථිතිභඞ්ග වශයෙන්) ක්ෂණත්‍රයෙහි; පච්චයො හොති. (චක්ෂුර්දශකාදි කර්මජ රූපයන්ට) ජනකප්‍රත්‍යයවෙයි; උතුඔජා. ශීතොෂ්ණ සඞ්ඛ්‍යාත තෙජොධාතුවද අභ්‍යවහරිතාහාරසන්නිශ්‍රිත ඔජවද යන මොහු

* "සමනන්තරානන්තරොපනිශ්‍රය"පොත්.

දෙදෙන; ඨිතික්ඛණෙ, (පශ්චාජ්ජාත අත්ථිවිගත විප්‍රයුක්ත ප්‍රත්‍යය ප්‍රතිලාභයෙන් ස්ථිතික්ෂණයෙහිම බලවත්වනහෙයින් බාහ්‍ය ඍතු ආහාර ප්‍රත්‍යය ලදින් තම තමන්ගේ) ස්ථිතික්ෂණයෙහිම; (පච්චයා හොන්ති, ශුද්ධාෂ්ටකාදි ඍතුජ ආහාරජරූපයන්ට ප්‍රත්‍යය වෙත්).

“පඤ්චවීසවිධං කම්මං කාමරූපාවචරජිතං,
ජනෙති කම්මජං රූපං කාමරූපභවද්වයෙ.

කාමරූපාවචරජිතං, කාමාවචරරූපාවචර භවද්වයෙහි නියතවූ; පඤ්චවීසවිධං කම්මං, පස්විසිවැදෑරුම්වූ කර්මය; කාමරූපභවද්වයෙ, කාමභවරූපභවද්වයෙහි; කම්මජං රූපං ජනෙති, කර්මජරූපය උපදවන්නේයි.

පඤ්චවිඤ්ඤාණමාරුප්පා විපාකා සබ්බසන්ධියො,
චුති ඛීණාසවස්සෙති සොළසෙතෙ විවජ්ජිය,

සත්තසත්තති සෙසානි චිත්තානි පන සබ්බථා.
ජනෙන්ති චිත්තජං රූපං පඤ්චවොකාරභූමියං.

පඤ්චවිඤ්ඤාණං, දෙපස් විඥානයද; ආරුප්පා විපාකා, අරූපාවචරවිපාකයෝ සතරදෙනාද; සබ්බසන්ධියො, සියලු ප්‍රතිසන්ධිචිත්තයෝද; ඛීණාසවස්ස චුතීති, ක්ෂීණාශ්‍රවයාගේ ච්‍යුතිචිත්තයද යන; එතෙ සොළස, මේවූ සොළොස්දෙනා; විවජ්ජිය, හැර— සෙසානි සත්තසත්තති චිත්තානි, සෙසු සත් සැත්තෑ චිත්තයෝ; සබ්බථා, සර්වප්‍රකාරයෙන්; පඤ්චවොකාරභූමියං, පඤ්චවොකාරභවයෙහි; චිත්තජං රූපං, චිත්තජරූපය; ජනෙන්ති, උපදවත්.

ජනෙති උතුජං රූපං තෙජොධාතු භවද්වයෙ,
කාමභූමිය මොජා තු ජනෙත්‍යාහාරජං තථා.

තෙජොධාතු, තෙජොධාතුතොමෝ; භවද්වයෙ, කාමරූපභව දෙක්හි; උතුජං රූපං, ඍතුජරූපය; ජනෙති, උපදවයි; ඔජා තු, ඔජාවනාහී; කාමභූමියං, කාමභවයෙහි; ආහාරජං, ආහාරජරූපය; තථා, එසේම; ජනෙති, උපදවයි.

ඉන්ද්‍රියබද්ධසන්තානෙ කම්මාදි තිවිධම්පිච,
ජනෙති රූපං මතකෙ බහි චෙතු යථාරහං.

14 කම්මෙන විසති හොන්ති චිත්තෙන දසසත්ත ච,
පණ්ණරස උතුනා ච ආහාරෙන චතුද්දස;
ජරතා නිච්චතා චෙව න කෙහිචි භවන්ති හි.

15 යානි කම්මෙන චිත්තෙහ අරූපෙ තානි හොන්තිහි,
ආහාරජා උතුජානි රූපෙ හි තු භවන්ති හි,
න සමෙහානි රූපා'රූපෙ ජරතා'නිච්චතාපි ච.

16 ඔළාරිකානි චක්ඛුංච ඔජා තීණින්ද්‍රියානි ච,
ආපොධාතුච එතානි රූපරූපනානි වුච්චරෙ.

කම්මාදිතිවිධම්පිච, කර්මචිත්තආහාරවශයෙන් ත්‍රිවිධවූ ප්‍රත්‍ය සම; ඉන්ද්‍රියබද්ධ සන්තානෙ, ඉන්ද්‍රියයුක්තසන්තානයෙහි; රූපං, කර්මජාදි රූපය; ජනෙති, උපදවයි; උතු, සෘතුවතෙම; මතකෙ, මෘතශරීරයෙහිද; බහිච, වෘක්ෂලතාදි බාහ්‍යවස්තුයෙහිද(වශබද්‍යෙන්ගත්) ඉන්ද්‍රියසහිතසන්තානයෙහිද; රූපං ජනෙති, රූපඋපදවයි.

කම්මං ජනෙති රූපානි අත්තජානි ඛණෙ ඛණෙ,
චිත්තමුප්පාදකාලම්හි උප්පාදට්ඨනන්තරං පරං”.

කම්මං, කර්මයතෙම; අත්තජානි රූපානි, තමාවිසින් ඉපැදවියයුතු කර්මජරූපයන්; ඛණෙ ඛණෙ, ක්ෂණ ක්ෂණයෙහි; ජනෙති, උපදවයි; චිත්තං, චිත්තයතෙම, (තමාවිසින් ඉපැදවියයුතු චිත්තජ රූපයන්) උප්පාදකාලම්හි, (තමාගේ) උත්පාද ක්ෂණයෙහිම (උපදවයි); පරං, අන්‍යවූ සෘතු ආහාරවය; (තමාවිසින් ඉපැදවියයුතු සෘතු ආහාරජරූපයන්;) උප්පාදට්ඨනන්තරං, තමාගේ උත්පාදයට ඉක්බිති වූ ස්ථිතික්ෂණයෙහිම උපදවයි.

14 න කෙහිචි භවන්තිහී, (කර්මාදි චතුර්විධප්‍රත්‍යයන් කෙරෙන්) කිසි ප්‍රත්‍යයෙකින්දු ඉදුරා සම්භව නොවේත්—

“ශාස්ත්‍ර කුතශ්චිජ්ජාතස්‍ය ජාතෙඃ පයස්‍යාය භාෂිතම්,
'සංස්කෘතා නාත්‍ර ලක්ෂ්මිත්‍යා තසංස්කෘතස්‍ය ත්‍රිශූ දිතම්”.

16 රූපරූපනානී, (රූපවිකාරලක්ෂණ පරිච්ඡේද මාත්‍රණයාච රූපපත්තස්වභාවඇතිහෙයින්) රූපරූපයයි.

17 විඤ්ඤත්තියො දුවෙ චෙව ලහුතා කම්මඤ්ඤතාපිච,
මුදුතා උපච යාචෙව සන්තතීච තථා පුන;
විකාරරූපානි එතානි සත්ත ච තු හදන්ති හි.

18 ජරතා'නිච්චතා චෙව ලක්ඛණරූපනාහි වුච්චාර,
පරිච්ඡෙදරූපමාකාසං එකං යෙවතු දීපිතං.

19 චතුධා හොන්ති කාමාතං රූපිනස්ස තිධාපන,
අසඤ්ඤීනං තථා වීස් බහිඩා උතුනෙව තු.

20 සමතිංසති රූපානි ජායන්ති පටිසන්ධියා,
ඨිතික්ඛණෙ ච භෙදෙච තිංසන්තිංසෙව හොන්ති හි,
කායදසකං භාවදසකං චක්ඛුදසකමෙව ච
එවං නවුතිරූපානි කම්මජානෙව සන්ධියා.

21 යථා පටිච්ච බීජානි ජායතෙ අඞ්කුරො පරො,
තථා පටිච්ච සුක්කාදිං කලලා ජායරෙ ඉමෙ.

22 සන්ධිචිත්තස්ස දුතියං භඞ්ගනන්ති පවුච්චති,
තෙනචිත්තරූපා ජායන්ති උතුඛජා හි සොළස.

23 කම්මජානි චුතිචෙව එවං ජායති ආචියො,
සවුත්තානානි නිස්සාය මාතුචච මලනිස්සිතං,

24 එකතීතං අතික්කම්ම අට්ඨ රූපානි ජායරෙ,
චක්ඛුදසකං කායදසකං භාවදසකමෙවච

නාමරූපසම්බාසො සම්භාතනා.

---

17 විකාරරූපානි. (චිත්තජවායු පෘථිවිධාතූන්ද ලහුමෘදු කර්මණ්‍ය රූපයන්ගේද ජායමානරූපයන්ගේද විකාරයක්වනහෙයින්) විකාර රූපයහයි.

18 ලක්ඛණරූපනායි, (පරිපච්‍යමාන භිද්‍යමානවූ සංස්කෘත ධර්මයන්ගේ සංස්කෘතභාවලක්‍ෂණය පහළකිරීම කරණහෙයින්) ලක්‍ෂණ රූපයයි,

සිලිපිමංපත නිමි.

# දැන්වීමයි.

—— ο ——

## නාමරූපසමාසය

ආභිධර්මිකයන්ට හස්තසාරයක් බඳුවූ මේ ප්‍රශස්ත ග්‍රන්ථය මේ කාලයෙහි නාමමාත්‍රශෙෂවූවාසේ අතිශය දුර්ලභභාවයට පැමිණිබැව් දැන අපි මහත් පරිශ්‍රමයෙන් පිටපතක් සපයාගෙන **සිළිපිටපත** නම්වූ තදව්‍යාඛ්‍යානයත් සහිතව කාලාන්තරාතීර්ණවූ දෙෂජාතයන්ද පහකරවා ලොකාර්ථමෙ පරමාර්ථකොට මහත් වියදමක් දරා මෙසේ ඝනකොළවල පිරිසිදු අකුරෙන් මුද්‍රණයකරවා ප්‍රකාශකෙළෙමු. මේ සඳහා දිව්තුරේවත්තේ ඇම්. සාමුවෙල් ද සිල්වා ප්‍රධාන කොන්දොස්තර් මහත්මයාගෙන්ද අපට විශෙෂ ආධාරලැබුනුබව සතුත්සහිතව මෙහි සඳහන්කරමු, ආභිධර්මික ශිෂ්‍යයන් විසින් මෙසිත් එක එක පොතරැගෙන පරිශීලනයකොට ටික කලකින්ම ස්වාර්ථය මුදුන්පමුණුවා, ගණු ලැබේනම් අපේ ප්‍රයත්නයද එසින්ම සාර්ථකබවට පැමිණේ, පොතක් පෝර්ම්දහයකින් යුක්තවේ, පොත් ලබාගන්නා කැමැත්තන්ගේ පහසුව සලකා මෙහි මිලගණනද මඳකොට තබනලදී. පොත් ඉල්වා ලියුම්එවන භවතුන් විසින් ඇල්පිටියේ තැපලට ඇත්කඳුරේ ඇම්. ඩබ්ලයු සුමතිපාලයන්ට පිටලියා එවියයුතුයි.

පොතක් ශත 50

සියගණන් ගන්නා අයට පහසු ගණනකට දෙනුලැබේ

මේවගට,

*M. W. Sumathipala.*

1908 ජනවාරි මස
1 වෙනි දින ඇත්කඳුරේදීය.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු